ජාතික
ගොඩනැගිලි
පර්යේෂණ
සංවිධානය

தேசிய
கட்டிட
ஆராய்ச்சி
நிறுவனம்

NATIONAL BUILDING RESEARCH ORGANISATION

2022

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT

ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
Ministry of Defence

2022 වාර්ෂික වාර්තාව ජා. ගො. ප. සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුව (IMC) විසින් 2023 පෙබරවාරි මස 21 දින පැවති රැස්වීමේ දී අනුමත කරන ලදී.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவனம்
NATIONAL BUILDING RESEARCH ORGANISATION
99/1, ජාවත්ත පාර, කොළඹ 5. 99/1, ஜாவத்தை வீதி, கொழும்பு 5. 99/1, Jawatta Road, Colombo 5.
Tele : 011-2588946 Fax : 011-2502611 e-mail : info@nbro.gov.lk Website : www.nbro.gov.lk

පටුන

1. සභාපතිගේ සමාලෝචනය 4

2. විධායක වාර්තාව 7

3. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හැඳින්වීම 12

4. දැක්ම, මෙහෙවර සහ ඉලක්කයන් 13

5. ජා. ගො. ප. සංවිධානයේ කළමනාකරණය 14

6. මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය 16

රාජ්‍ය ආයෝජන වැඩසටහන යටතේ ව්‍යාපෘති 16
1. නායයෑම් අවදානම් තක්සේරු වාර්තා කිරීමේ ක්‍රියාවලිය (LRAR) 16
2. නායයෑම් විමර්ශන, පර්යේෂණ සහ සංවර්ධන 17
2.1 නායයෑම් ආපදා කලාප සිතියම්ගත කිරීමේ වැඩසටහන (LHMP) 17
2.2 නායයෑම් විශේෂ විමර්ශන (SPI) 17
3. නායයෑම් අවම කිරීමේ වැඩසටහන (GOSL අරමුදල්) 17
4. නායයෑමේ අවදානම සහිත ප්‍රදේශ සඳහා අවදානම් පැතිකඩ සැකසීම 18
5. නායයෑම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම (පද්ධතිය නඩත්තු කිරීම) 19
6. ශ්‍රී ලංකාව තුළ රසායනික ආපදා අවදානම විධිමත් තක්සේරුකරණය 19
7. ගොඩනැගිලි තක්සේරු කිරීම සහ තත්ත්ව වාර්තාකරණය සඳහා ක්‍රමෝපාය සංවර්ධනය කිරීම 20

7. පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් 21

8. සිම්පෝසියා 22

ජා. ගො. ප. සංවිධානයේ 12 වැනි වාර්ෂික පර්යේෂණ සමුළුව - 2022 22

9. ප්‍රධාන උපදේශන ව්‍යාපෘති 25

පරීක්ෂණ සහ උපදේශන සේවා මඟින් වූ ආදායම 27
වෙනත් තාක්ෂණික මැදිහත්වීම් 28
විදේශීය / දායක සහයෝගීතාවයෙන් යුත් ව්‍යාපෘති 30
තාක්ෂණික සහයෝගිතා වැඩසටහන NBRO-JICA 30
ස්ථායීකරණ ක්‍රමවේදයන් මඟින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP) 32
MOBILISE 3.0: ප්‍රත්‍යාස්ථිතික ප්‍රජාවන් ගොඩනැගීම සඳහා ඩිජිටල් මෙවලම් කට්ටලය 33
ලෝක ආහාර වැඩසටහනේ සහාය ලැබූ ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතිය– 2021/2022 34

10. ජා. ගො. ප. සංවිධානයේ ප්‍රකාශන 35

11. පුහුණු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු 38

12. විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 40

13. මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 41

14. විගණකාධිපති වාර්තාව 46

15. පසුගිය වසර 10ක මූල්‍ය තත්ත්වය 55

පසුගිය වසර 10 ක මූල්‍ය තත්ත්වය 55

16. ආයතනික පාලන වාර්තාව 56

මානව සම්පත් / ධාරිතා සංවර්ධනය 56

17. මූල්‍ය ප්‍රකාශවලට ඇමුණුම් 59

1. සභාපතිගේ සමාලෝචනය



ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) 2022 වර්ෂය සඳහා වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය සමඟින් මෙම වාර්ෂික වාර්තාව එම සංවිධානයේ අන්තර්වාර කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා සහ රේඛීය අමාත්‍යාංශය ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස ඉදිරිපත් කිරීමට ලැබීම මගේ භාග්‍යයකි.

ජාතික සංවර්ධන ක්‍රියාවලියේ සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන ප්‍රමුඛතම පර්යේෂණ, සංවර්ධන සහ බහුවිධ තාක්ෂණික ආයතනයක තාක්ෂණික හැකියාවන් සහ එහි මූල්‍ය තිරසාරභාවය පිළිබඳ සම්පූර්ණ හරස්කඩක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මෙම වාර්ෂික වාර්තාව මගින් ඉදිරිපත් කරයි.

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති රේඛීය නියෝජිතායතනයක් ලෙස, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් රට තුළ නායයෑම් අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන අතරම, අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලමින් සෙන්ඩායි ක්‍රියාකාරී රාමුවේ මාර්ගෝපදේශයන් ද ක්‍රියාත්මක කරයි.

2022 වර්ෂය තුළ, නායයෑම් අවදානම් කළමනාකරණය සඳහා ජාතික කේන්ද්‍රස්ථානය ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය නායයෑම් අවදානම් හඳුනා ගැනීම, කලාපකරණය, සිතියම්ගත කිරීම, අවදානම් තක්සේරුව හා අවම කිරීම, දැනුවත් කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම යන විවිධ විෂය ක්ෂේත්‍රයන් හි කාර්යයන් ඉටු කරන ඇත. නායයෑම් අවදානම් ප්‍රදේශවල සංවර්ධන කටයුතු සඳහා සුදුසු තාක්ෂණික නිර්දේශ සහිත නායයෑම් අවදානම් තක්සේරු වාර්තා පළාත් පාලන ආයතන විසින් නිකුත් කරනු ලබන ගොඩනැගිලි බලපත්‍ර සඳහා පූර්ව අවශ්‍යතාවයක් බවට පත්ව ඇති අතර එය අවිධිමත් මානව මැදිහත්වීම් හේතුවෙන් සිදුවන නායයෑමේ අවදානම් හානි අවම කිරීමේ තීරණාත්මක පියවරක් ලෙස සැලකේ.

භූ තාක්ෂණික විමර්ශන, අත්තිවාරම් ඉංජිනේරු සහ සැලසුම් සේවා සැපයීම මගින් ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහන් සඳහා සහාය වී ඇත. ගොඩනැගිලි සඳහා තත්ත්ව වාර්තා නිකුත් කිරීම, විශේෂයෙන් හානි වූ හෝ ප්‍රතිනිර්මාණය කිරීම සහ වැඩිදියුණු කළ ව්‍යුහාත්මක අඛණ්ඩතාව අවශ්‍ය ගොඩනැගිලි සඳහා සුවිශේෂී සේවාවක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ලබා දෙයි. මීට අමතරව, ගොඩනැගිලි ද්‍රව්‍යවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සහ වාතයේ ගුණාත්මකභාවය, ජලයේ ගුණාත්මකභාවය සහ ශබ්ද මට්ටම්වල පාරිසරික තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල බව අධීක්ෂණය කිරීම වැනි සේවාවන් වැඩි වශයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් අපේක්ෂා කරයි.

ආසියානු යටිතලපහසුකම් ආයෝජන බැංකුවේ මූල්‍ය පහසුකම් යටතේ ස්ථායීකරණ ක්‍රමවේද මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP) සුවිශේෂී ව්‍යාපෘතියක් වන අතර එමගින් මාර්ග භාවිත කරන මගීන්හට, පාසල් සහ රෝහල් ඇතුළු ගොඩනැගිලිවලට, අධිවේගී මාර්ග සහ උඩරට දුම්රිය මාර්ගය ඇතුළු යටිතල පහසුකම් මත නායයෑම් සහ අස්ථායී බෑවුම්වලින් වන අවදානම අවමකර අත්‍යවශ්‍ය ආරක්ෂාව ලබා දෙයි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පෙළේ දේශීය හා විදේශීය ආයතන සමඟ විශේෂයෙන් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය, එක්සත් රාජධානියේ සැල්ෆෝර්ඩ් විශ්ව විද්‍යාලය, ලෝක බැංකුව සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදි. මෙම ප්‍රයත්නය නිසා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති, ඒකාබද්ධ පර්යේෂණ සහ සංවර්ධන අධ්‍යයනයන් සහ තාක්ෂණික ධාරිතා ගොඩනැගීමට මග පාදමින් ඵලදායි

ජාත්‍යන්තර තාක්ෂණික සහයෝගීතාවයන් ඇති කර ගැනීමට සමත් වී තිබේ.

කර්මාන්ත සමඟ උපදේශනය මගින් ඔවුන්ගේ පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීමෙන් පසු ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් වාර්ෂික ව පුළුල් පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනක් සැලසුම් කරනු ලබයි. ඔවුන්ගේ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා සෑම වසරක ම පර්යේෂණ සම්මන්ත්‍රණයක් පවත්වනු ලැබේ. 2022 පැවති සම්මන්ත්‍රණයේ දී වැඩි දියුණු කළ කම්පන අවශෝෂණය සහ ජලපාරගම්‍ය ලක්ෂණ සහිත තන්තු මගින් ශක්තිමත් කරන ලද බිම් ඇතිරුම්ගල් සංවර්ධනය සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීම වැනි බිම් මට්ටමේ ජයග්‍රහණ ලබා ගැනීම ද කැපී පෙනේ.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පසුගිය වසරවල දී මුහුණ දුන් දුෂ්කර තත්ත්වයන් තිබියදීත්, 2022 වසර ඉතා ධනාත්මක වසරක් වූ බව පෙන්වා දීමට කැමැත්තෙමි. ජාතික ප්‍රමුඛතාවයක් ලෙස නායයෑම් ආපදා අවදානම අවම කිරීම සඳහා වාර්ෂික ව ලබාදෙන රාජ්‍ය අරමුදල් ලබාගැනීමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට හැකිවිය. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි පර්යේෂණ සහ ව්‍යාපෘති කටයුතු සඳහා විදේශීය පරිත්‍යාගශීලී ආයතන සහ සහයෝගීතා ආයතන ද යම් අරමුදල් ප්‍රදානය කර තිබේ.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ආදායම් උපයා යැපෙන අතර පුනරාවර්තන වියදම් ඇතුළු ව එහි මූල්‍ය අවශ්‍යතා බොහොමයක් ජනනය කරගනු ලැබුවේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයට ලබා දෙන උපදේශන සහ පරීක්ෂණ සේවා මගිනි. 2010 වසරේ සිට අඛණ්ඩ ව සැලකිය යුතු ශුද්ධ වාර්ෂික ලාභයක් වාර්තා කර ඇත. වසර ගණනාවක් පුරා, ආයතනයේ මූල්‍ය ස්ථායීතාවය ස්ථීර ලෙස තහවුරු වී ඇති අතර එම කාලය තුළ ආදායම, ලාභ සහ සංචිත ක්‍රමයෙන් වර්ධනය වී ඇත.

තමන්ට ලැබුණු සෑම අවස්ථාවක ම උත්සාහයෙන් හා කැපවීමෙන් කටයුතු කළ අධ්‍යක්ෂ ජනරාල් ආසිරි කරුණාවර්ධන මහතා ඇතුළු පිරිසගේ කැපවීමෙන් තොර ව මෙවන් සාර්ථක කාර්ය සාධනයක් වාර්තා කළ නොහැකි වනු ඇත. අන්තර්වාර කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා ලෙස පමණක් නොව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් ද උපදෙස් හා මගපෙන්වීම් ලබා දීමට මට හැකි වූ අතර සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට වාර්ෂික ප්‍රසාද දීමනාවක් ගෙවමින් ඔවුන්ගේ සේවය අගය කිරීමට පවා මට හැකි විය.

අවසාන වශයෙන්, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ රට තුළ නායයෑම් අවදානම් කළමනාකරණය සඳහා කේන්ද්‍රීය ආයතනය ලෙස, ඉහළයන ආපදා ප්‍රවණතා සමඟ ඉදිරි වසර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට විශේෂයෙන් අභියෝගාත්මක වනු ඇත. නුවරඑළිය දිස්ත්‍රික්කයේ මාලපට්ටාව ප්‍රදේශයේ බෑවුම් අස්ථාවරත්වය සහ ගල් පෙරළීමේ අවදානම අවමකිරීම, කොළඹ මහනුවර මාර්ගයේ කඩුගන්නාව ප්‍රදේශයේ බෑවුම අස්ථාවරත්වය, ශ්‍රී පාදයට පිවිසෙන මාර්ගය අවහිර කරමින් නල්ලතන්නිය ප්‍රදේශයේ සිදු වූ නායයෑම අවමකිරීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පසුගිය කාලයේ සාර්ථක ව මුහුණ දුන් අභියෝගාත්මක කාර්යයන් වේ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ශ්‍රී ලංකාවේ නාගරික ආශ්‍රිත වාතයේ ගුණාත්මකභාවය අධීක්ෂණය සහ කළමනාකරණය සඳහා ප්‍රශංසනීය සේවාවක් ඉටුකරයි. මෑතදී වායු දූෂණ මට්ටම ඉහළ යාම සහ කොළඹ වරාය අසල MV X-press Pearl නෞකාවේ ගින්න වැනි සිදුවීම්වල දී බලධාරීන්ට කාලෝචිත තීරණ ගැනීමට සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදි.

ව්‍යසනවල දී සංකීර්ණ සහ අභියෝගාත්මක අවස්ථාවන්ට මුහුණ දීම සඳහා නව්‍ය උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා ආයතනික වැඩපිළිවෙලක් සැකසිය යුතු අතර වෙනස්වන ගතික පරිසරයක් තුළ වඩාත් කඩිනම් ක්‍රියාමාර්ග ගතහැකිවන පරිදි රේඛීය අමාත්‍යාංශය සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ පවත්නා සබඳතා ශක්තිමත් කර ගනිමින් පුළුල් කාර්යභාරයක් ඉටු කිරීමට කටයුතු කළ යුතුය.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මෙම සාර්ථකත්වය කරා ගෙන යාමට අතිගරු ජනාධිපතිතුමා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය සහ ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික කවුන්සිලයේ (NCDM) සාමාජිකයින්ගේ නායකත්වය සහ දුරදර්ශීභාවය හේතුවී ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපට ලබා දුන් සහාය වෙනුවෙන් අන්තර්වාර කළමනාකරණ කමිටුවේ (IMC) සාමාජිකයින්හට මගේ අවංක ස්තුතිය පුද කරමි. ඊට අමතරව, මගේ අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය යටතේ ඇති ආයතනවල අධ්‍යක්ෂ ජනරාල්වරුන්ට සහ අපගේ පාර්ශ්වකරුවන්ට අප කෙරෙහි අඛණ්ඩ ව තැබූ විශ්වාසය සඳහා මාගේ ස්තුතිය පුද කරමි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සිය ආයතනික සහ ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෙහෙස මහන්සි වී වැඩ කරන අතර අපගේ සියලු උත්සාහයන් වටිනා ජයග්‍රහණ බවට පත් කරනු ඇතැ යි මම විශ්වාස කරමි.



ජනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
WWV RWP RSP USP ndc psc MPhil
සභාපති, අන්තර්වාර කළමනාකරණ කමිටුව
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
(ලේකම් / ආරක්ෂක අමාත්‍යාංශය)

2. විධායක වාර්තාව



ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වරින් වර මුහුණ දෙන බාධක අභියෝග මධ්‍යයේ වුව ද, 2022 වර්ෂයේ තම යුතුකම් සහ වගකීම් උපරිමයෙන් ඉටු කරමින් ඉදිරියෙන්ම සිටී. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත පවරා ඇති කාර්යයන් නිසිපරිදි ඉටුකරමින් ආයතනික සහ මූල්‍යමය ස්ථාවරත්වය සහතික කරමින් ක්‍රියාත්මක විය. 2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මෙම වාර්ෂික වාර්තාව සහ එහි මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත්කිරීමට හැකිවීම වරප්‍රසාදයක් ලෙස සලකමි.

කීර්තිමත් රාජ්‍ය ව්‍යවසායයක් ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය 2022 වසරේ සියලු අංශයකින්ම එහි කාර්ය සාධනය අතින් විශිෂ්ට වූ බව ප්‍රකාශ කරන අතරම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය තම නියමිත ඉලක්ක සපුරා ගනිමින් නිරන්තරයෙන් වෙනස් වන සහ අභියෝගාත්මක සමාජ-ආර්ථික පරිසරයක් තුළ සිය ආයතනික අරමුණු සාක්ෂාත් කර ගනිමින් වගකීම් සහගත ලෙස කටයුතු කරනලද බව සඳහන් කරමි.

පරීක්ෂණ සහ උපදේශන සේවා සඳහා තරඟකාරී ආයතනවල දැඩි තරඟකාරීත්වය මධ්‍යයේ වුව ද ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය 2022 වර්ෂයේ දී රුපියල් මිලියන 894.05 ක ඒකාබද්ධ පිරිවැටුමක් වාර්තා කළේය. එමගින් රුපියල් මිලියන 105.55 ක ශුද්ධ ලාභයක් ලැබීය. සමාලෝචිත වර්ෂයේ ඒකාබද්ධ ආදායම 2021 වසරට වඩා 6.5% ක වර්ධනයක් සමග 2022 වර්ෂයේදී පරීක්ෂණ සහ තාක්ෂණික සේවාවලින් රුපියල් මිලියන 586.71 ක ආදායමක් පිළිබිඹු කරන අතර කැපී පෙනෙන 12% වර්ධනයක් පෙන්නුම් කරයි.

මෙම තත්ත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කාර්ය මණ්ඩලය දැඩිලෙස කැපවී ඇත. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය දිවයිනේ ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමේ අරමුණින් ආපදා කළමනාකරණය, නිවාස, ඉදිකිරීම් සහ පරිසරය වැනි අංශ ආවරණය වන පරිදි පුළුල් පරාසයක සේවා සපයන ප්‍රමුඛ පෙළේ සහ විශ්වාසනීය තාක්ෂණික සේවා සපයන්නෙකු බවට පත්ව සිටී.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ආපදා අවදානම් අවම කිරීමේ පියවරක් ලෙස මහපරිමාණ ව්‍යාපෘතියක් 2019 දී සැලසුම්කර 2020 දී ව්‍යාපෘතිය ආරම්භ කළේය. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) මූල්‍ය ආධාර යටතේ ස්ථායිකරණ ක්‍රමවේද මඟින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ක්‍රියාත්මක කිරීමට භාරගත් පළමු මහාපරිමාණ ව්‍යාපෘතියයි.

ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයේ රේඛීය ආයතන අතර තාක්ෂණික නියෝජිතායතනයක් වන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අමාත්‍යාංශයේ මෙහෙවර ඉටු කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සෙන්ඩායි ක්‍රියාකාරී රාමුවේ මාර්ගෝපදේශ අනුගමනය කරමින් තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට සමගාමී ව රට තුළ ආපදා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමේ තාක්ෂණික අවශ්‍යතාවන් කෙරෙහි ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සිය අවධානය යොමු කරයි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සියලු ප්‍රයත්නයන්, එහි උපායමාර්ගික සැලැස්ම මඟින් නිරූපණය කර ඇති පරිදි, පර්යේෂණ සහ සංවර්ධනය, අවදානම් අවම කිරීම, පූර්ව අනතුරු ඇඟවීම්, දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සහ අනෙකුත් තාක්ෂණික මැදිහත්වීම් හරහා රට තුළ ආපදා ඔරොත්තු

දීමේ හැකියාව ගොඩනැගීම කෙරෙහි දැඩි ලෙස අවධානය යොමු කරයි.

2022 වසරේ මැයි - ජූනි සහ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ප්‍රධාන වශයෙන් මහනුවර, කෑගල්ල, නුවරඑළිය මාතලේ සහ රත්නපුර දිස්ත්‍රික්කවල බෑවුම් කඩා වැටීම්, කැපීම් කඩාවැටීම්, ගල් පෙරළීම් සහ රැඳවුම් බිත්ති කඩාවැටීමේ සිද්ධීන් කිහිපයක් වාර්තා වූ අතර කළුතර, කුරුණෑගල, බදුල්ල, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල සුළු සිදුවීම් වාර්තා විය. ඒ අනුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නායයෑම් අධීක්ෂණය, මහජනතාව ඉවත් කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, කාලීන විමර්ශනය සහ නිවැරදි කිරීමේ සහ වැළැක්වීමේ පියවර ක්‍රියාත්මක කිරීම වැනි භූමිකාවන් ඉටුකරන ලදී.

මහා භාණ්ඩාගාරයෙන් සහ අනෙකුත් මූල්‍ය ආයතනවලින් ලැබෙන අරමුදල් මඟින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ක්‍රියාත්මක කරන ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති අඛණ්ඩ ව ක්‍රියාත්මක කරන ලදි.

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) මූල්‍ය පහසුකම් යටතේ ක්‍රියාත්මක ස්ථායිකරණ ක්‍රමවේද මඟින් නායයාමේ අවදානම අවම කිරීමේ (RLVMMP) ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ අවම කිරීමේ කටයුතු ආරම්භ කළ තීරණාත්මක ස්ථාන 24 න් ස්ථාන 12 ක අවමකරණ කටයුතු දැනටමත් සම්පූර්ණ කර ඇත. පාසල්, රෝහල් සහ රජයේ ගොඩනැගිලි, ප්‍රධාන මාර්ග සහ දුම්රිය මාර්ගවල ක්‍රියාකාරීත්වයට තර්ජනයක් වන ලෙස හඳුනාගෙන ඇති තෝරාගත් ස්ථාන 127 ක සියලුම අවම කිරීමේ කටයුතු 2025 වන විට අවසන් කිරීමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අපේක්ෂා කරයි.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ මලපට්ටාව ප්‍රදේශයේ බෑවුම් අස්ථාවරත්වය සහ ගල් පෙරලීමේ අවදානම අවම කිරීම සහ කොළඹ මහනුවර මහාමාර්ගයේ කඩුගන්නාව ප්‍රදේශයේ අස්ථායී බෑවුම් බිඳවැටීම නිවැරදි කිරීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මෑතක දී සාර්ථක ව මුහුණ දුන් අභියෝගාත්මක කාර්යයකි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් රජයේ සංවර්ධන වැඩසටහන් සඳහා තාක්ෂණික සේවාවන් අඛණ්ඩ ව ලබාදෙන ලදී. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් මධ්‍යම අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා භූ තාක්ෂණික විමර්ශන, සැලසුම් සහ තාක්ෂණික සහාය ලබා දුන් අතර උඩරට දුම්රිය මාර්ගයේ වටවල නායයෑම ප්‍රතිසංස්කරණය කිරීම සහ නල්ලතන්නියේ (හැටන්-මස්කෙළිය ඩෙල්හවුස් මාර්ගය) බෑවුම් කඩා වැටීම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඉහළ පිළිගැනීමක් ලැබුණි.

තාක්ෂණික උපදේශන සහ පරීක්ෂණ කටයුතු නිමැවුම්වල ගුණාත්මකභාවය සහ නියමිත වේලාවට ලබා දීම සහතික කිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ක්‍රියාත්මක විය. එමඟින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට සෑම විටම තරඟකාරී කොන්ත්‍රාත්තු ලබා ගැනීමේදී ප්‍රමුඛස්ථානයක් ලබා ගත හැකි විය. තවද, උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීමේ පියවරක් ලෙස, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් එහි රසායනාගාර තුනම සඳහා ISO 17025 ප්‍රතීතනය ලබා ඇති අතර, සියලුම අභ්‍යන්තර හා බාහිර විගණන කටයුතු කාලීනව කරගෙන යාම සඳහා කාර්ය මණ්ඩලය සඳහා වැඩිදුර පුහුණු වැඩසටහන් ද පැවැත්වීමෙන් ඒ සඳහා සහාය විය.

පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන සඳහා පර්යේෂණ සැලසුම් කර ගැනීම, කර්මාන්තවල පර්යේෂණ අවශ්‍යතා හඳුනාගැනීම වෙනුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් වසර ආරම්භයේ දී එහි පාර්ශවකරුවන් සමඟ වාර්ෂික කර්මාන්ත උපදේශන රැස්වීම පවත්වයි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සිදුකරන ලද පර්යේෂණවල ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට සහ දේශීය හා ජාත්‍යන්තර පාර්ශවකරුවන් සමඟ සහයෝගීව කටයුතු කිරීමට සිය වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය පවත්වන අතර සම්මන්ත්‍රණ පර්යේෂණ වාර්තාව ද ප්‍රකාශයට පත් කරයි. මෙම සම්මන්ත්‍රණ සඳහා සහභාගීත්වය ඉහළ වන අතර පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහ සහාය ද ඉහළ මට්ටමක පවතී. පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන යටතේ රෙදිපිළි අපද්‍රව්‍ය යොදා ගනිමින් සංවර්ධනය කරන ලද තන්තු ශක්තිමත් කරන ලද පේවිං

බ්ලොක් සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ඇති අතර එය 2022 වර්ෂය තුළ සිදු කරනු ලැබූ පර්යේෂණවල කැපී පෙනෙන ජයග්‍රහණයක් විය.

ජාතික සංවර්ධනය සඳහා දායකත්වය

නායයෑම් අවදානම් කළමනාකරණය සඳහා ජාතික කේන්ද්‍රස්ථානය ලෙස, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය නායයෑම් හඳුනාගැනීම, කලාප සිතියම්ගත කිරීම, උපද්‍රව අවදානම් තක්සේරු කිරීම, පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, පුහුණුව සහ දැනුවත් කිරීම මෙන් ම ප්‍රතිපත්ති සංවර්ධනය ඇතුළු වැදගත් කාර්යයන් සිදු කරයි. උපද්‍රව සහ අවදානම් සිතියම් ජාතික භෞතික සැලසුම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනේ.

නායයෑම් උවදුරු කලාප සිතියම්ගත කිරීම සහ අවදානම් තක්සේරු කිරීමේ පවතින ක්‍රමවේදය සමාලෝචනය කිරීම, රතු කලාප සහ කහ කලාප සංකල්පය භාවිත කරමින් නියමු ස්ථාන තුනක් සඳහා සම්පූර්ණ බලපෑම් කලාප සිතියම් සකස් කිරීම; නියමු ස්ථාන තුනක් සඳහා Hyper KANAKO ආකෘතිය භාවිතයෙන් නායයෑම් මාර්ග ආකෘතිකරණය කිරීම, නියමු ස්ථානවලට අමතරව අනෙකුත් ප්‍රදේශවල සම්පූර්ණ බලපෑම් කලාප සිතියම් සකස් කිරීම, දැනට පවතින නායයෑම් පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සහ පවත්නා නිරීක්ෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම හා අනතුරු ඇඟවීම් සහ ආපදා මාර්ගෝපදේශ සකස් කිරීම, JICA තාක්ෂණික සහයෝගීතාවය හරහා ක්‍රියාත්මක කරන ලද SABO ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද වැදගත් කාර්යයන් වන අතර ආපදා ප්‍රත්‍යාස්ථිතික ඉඩම් පරිහරණ නියාමනය සහ සංවර්ධන ප්‍රමිතීන් ද ඊට ඇතුළත් වේ.

දිස්ත්‍රික්ක 14 ක නායයෑමේ අවදානම් සහිත ප්‍රදේශවල ඉදිකිරීම් හෝ සංවර්ධන කටයුතු වෙනුවෙන් අනුමැතිය ලබාදීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් තාක්ෂණික නිර්දේශ සහිත නායයෑම් අවදානම් තක්සේරු වාර්තා (LRAR) පළාත් පාලන ආයතන වෙත නිකුත් කරයි. 2011 මාර්තු මස නිකුත් කළ විශේෂ චක්‍රලේඛයකයට අනුව අවශ්‍ය පරීක්ෂණ පවත්වා වාර්තා ලක්ෂයකට අධික ප්‍රමාණයක් ආරම්භ කළ දා සිට නිකුත් කර ඇත.
නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඉටු කරන ඉතා වැදගත් වගකීමකි. ප්‍රධාන කාර්යාලයේ නායයෑම් පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය (EWC) කාලෝචිත පූර්ව අනතුරු ඇඟවීම් සහ ඉවත් කිරීමේ නියෝග නිකුත් කිරීම සඳහා ක්‍රියාත්මකවන අතර මෙම මධ්‍යස්ථානය ආන්තික කාලගුණික තත්ත්වයන් තුළ 24 පැය පුරාම ක්‍රියාත්මක වෙයි. නායයෑමේ අවදානමට ලක්විය හැකි ප්‍රදේශවල ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය වැසි මාපක 300කට අධික ජාලයක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සතුව ඇති අතර එමඟින් වර්ෂාපතන දත්ත නායයෑම් පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය වෙත සම්ප්‍රේෂණය කෙරේ. මීට අමතරව, භූ චලන හඳුනාගැනීමේ උපකරණ සහ තෙතමනය සංවේදන උපකරණ මගින් නායයෑම් නිරීක්ෂණ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ධාරිතාව වැඩි දියුණු කරන ලදී.

නාගරික පරිසරයේ වාතයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම වැදගත් තාක්ෂණික මැදිහත්වීම්වලින් එකකි. කොළඹ මහ නගර සභා (CMC) පරිශ්‍රයේ ක්‍රියාත්මක වන අධි තාක්ෂණික ස්වයංක්‍රීය ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය භාවිතයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් වාතයේ ගුණාත්මක භාවය නිරීක්ෂණය කරනු ලැබේ. අනෙකුත් අධීක්ෂණ ශිල්පීය ක්‍රමවල දත්ත වලංගුභාවය නීර්ණය කිරීම සඳහා මෙම ඒකකය භාවිත කෙරේ. මීට අමතරව, ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් මධ්‍යස්ථාන 20 ක ස්ථාපිත සංවේදක පාදකවූ අධීක්ෂණ මධ්‍යස්ථාන 20 කින් තත්‍ය කාලීන වාතයේ තත්ත්ව මැනීමේ දත්ත ලැබේ. මෙම අධීක්ෂණ ජාලය භාවිත කරමින් තත්ත්ව පාලන දත්ත සමුදාය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම සහ කෙටි කාලයක් තුළ තීරණාත්මක තීරණ ගැනීමේ හැකියාව ඇති අතර කොළඹ වරාය ආසන්නයේ නෞකාවක ඇති වූ ගින්නක් හේතුවෙන් නාගරික වායු දූෂණය සහ මෑතදී සිදු වූ වායු දූෂණය වැනි කාලෝචිත තීරණ ගැනීමට බලධාරීන්ට හැකිවිය.

SATREPS යනු JICA/JST සහාය ඇතිව ශ්‍රී ලංකාවේ වර්ෂාවෙන් ඇතිවන වේගවත් සහ

දිගු නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ තක්ෂණය සංවර්ධනය කිරීම සඳහා වූ ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිය ජපානයේ ජාත්‍යන්තර නායයෑම් සම්මේලනය (ICL) සමඟ එක්ව සිදු කරන ලද වැදගත් පර්යේෂණ කාර්යයකි. මෙම ව්‍යාපෘති කටයුතු සඳහා දේශීය සහ ජපන් සහයෝගිතා විශ්වවිද්‍යාල සහ උපකාරක ආයතන කිහිපයක් සහභාගී වන අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. එම තාක්ෂණයන් මගින් මහජනතාවගේ ආරක්ෂාව සහතික කරන අතර අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් නායයෑම් සහ ඒ ආශ්‍රිත උපද්‍රවයන්ගෙන් සුරක්ෂිත කරනු ඇත. මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාර්යාලයක් කියෝතෝ නගරයේ ස්ථාපිත කර ඇති අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විද්‍යාඥයින් කිහිප දෙනෙකු ධාරිතාව සංවර්ධනය යටතේ ජපානයේ Ph.D. අධ්‍යයන කටයුතුවල නිරත වේ. මෙම පර්යේෂණයට පහසුකම් සැලසීම සඳහාත් භූ තාක්ෂණික ඉංජිනේරු විද්‍යාගාරය ශක්තිමත් කිරීම සඳහාත් Ring shear apparatus වැනි නවීන උපකරණ සවි කර ඇත.

ආදායම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සිය පුනරාවර්තන වියදම් සඳහා ප්‍රධාන වශයෙන් ආදායම් උපදවන්නේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයට ලබා දෙන උපදේශන සහ පරීක්ෂණ සේවා සැපයීම මගිනි. එමෙන්ම, කාර්යමණ්ඩල වැටුප් සහ වෙනත් ආයතනික වියදම් ආවරණය කරගැනීම සඳහා උපයාගත් ආදායම මත දැඩි ලෙස රඳා පවතී.



පසුගිය වසර 7 සඳහා මුළු මෙහෙයුම් ආදායමෙහි ශුද්ධ ලාභය



රජය ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා ප්‍රදානය - 2022 වසර

බාදක

- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අදාළ බලධාරීන් විසින් තවමත් අනුමත කර නොමැත.
- වෙනත් රාජ්‍ය ව්‍යාවස්ථාපිත ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතන හා සසඳන විට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් ලබාදෙන ප්‍රතිලාභ සහ වැටුප් අවම බැවින් එහි කාර්ය මණ්ඩල ආයතනය හැරයාමේ ප්‍රවණතාව ඉහළ මට්ටමක පවතී. කාර්යමණ්ඩල බඳවා ගැනීම දුෂ්කර වන අතර බඳවාගන්නන් සඳහා බොහෝ විට ප්‍රමාණවත් පළපුරුද්දක් නොමැත.
- පරීක්ෂණ සහ තාක්ෂණික උපදේශන සේවා සැපයීම මගින් පුනරාවර්තන වියදම් උපයයි. සමහර රෙගුලාසි සීමා මගින් උපදේශන වැනි කාර්යයන් සඳහා, ලංසු තැබීමේ දී සහ ඉතා තරඟකාරී ලෙස කටයුතුකිරීමේ දුෂ්කරතාවන් පවතී.

ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා වූ මුල පිරීම්

- ✓ විද්‍යාගාර 3 ම ප්‍රතීතනය කර පවත්වාගෙන යාම
- ✓ ජාත්‍යන්තර ආයතන සමඟ තාක්ෂණික සහයෝගිතා වැඩසටහන් හරහා ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම
- ✓ උස් සහ විශාල ගොඩනැගිලි සංකීර්ණවල භූ තාක්ෂණික අවදානම් තක්සේරු කිරීම් සඳහා ධාරිතාව වැඩි දියුණු කිරීම
- ✓ විදේශීය පුහුණුව සහ ජාත්‍යන්තර නිරාවරණය සඳහා අවස්ථා ලබා දීම සඳහා ජාත්‍යන්තර නියෝජිතායතන

සමඟ ඒකාබද්ධ පර්යේෂණ ආරම්භ කිරීම සහ මෙය කාර්ය මණ්ඩල අභිප්‍රේරණයට හේතු විය.

✓ නායයෑම් සහ අස්ථායී බෑවුම් අවම කිරීම සඳහා ඵලදායී දායකත්වයක් ලබා දීම සඳහා සැලසුම් ඒකකය ශක්තිමත් කිරීම.

අනාගත සැලසුම්

- නායයෑම් අවම කිරීම සහ ඒ ආශ්‍රිත ධාරිතාව වැඩි දියුණු කිරීම, උපද්‍රව සිතියම් / අවදානම් පැතිකඩ සකස් කිරීම
- ගම්මාන මට්ටමට සන්නිවේදනය සඳහා නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම
- ආපදා අවම කිරීමේ පියවරක් ලෙස ගොඩනැගිලිවල තත්ත්ව තක්සේරු කිරීම
- විකල්ප ගොඩනැගිලි ද්‍රව්‍ය සහ තාක්ෂණ සහ ඒවායේ තිරසාර භාවිතයන් සංවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාව සඳහා ජාතික ගොඩනැගිලි කේත සංග්‍රහය පිළියෙල කිරීම සඳහා සහාය වීම.

කෘතඥතාව

ගරු ආරක්ෂක අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සහ ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය, ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් එමෙන්ම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි අතුරු කළමනාකරණ කමිටුවේ (IMC) සභාපතිවරයා ද, වන (විශ්‍රාමික), ජෙනරාල් කමල් ගුණරත්න මහතාට, ආයතනයේ සාර්ථකත්වය සඳහා ඔවුන්ගේ මඟපෙන්වීම සඳහා ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

තව ද, ජා. ගො. ප. සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුව සහ විගණන කළමනාකරණ කමිටුවෙහි සාමාජිකයින්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය; කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව; ජාතික අයවැය දෙපාර්තමේන්තුව; මහා භාණ්ඩාගාරය; ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව; විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ අධ්‍යක්ෂ, ජාතික ආපදා සහනසේවා මධ්‍යස්ථානය (NDRSC) මහත්සේ ඇගැයීමකට ලක්කළ යුතු ය.

මේ අවස්ථාවේ දී අපගේ කෘතවේදීත්වය ජාත්‍යන්තර පාර්ශවකාර ආයතනවන ලෝක බැංකුව, UNDP, JICA, ADPC, NGI, AIIB, USGS, ICL, ජපානයේ SATREPS වැඩසටහන, එක්සත් රාජධානියේ සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ THINKlab ඇතුලු විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා මූල්‍ය සහ තාක්ෂණික සහයෝගය ලබාදුන් සියලු සහයෝගීත්ව ආයතනයන් වෙත පුදකළ යුතු ය. ඊට අමතර ව මාගේ අවංක ස්තුතිය අප කෙරෙහි අඛන්ඩ ව විශ්වාසය තැබීම පිළිබඳ ව අපගේ දේශීය පාර්ශවකරුවන් සහ වටිනා පාරිභෝගික හවතුන් වෙත පුද කරමි.

ජා. ගො. ප. සංවිධානයේ මහත් සේ කැපවූ කාර්යමණ්ඩලයට මම ස්තූතිවන්ත වන අතර ඔවුන්ගේ උදව් නොමැතිව අපට මෑත කාලීන අවාසිදායක ආර්ථික තත්ත්වය තුළ මෙවැනි කාර්යසාධනයක් වාර්තා කිරීමට නොහැකි වනු ඇත. ජා. ගො. ප. සංවිධානයෙහි කොදු නාරටිය බඳු දැනුම, කුලසතාවය හා වෘත්තීය නිපුනතාවය පිරි මෙම කණ්ඩායම වෙත අපගේ කෘතඥතාවය පුදකර සිටිමි.

ඉදිරි වසරවල දී ජා. ගො. ප. සංවිධානයෙහි කාර්යසාධනය තවදුරටත් වැඩිදියුණු කිරීමට සහ උපායමාර්ගික සැලැස්ම මගින් නියම කර ඇති මෙහෙවර සහ අරමුණු ඉටු කර ගැනීමට අපි සහයෝගයෙන් කටයුතු කරමු. අපගේ කණ්ඩායමෙහි එකිනෙකා කෙරෙහි ඉතාමත් සහයෝගීතාවයෙන් යුතු ව අදහස් හුවමාරු කරගනිමින් විශිෂ්ඨ ප්‍රතිඵල සාක්ෂාත් කරගනු ඇතැ යි අප විශ්වාස කරමු.



ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්

3. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හැඳින්වීම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (ජා. ගො. ප. සං) 1984 මාර්තු 4 වන දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් පසුව පිහිටුවන ලදී. වසර 39කට ආසන්න කාලයකට පසු ජා. ගො. ප. සංවිධානය ප්‍රමුඛ පර්යේෂණ සහ සංවර්ධන ආයතනයක් සහ කීර්තිමත් තාක්ෂණික සේවා සපයන්නෙකු ලෙස පත් ව ඇත.

සංවිධානයේ කාර්යභාරයන් ලෙස (i) නායයෑම් ආපදා අවදානම් කළමනාකරණය සඳහා කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම සහ ඒ ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම. (ii) නිවාස සහ ඉදිකිරීම් අංශය සඳහා සුදුසු තාක්ෂණය සඳහා පර්යේෂණ සහ සංවර්ධනය දිරිමත් කිරීම. (iii) ස්වභාවික විපත්වල බලපෑමට ඔරොත්තු දිය හැකි ඉදිකිරීම් ප්‍රවර්ධනය කිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ සැපයීම සහ (iv) ආයතනික විශේෂඥතාව ඇති ක්ෂේත්‍රවල තාක්ෂණික උපදේශන සහ පරීක්ෂණ සේවා සැපයීම දක්වා විහිදේ.

ජා. ගො. ප. සංවිධානය යනු අනුපිළිවෙළින් ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය, පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය, භූ තාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය, මානව ජනාවාස සැලසුම් හා පුහුණු අංශය, නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය යන තාක්ෂණික අංශ හය සහ පරිපාලන අංශය, මුදල් අංශය, තොරතුරු සන්නිවේදන හා වැඩසටහන් ඒකකය මෙන් ම අභ්‍යන්තර විගණන ඒකකය යන අංශයන් හි සහයෝගීතාවය යටතේ බහුවිධ විෂය ක්ෂේත්‍රයන් හි ක්‍රියාත්මකවන ආයතනයකි.

කීර්තිමත් පර්යේෂණ ආයතනයක් වශයෙන් පාර්ශවකාර ආයතන විසින් සිදු කරනු ලබන ඉල්ලීම් පරිදි සහ තම විෂය පථය හා සම්බන්ධ පර්යේෂණ සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාව තුළ නායයෑම් අවදානම කළමනාකරණය සඳහා වන කේන්ද්‍රස්ථානය වශයෙන් ජා. ගො. ප. සංවිධානය විසින් බෑවුම් අස්ථායීතාව හඳුනා ගැනීම හා ඒ ආශ්‍රිත අවදානම් තක්සේරු කිරීම, අවදානම් කලාප සිතියම්ගත කිරීම, නායයෑම්වල චලනය සහ නායයෑම් අවදානම් ප්‍රදේශවල වර්ෂාපතනය නිරීක්ෂණය කිරීම, නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු හැඟවීම් නිකුත් කිරීම මෙන් ම නායයෑම් අවම කිරීම යන කටයුතු සිදු කරනු ලබයි. මීට අමතර ව, ජා. ගො. ප. සංවිධානය විසින් දිවයිනේ නායයෑමේ අවදානම් සහිත ප්‍රදේශවල සියලුම ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු සඳහා නායයෑම් අවදානම් තක්සේරු වාර්තා (LRAR) සුවිශේෂී සේවාවක් ලෙස නිකුත් කරයි. මහාභාණ්ඩාගාරය පර්යේෂණ සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයන අතර ජා. ගො. ප. සංවිධානය විසින් ක්‍රියාත්මක කරන ලද නායයෑම් අවදානම් කළමනාකරණ ව්‍යාපෘති සඳහා ද ප්‍රතිපාදන සපයයි.

ආදායම් උපයා යැපෙන, ආයතනයක් ලෙස ජා. ගො. ප. සංවිධානය පරීක්ෂණ සහ තාක්ෂණික උපදේශන සේවා සැපයීමෙන් ආදායම් උපයා එහි පුනරාවර්තන වියදම් සපුරාලයි. ජා. ගො. ප. සංවිධානය සතු ජාත්‍යන්තර තත්ත්ව ආයතනයේ ප්‍රතීතනය ලත් අධි තාක්ෂණික උපාංගයන්ගෙන් සැදුම්ලත් පර්යේෂණාගාර මගින් භූ තාක්ෂණික ඉංජිනේරු පරීක්ෂණ සහ ඉදිකිරීම් යෝග්‍යතාවය සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීම, ජලය, අපජලය, පස, අවසාදිත, වාතය සහ සමුච්චිත විමෝචන පරීක්ෂා කිරීම සිදු කරන අතර; ගොඩනැගිලි තත්ත්ව පරීක්ෂා සහ ව්‍යුහාත්මක අඛණ්ඩතාව තක්සේරු කිරීම මෙන් ම තාක්ෂණික උපදේශන සේවා ලෙස වෙනත් විවිධ අධ්‍යයනයන් තුළින් ජා. ගො. ප. සංවිධානය වෙත ආදායම් රැස්කිරීම සිදුවේ.

ජා. ගො. ප. සංවිධානය වගකිවයුතු සේවා සපයන්නෙකු වශයෙන් විවිධ ක්ෂේත්‍රයන් හි තාක්ෂණික ප්‍රවීනයන් හා එක් ව සියලු පුරවැසියන්ගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීම සඳහා උචිත විසඳුම් ලබාදීමට බැඳී සිටී.

4. දැක්ම, මෙහෙවර සහ ඉලක්කයන්

දැක්ම

ආපදා ප්‍රත්‍යාස්ථික හා තිරසාර නිර්මිත සුරක්ෂිත පරිසරයක

වෙසෙන ජනතාවක්

මෙහෙවර

ආපදා අවදානම අවමකිරීම උදෙසා ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම තුළින් සැමට සුරක්ෂිත හා තිරසාර නිර්මිත පරිසරයක්

ඉලක්කයන්

- ඉලක්කය 1: ආපදා අවදානම් තක්සේරු කිරීමේ විෂයයන් හා විෂය ක්ෂේත්‍ර තුළ තාක්ෂණික විශිෂ්ඨත්වය කරා ළඟාවීම
- ඉලක්කය 2: ආපදා අවදානම අවමකිරීම (DRR) හි අදාළ විෂයයන් හා විෂය ක්ෂේත්‍ර තුළ නෛතික තත්ත්වය සහ ව්‍යවස්ථාපිත බලතල ළඟාකර ගැනීම.
- ඉලක්කය 3: පාරිසරික, භූ තාක්ෂණ ඉංජිනේරු, ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්‍රත්‍යාස්ථික පාරිසරික සැළසුම්කරණය සහ ප්‍රත්‍යාස්ථික ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ප්‍රතීතනය ලත් පරීක්ෂණ සහ තාක්ෂණික සේවා සපයන ඉහළම ජාතික ආයතනයක් බවට පත්වීම
- ඉලක්කය 4: ආපදා අවදානම අවමකිරීම (DRR) සහ ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව සංවර්ධනය පිළිබඳ තාක්ෂණය හා නවෝත්පාදන ක්ෂේත්‍රවල පර්යේෂණ හා සංවර්ධන විශිෂ්ඨත්වය ළඟාකර ගැනීම.
- ඉලක්කය 5: ජාතික කලාපීය සහයෝගීතා සම්බන්ධතා මඟින් ආපදා අවදානම අවමකිරීම (DRR) දිරිගැන්වීම හා පවත්වාගෙන යාම සඳහා ආපදා ප්‍රත්‍යාස්ථික විද්‍යා හා තාක්ෂණය යොදාගැනීම.
- ඉලක්කය 6: ඵලදායී ලෙස ආපදා අවදානම අවමකිරීම සඳහා අදාළ විෂයයන් හා විෂය ක්ෂේත්‍රය තුළ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම
- ඉලක්කය 7: ආපදා අවදානම අවමකිරීමේ ඵලදායී ක්‍රියාත්මකවීම උදෙසා ජා. ගො. ප. සංවිධානයෙහි මූල්‍ය තිරසාර බව ළඟාකර ගැනීම.
- ඉලක්කය 8: නායයෑම් අවදානම කළමනාකරණය සඳහා විශිෂ්ඨත්වයෙන් යුත් ජාතික කේන්ද්‍රස්ථානය බවට පත්වීම.
- ඉලක්කය 9: දේශගුණික සවිඥානික පූර්ව අනතුරු හැඟවීමේ තාක්ෂණය තුළින් ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම
- ඉලක්කය 10: පරිසරය මත පදනම් ආපදා අවදානම් අවමකිරීමේ තාක්ෂණය තුළින් ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම
- ඉලක්කය 11: ප්‍රජා විද්‍යාව පදනම් කරගත් ආපදා අවදානම අවමකිරීමේ ක්‍රියාවලීන් තුළින් ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම.
- ඉලක්කය 12: පුනරුත්ථාපනය සහ නැවත ගොඩනැගීමේ තාක්ෂණය තුළින් ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම

5. ජා. ගො. ප. සංවිධානයේ කළමනාකරණය

විෂයභාර ගරු අමාත්‍ය
ගරු රනිල් වික්‍රමසිංහ
ආරක්ෂක අමාත්‍ය

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්
රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමා

වර්තමානයේ දී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පරිපාලන, මූල්‍ය හා කළමනාකරණ කටයුතු මෙහෙයවීමට සහ මාර්ගෝපදේශකත්වය සැපයීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම් සභාපතීත්වය දරන කැබිනට් අනුමැතිය ලත් අන්තර් කළමනාකරණ කමිටුවක් පත්කර ඇත.

අන්තර්වාර කළමනාකරණ කමිටුව (IMC)

ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න (සභාපති) ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය	**එම්. සී. එන්. බාලසූරිය මිය** අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ අධ්‍යක්ෂ ජනරාල් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	**ආචාර්ය සුගත් යාලේගම මයා** අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා පාලන) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
ඒ. කේ. කරුණානායක මයා අධ්‍යක්ෂ ජනරාල් කාලගුණ දෙපාර්තමේන්තුව	**එච්. යූ. ආර්. ෆොන්සේකා මයා** ප්‍රධාන ගණකාධිකාරී, ආපදා කළමනාකරණ අංශය ආරක්ෂක අමාත්‍යාංශය

ඉංජී. (ආචාර්ය) ආසිරි කරුණාරත්න
අධ්‍යක්ෂ ජනරාල්/ලේකම් (IMC)
ජා. ගො. ප. සංවිධානය

විගණන හා කළමනාකරණ කමිටුව

එම්. සී. එන්. බාලසූරිය මිය සභාපති අතිරේක අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	**එච්. යූ. ආර්. ෆොන්සේකා මයා** (සාමාජික) ප්‍රධාන ගණකාධිකාරී ආපදා කළමනාකරණ අංශය ආරක්ෂක අමාත්‍යාංශය	**ඒ. කේ. කරුණානායක මයා** (සාමාජික) අධ්‍යක්ෂ ජනරාල් කාලගුණ දෙපාර්තමේන්තුව

නිරීක්ෂක

එල්. ජී. බී. සඳමාලි මහත්මිය වැ. බ. විගණන අධිකාරී විගණන කාර්යාලය	**ජේ. ඒ. ඩබ්. කේ. ජයකොඩි මිය** ප්‍රධාන අභ්‍යන්තර විගණක ආපදා කළමනාකරණ අංශය ආරක්ෂක අමාත්‍යාංශය

සහභාගීත්වය

ඉංජී. (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන අධ්‍යක්ෂ ජනරාල් ජා. ගො. ප. සංවිධානය	**කුමුදු රන්දෙනි මහත්මිය** අධ්‍යක්ෂ (මුදල්) ජා. ගො. ප. සංවිධානය	**එච්. එල්. රුවන්තිලක මයා** අභ්‍යන්තර විගණක ජා. ගො. ප. සංවිධානය

ආයතනික ව්‍යුහය



ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන	**අධ්‍යක්ෂ ජනරාල්**
කේ. සී. සුගතපාල මයා	අධ්‍යක්ෂ, මානව ජනාවාස සැලසුම්කරණය හා පුහුණු අංශය
සරත් ප්‍රේමසිරි මයා	අධ්‍යක්ෂ, පාරිසරික අධ්‍යයන හා සේවා අංශය
කිත්සිරි එන්. බණ්ඩාර මයා	අධ්‍යක්ෂ, භූ තාක්ෂණික ඉංජිනේරු හා පරීක්ෂණ අංශය
සුනේත්‍රා මුතුරත්න මිය	අධ්‍යක්ෂ, ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය
ධම්මිකා කහහේන්ගොඩ මෙවි	අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ අංශය
ආචාර්ය ගාමිණී ජයතිස්ස මයා	වැ. බ. අධ්‍යක්ෂ, නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය
කුමුදු රන්දෙනිය මිය	අධ්‍යක්ෂ, මූල්‍ය
සරත් කුරේ මයා	වැ. බ. අධ්‍යක්ෂ, පරිපාලන
සෙනරත් බණ්ඩාර මයා	ව්‍යාපෘති අධ්‍යක්ෂ, (PMU), ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම අවමකිරීමේ ව්‍යාපෘතිය

6. මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය





සමාලෝචිත වර්ෂය තුළ ජා. ගො. ප. සංවිධානය එහි නම් කරන ලද කාර්යයන් සහ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පහත සඳහන් නිශ්චිත කාර්යයන් සිදු කරන ලදී.

රාජ්‍ය ආයෝජන වැඩසටහන යටතේ ව්‍යාපෘති

1. නායයෑම් අවදානම් තක්සේරු වාර්තා කිරීමේ ක්‍රියාවලිය (LRAR)

කඳුකර ප්‍රදේශවල මානව ක්‍රිකාරකම් සහ අවධිමත් ලෙස සංවර්ධනය කටයුතු කිරීම හේතුවෙන් සිදුවන ජීවිත හානි සහ දේපළ හානි අවම කිරීම ඉලක්ක කර ගනිමින් මෙම ක්‍රියාවලිය ආරම්භ කර ඇත. නායයෑමේ අවදානම් ප්‍රදේශවල ගොඩනැගිලි බලපත්‍රයක් හෝ සංවර්ධන ව්‍යාපෘතියක් අනුමත කිරීම සඳහා අනුමැතිය ලබා දීම හෝ නොදීම නිර්දේශ කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානය විසින් පළාත් පාලන ආයතන වෙත නායයෑමේ අවදානම් තක්සේරු වාර්තා නිකුත් කරයි. 2022 දෙසැම්බර් 31 දින වන විට ජා. ගො. ප. සංවිධානය විසින් 2011 මාර්තු මස ආරම්භ කළ දින සිට අයදුම්පත් 100,000 කට අධික සංඛ්‍යාවක් මේ දක්වා අනුමත කර ඇත. 2022 වසරේ නිකුත් කර ඇති අනුමත කිරීම් සංඛ්‍යාව 5157 ක් වන අතර සම්පූර්ණ කාලය සඳහා ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව 815 කි. අයදුම්පතක් අධ්‍යයනයට, අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට සහ වාර්තාවක් නිකුත් කිරීමට ජා. ගො. ප. සංවිධානය නාමික ගාස්තුවක් අය කරයි. 2022 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 35.0ක් මෙම ක්‍රියාවලියේ පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා ලැබුනු අතර ඉතිරි වියදම් ජා. ගො. ප. සංවිධානයේ ආදායමින් දරන ලදී.

වගුව: 2011 මාර්තු මාසයේ ක්‍රියාවලිය ආරම්භයේ සිට LRAR විස්තර

Progress of the Issuance of Landslide Risk Assesment Certificates for Construction and Development Activities in Landslide Prone Areas (LRAB & LRAD)

නායයෑම් අවදානම් සහිත ප්‍රදේශ වල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා නායයෑම් යෝග්‍යතා සහතික නිකුත් කිරීම පිළිබඳ ප්‍රගතිය

(01.03.2011 - 31.12.2022)

අනු අංකය Item No.	District දිස්ත්‍රික්කය	01.03.2011 - 31.12.2022				01.01.2022 - 31.12.2022				Total applications pending (අතිරික්ත ඉල්ලුම්පත් සංඛ්‍යාව) {1-(2+3+4)}	Pending Application Details (අතිරික්ත ඉල්ලුම්පත් පිළිබඳ විස්තර)		
		Applications Received (ලැබූ ඉල්ලුම් පත්) (1)	Permission granted (අනුමැතිය ලබාදුන්) (2)	Permission not granted (අනුමැතිය ලබා නොදුන්) (3)	Applications Cancelled due to other reasons (වෙනත් හේතූන් මත අවලංගු කරන ලද ඉල්ලුම්පත්) (4)	Applications Received (ලැබූ ඉල්ලුම් පත්)	Permission granted (අනුමැතිය ලබාදුන්)	Permission not granted (අනුමැතිය ලබා නොදුන්)	Applications Cancelled due to other reasons (වෙනත් හේතූන් මත අවලංගු කරන ලද ඉල්ලුම්පත්)		Pending For initial Investigation / report preparation (මූලික පරීක්ෂණ සඳහා/වාර්තා සැකැසීම්)	Referred to revisit / detailed inspection (වැඩිදුර අධ්‍යයනයට යොමු කිරීම සඳහා)	Details Pending from Client (ඉල්ලුම්කරුගෙන් අදාල ලියකියවිලි ලැබෙන තෙක්)
1	Kandy	22,463	20,393	317	1,698	926	1,072	1	31	55	55	0	0
2	Matale	9,670	9,620	17	32	446	454	-	-	1	1	0	0
3	Nuwaraeliya	8,581	8,129	86	306	357	327	3	125	60	18	3	39
4	Badulla/Monaragala	14,181	13,602	246	320	817	876	25	-	13	13	0	0
22	Kagalle	12,712	12,091	72	512	480	502	5	72	37	26	3	8
6	Rathnapura	13,447	11,757	47	1,570	699	652	1	57	73	33	4	36
7	Kalutara	1,404	1,332	16	48	123	111	5	18	8	8	0	0
8	Galle	18,345	18,197	9	92	1,150	1,053	-	68	47	47	0	0
9	Matara/H'tota	2,400	2,389	5	6	62	62	-	-	0	0	0	0
10	Kurunagala	60	58	-	1	16	15	-	-	1	1	0	0
11	Colombo/Gampaha	86	84	-	-	35	33	-	-	2	2	0	0
	එකතුව/Total	103,349	97,652	815	4,585	5,111	5,157	40	371	297	204	10	83

2. නායයෑම් විමර්ශන, පර්යේෂණ සහ සංවර්ධන

2.1 නායයෑම් ආපදා කලාප සිතියම්ගත කිරීමේ වැඩසටහන (LHMP)

නායයෑම් අවදානම් කලාප සිතියම්කරණ ව්‍යාපෘතිය (LHMP) ජා. ගො. ප. සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර, නායයෑමේ අවදානම් ලෙස හඳුනාගෙන ඇති දිස්ත්‍රික්ක 13ක වර්ග කි.මී. 32,593.1ක් ආවරණය වන පරිදි 1:50,000 පරිමාණයේ නායයෑම් ආපදා කලාප සිතියම් සකස් කර ඇත. එසේම, 2022 අවසන් වන තෙක් හඳුනාගත් ප්‍රමුඛතා ප්‍රදේශවලින් වර්ග කිලෝමීටර් 9440ක් ආවරණය වන පරිදි 1:10,000 පරිමාණයෙන් නායයෑම් ආපදා කලාප සිතියම් සකස් කර ඇත. 2022 වර්ෂයේ දී මහනුවර සහ කෑගල්ල දිස්ත්‍රික්ක මායිම්වල 480 වර්ග කි.මී. සිතියම්ගත කිරීම අවසන් කර ඇති අතර ඒ සඳහා රු. මිලියන 23.0 ක් වැයකර ඇත.

මෙම ව්‍යාපෘතිය මඟින් සකස්කරන ලද සිතියම් නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත් කිරීම සහ ආපදා තක්සේරු කිරීම උදෙසා නායයෑම් විමර්ශන කටයුතු කිරීම සඳහා ද, නායයෑම් අවදානම් තක්සේරු කිරීමේ වාර්තා නිකුත් කිරීම (LRAR) සඳහා ද, නාය අනතුරු සිදුවිය හැකි භූමි හඳුනා ගැනීමේ ප්‍රමුඛතාවය අනුව අවම කිරීමේ ව්‍යුහ ම ය ක්‍රමවේද යෙදීමේ කාර්යයන් සඳහා ද භාවිතා කරනු ලැබේ. තව ද, විවිධ ආයතන මඟින් ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ සැලසුම්කරණ කටයුතු සඳහා ද මෙම සිතියම් භාවිත කරනු ඇත. මෙම සිතියම් බොහොමයක් ජා. ගො. ප. සංවිධානයේ වෙබ් අඩවියෙන් නොමිලේ බාගත හැකිය (www.nbro.gov.lk).



උපද්‍රව කලාප සිතියම්කරණ ප්‍රදේශය





උපද්‍රව කලාප සිතියමක්

2.2 නායයෑම් විශේෂ විමර්ශන (SPI)

නායයෑම් නිසා අසල්වැසි මානව ජනාවාස, යටිතල පහසුකම් සහ වතු ආශ්‍රිත ව පවතින අවදානම් හඳුනා ගැනීමේ සහ ජීවිත, දේපළවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නායයෑම් සම්බන්ධ විශේෂ විමර්ශන පවත්වා කඩිනමින් නිර්දේශ ලබා දෙන ලෙස ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම්වරුන් මෙන් ම වෙනත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් විසින් ජා. ගො. ප. සංවිධානය වෙතින් ඉල්ලීම් සිදු කෙරේ. 2022 වසරේ දී එබඳු නායයෑම් විශේෂ විමර්ශන 4600 ක් සිදු කර ඇත. ඒ සඳහා මහාභාණ්ඩාගාරය විසින් රු. මිලියන 65.9 ක ප්‍රතිපාදන සපයා ඇත.

3. නායයෑම් අවම කිරීමේ වැඩසටහන (GOSL අරමුදල්)

නායයෑම් අවදානම් කලාප සිතියම්කරණ ව්‍යාපෘතිය සහ නායයෑම් විශේෂ විමර්ශන යටතේ අවමකිරීම අත්‍යවශ්‍ය යැයි හඳුනාගෙන ඇති නායයෑම් සහ බෑවුම් අස්ථාවරතා සහ අනෙකුත් බෑවුම් වැඩිදියුණු කිරීමේ කටයුතු අතර නුවරඑළියේ සහීරා විද්‍යාලයේ සහ රත්නපුරේ බෝල්තුඹේ සඳහා අවම කිරීමේ කටයුතු වෙනුවෙන් 2022 වර්ෂයේ දී ප්‍රමුඛත්වය දී ඇත. එසේ වුවත්, 03/2022 ජාතික අයවැය චක්‍රලේඛයේ නියමයන්ට අනුව මෙම ව්‍යාපෘති දෙක කල් දමන ලදී.

විෂ්ණු දේවාලය සහ දළදා මාළිගාව ඉදිරිපිට පිහිටි කඩා වැටුණු කැපුම් බෑවුම් කොටස සඳහා විමර්ශන සහ සැලසුම් කටයුතු, වටවල නායයෑමේ ඉදිකිරීම්වල අවහිර වූ අභ්‍යන්තර කාණු පද්ධතිය නැවත සැකසීම, කහංගම බෞද්ධ විද්‍යාලයේ අස්ථාවර බෑවුම් ස්ථාවර කිරීම සඳහා සැලසුම් කිරීම සහ තලපිටිය සුසාන භූමි පරිශ්‍රයේ කැපුම් දෝෂ නිවැරදි කිරීම සහ ආධාරක වැඩ ඉදිකිරීම් කටයුතු ඉටුකළ අතර ඒ සඳහා රුපියල් මිලියන 10.0 ක් වැයකරන ලදි. මීට අමතරව, නුවරඑළිය දිස්ත්‍රික්කයේ මාලපට්ටාව නායයෑමේ සහ ගල් පෙරළීමේ ස්ථානයේ 2021 දී ආරම්භ කරන ලද වැඩ සාර්ථකව නිම කර ඇත.



මලපට්ටාව නායයෑම/RF

4. නායයෑමේ අවදානම සහිත ප්‍රදේශ සඳහා අවදානම් පැතිකඩ සැකසීම



ආපදා අවදානම් අවම කිරීම සහ සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේ දී ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ තීරණ ගන්නන්ට මග පෙන්වීම සඳහා නිමැවුම් මාලාවක් සංවර්ධනය කිරීම සඳහා නායයෑම් අවදානම් පැතිකඩ සංවර්ධන ව්‍යාපෘතිය 2016 දී ආරම්භ කරන ලදී. ව්‍යාපෘතිය යටතේ, ආපදා අවදානම තක්සේරු කිරීමේ දී සහ කෙටි, මධ්‍ය කාලීන සහ දිගුකාලීන ආපදා අවදානම් අවම කිරීමේ තීරණ සැකසීමේ දී ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ආයතනවල ධාරිතාව ඉහළ නැංවීම සඳහා නායයෑමේ අවදානම් දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි නායයෑම් අවදානම් පැතිකඩ සකස් කරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද නායයෑම් අවදානම් තොරතුරු ද්වාරය කාර්යක්ෂම සහ ඉක්මන් දත්ත ලබාගැනීමට හැකි මාර්ග ගත වේදිකාවකි. මෙහි අවදානම් කාණ්ඩ වන්නේ, යම් ප්‍රදේශයක උපද්‍රවවලට නිරාවරණය වන ජනගහනය, දේපළ, ආර්ථික ක්‍රියාකාරකම් හෝ වෙනත් නිශ්චිත අගයන් ය. මෙම අවදානම් විශ්ලේෂණයේ මූලික පරමාර්ථය වන්නේ නායයෑම් අවදානමට ලක්ව ඇති කාණ්ඩවල ජනතාවගේ ජීවිකාව සහ ගොඩනැගිලි භාවිතය තක්සේරු කිරීමයි. මේ වන විට වාර්තා 84,000ක් පමණ උඩුගත කර ඇත. (https://lrip.nbro.gov.lk/). මීට අමතරව, සැලසුම් කර ඇති වසර 5ක කාර්යයන්ගෙන් 2022 වසරේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රජා ආපදා කළමනාකරණ කමිටු 16ක් පිහිටුවීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ අවදානම් පැතිකඩ සංවර්ධනය (මහනුවර, මාතර, මහනුවර, මාතලේ, රත්නපුර, කළුතර, ගාල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක)
- කලාපීය සහ ප්‍රාදේශීය මට්ටමේ තීරණ ගන්නන් සඳහා නායයෑම් අවදානම් තොරතුරු බෙදා හැරීමේ වැඩමුළු - වැඩමුළු 5
- නායයෑම් අවදානම් තොරතුරු ද්වාරයෙහි දත්ත ප්‍රකාශනය කිරීම, ද්වාරය භාවිතා කිරීම සඳහා අදාළ බලධාරීන් සහ පාර්ශවකරුවන් සඳහා පුහුණුව සහ දැනුවත් කිරීම (DMC, NDRSC, නායයෑමේ අවදානම් දිස්ත්‍රික්ක 10 ක දිස්ත්‍රික් ලේකම් කාර්යාල - (නුවරඑළිය සහ කළුතර දිස්ත්‍රික්කවල සම්පූර්ණයෙන්ම අවසන්කර ඇත.)
- නායයෑම් ප්‍රවාහ මාර්ගය අනුකරණය කිරීම (කහ කලාපය සහ රතු කලාපය) - LHMP සිතියම් ස්ථර 24 සඳහා ආදර්ශ අනුකරණය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 53ක් සඳහා අවදානම් පොකුරු හඳුනා ගැනීම සහ අවදානම් අවම කිරීමේ පියවර

5. නායයෑම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම (පද්ධතිය නඩත්තු කිරීම)

ජා. ගො. ප. සංවිධානය ඵලදායී නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත්කිරීම සඳහා නායයෑම් ප්‍රේරණය බහුල වශයෙන් සිදුවන්නේ අධික තීව්‍රතාවයකින් යුත් වර්ෂාපතනයක් සමඟ පාංශු තෙතමනය වැඩිවීම හේතුවෙන් වීම නිසා නායයෑම් අවදානම් ප්‍රදේශවල වර්ෂාපතනය නිරීක්ෂණය සඳහා ස්වයංක්‍රීය වර්ෂාමාන 330 ක් සහිත ජාලයක් පවත්වාගෙන යනු ලබයි. ජා. ගො. ප. සංවිධානයෙහි නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් මධ්‍යස්ථානයෙහි විද්‍යාඥයින්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන කාලගුණ පුරෝකතනයන් හා ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිය වෙතින් ලබාගන්නා වර්ෂාපතන දත්තයන් විශ්ලේෂණය තුළින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධ ව පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කරනු ලබයි. මීට අමතරව, ජා. ගො. ප. සංවිධානය විසින් භූ චලනය හඳුනා ගැනීමේ උපකරණ සහ තෙතමනය සංවේදන උපකරණ සමඟ නායයෑම් නිරීක්ෂණය කිරීමේ හැකියාව වැඩි දියුණු කර ඇත. 2022 දී පූර්ව අනතුරු ඇඟවීම් 99 ක් නිකුත් කර ඇති අතර භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 10.0 පද්ධතියේ අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා වෙන්කර ඇත.





Schematic diagram of the socio-technical management system on landslide early warning



6. ශ්‍රී ලංකාව තුළ රසායනික ආපදා අවදානම විධිමත් තක්සේරුකරණය



ලෝකයේ බොහෝ කාර්මික රටවල තවමත් රසායනික විපත් සාපේක්ෂ වශයෙන් නිතර සිදුවේ. ශ්‍රී ලංකාවේ ද රසායනික ආශ්‍රිත කර්මාන්තවල ශීඝ්‍ර දියුණුව හේතුවෙන් පසුගිය වසර කිහිපය තුළ රසායනික අනතුරුවල වාර ගණන සහ බරපතලකම ද ඉහළ ගොස් ඇත. විපතට පත්වන ප්‍රජාවන් ආරක්ෂා කිරීම සඳහා රසායනික ව්‍යසනවල අවදානම් සහ බලපෑම් ක්‍රමානුකූල ව තක්සේරු කිරීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවයකි.

මෙම හදිසි අවශ්‍යතාවය අවබෝධ කරගත් ජා. ගො. ප. සංවිධානය විසින් "ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම පිළිබඳ ක්‍රමානුකූල තක්සේරුව" නැමැති ව්‍යාපෘතිය සැලසුම් කරන ලදී. මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ රසායනික කර්මාන්ත පහසුකම් හා සම්බන්ධ රසායනික ආපදා අවදානම තක්සේරු කිරීම සඳහා ක්‍රමානුකූල ක්‍රමවේදයක් සකස් කිරීම අරමුණු කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ ජා. ගො. ප. සංවිධානය විසින් මූලික කාර්යාල මට්ටමේ අවදානම් තක්සේරුවක් සිදු කිරීම සඳහා රසායනික කර්මාන්ත තොරතුරු රාමුවක් සකස් කර අතීත රසායනික ආපදා සිදුවීම් සහිත දත්ත ගබඩාවක් සහ මූලික පාරිසරික තත්ත්ව සඳහා දත්ත රාමු සකස් කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ රසායනික ආශ්‍රිත කර්මාන්තවල දත්ත සමුදායන් වෙත පිවිසිය හැකි සහ ඩිජිටල් සිතියමක ප්‍රදර්ශනය කළ හැකි ක්ෂේත්‍ර දත්ත රැස් කිරීමට හැකියාව සහිත ජංගම යෙදුමක් ද සංවර්ධනය කරන ලදී.

තක්සේරු ක්‍රමයක් සම්පාදනය කර "ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම ක්‍රමානුකූලව තක්සේරු කිරීම සඳහා වූ අත්පොත" ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. ඇගයීම් පද්ධතිය සුමටව පවත්වාගෙන යාම සඳහා

අදාළ ප්‍රතිපත්ති නිර්දේශ සකස් කළ යුතු බව හඳුනා ගන්නා ලදී. විවිධ පාර්ශ්වකරුවන්ගේ ආයතන සහ ජාතික ආපදා සම්බන්ධීකරණ යාන්ත්‍රණය අතර වැඩි දියුණු කරන ලද සම්බන්ධීකරණයේ අවශ්‍යතාවය වැඩි වෙමින් පවතින බැවින්, ශ්‍රී ලංකාවේ රසායනික ආපදා කළමනාකරණයට අදාළ ප්‍රතිපත්ති නිර්දේශ සමඟ ශ්‍රී ලංකාවේ රසායනික ආපදා කළමනාකරණය සඳහා ජාතික කාර්ය සාධක බලකායක් පිහිටුවීම සඳහා ව්‍යාපෘතියෙන් නිර්දේශ කරන ලදී.

7. ගොඩනැගිලි තක්සේරු කිරීම සහ තත්ත්ව වාර්තාකරණය සඳහා ක්‍රමෝපාය සංවර්ධනය කිරීම

රජය සතු පොදු ගොඩනැගිලි සහ මහජනතාව බහුලව භාවිතාකරන අනෙකුත් ගොඩනැගිලි හිමිකරුවන් විසින් නිර්මිත කාලයකට වඩා පැරණිවීම, ඉපැරණිභාවය නිසා පරිහානියට පත් ව ඇති බවක් විද්‍යාමානවීම, දුර්වල මට්ටමේ ව්‍යුහාත්මක අඛණ්ඩතාවයක් සහිතවීම, ව්‍යසනයක දී භෞතික හානිවලට ලක් ව තිබීම, දුර්වල නඩත්තුකරණය හෝ අවට පරිසරයේ සිදුවන ඉදිකිරීම්වල බලපෑම් වැනි හේතූන් මත තත්ත්ව ඇගැයීම් වාර්තාවක් ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස්කර ඇත. ඒ අනුව ජා. ගො. ප. සංවිධානය විසින් තාක්ෂණික/ව්‍යුහාත්මක තක්සේරු වාර්තාව නිකුත් කර නිර්දේශ ඉදිරිපත් කරයි. ජා. ගො. ප. සංවිධානය විසින් 2022 වර්ෂයේ දී රුපියල් මිලියන 25 ක් වැයකර ගොඩනැගිලි 156 ක ව්‍යුහාත්මක තක්සේරු කිරීම් සහ විමර්ශන සිදු කර නිර්දේශ ලබා දෙන ලදි.



ඔරුගොඩවත්ත මජීඩ් පෙදෙස නිවාස සංකීර්ණය



රත්නාවලී බාලිකා විද්‍යාලයය, බොරැල්ල

7. පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්

ජා. ගො. ප. සංවිධානය විස්තීර්ණ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනක් සැලසුම් කර ඇති අතර පර්යේෂණ අවශ්‍යතා බොහෝ විට කර්මාන්තය සමඟ සාකච්ඡා කර හඳුනා ගැනේ. ජා. ගො. ප. සංවිධානය විසින් කර්මාන්තයේ පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා එහි පාර්ශවකරුවන් සමඟ වසර ආරම්භයේ දී වාර්ෂික කර්මාන්ත උපදේශන රැස්වීම පවත්වයි. මෙම පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයක් සෑම වසරකම පවත්වනු ලැබේ. 2022 වර්ෂයේ රාජ්‍ය ප්‍රතිපාදන ලෙස රු. මිලියන 7.5ක් ජා. ගො. ප. සංවිධානය වෙත ලැබුණි. ජා. ගො. ප. සංවිධානයේ පර්යේෂණ කමිටුව විසින් අදාළ විද්‍යාඥයින්ට ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සිදුකිරීම සඳහා මගපෙන්වීම අඛණ්ඩ ව සිදු කරන අතර අවශ්‍ය සහාය සහ පහසුකම් සපයන ලදී.

2022 වර්ෂයේ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු පහත වගුව මඟින් දැක්වේ.

ප්‍රධාන පර්යේෂක	අංශය	පර්යේෂණ මාතෘකාව
එස්. ඒ. ඩී. ඒ. එස්. සුරවීර	ගො. ද්‍ර. ප. හා පුහුණු අංශය	අගය එකතු කළ ගොඩනැගිලි නිෂ්පාදන සඳහා අක්වෙරළ වැලි රොන්මඩවල යෝග්‍යතාවය
එස්. ආර්. රන්දික		කොහු තන්තු භූ ආස්තරන පරීක්ෂණ ක්‍රමය සහ පිරිවිතර සංවර්ධනය
ඩී. ආර්. රත්නසිංහ		අපද්‍රව්‍ය යොදා ගනිමින් ශාක වර්ධනය වන පරිවර්තන කොන්ක්‍රීට් සංවර්ධනය කිරීම
ඊ. ජී. එච්. ඩී. බී, ඇල්ලෙගම		සිමෙන්ති පරීක්ෂාව සඳහා ISO සම්මත වැලි නිෂ්පාදනය
හර්ෂිණී කුමාරපේලි	පාරිසරික අධ්‍යයන හා සේවා අංශය	වාතාශ්‍ර තත්ත්වයන් තක්සේරු කිරීම සහ නාගරික වාසස්ථානවල ගෘහස්ථ වාතයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා ගෘහස්ථ උපකරණ භාවිතය
එස්. ඒ. එම්. එස්. දිසානායක		නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති පිළිබඳ පාරිසරික, සමාජීය, සෞඛ්‍ය සහ ආරක්ෂාව (ESHS) රථවාහන කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම
ආර්. රුහුණුගේ		අනුරාධපුර දිස්ත්‍රික්කයේ වහල වැසි ජල එක්රැස් කිරීමේ පද්ධතියේ (RRWHS) නියමු ව්‍යාපෘතිය පුළුල් කිරීම සහ පානීය ජල සුරක්ෂිතතාව තහවුරු කිරීම.
එන්. ඩී. සී. ලක්මාල්		වැදගත් වායු දූෂක පරාමිතීන් එකතු කිරීම සහ වායු තත්ත්ව පුරෝකථන පද්ධතිය සංවර්ධනය කිරීම මඟින් පවතින වායු තත්ත්ව අධීක්ෂණ ධාරිතාව වැඩි දියුණු කිරීම
එච්. හේමසිංහ	නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය	ජා. ගො. ප. සංවිධානයෙහි පවතින නායයෑම් උපද්‍රව සිතියම්කරණ ක්‍රියා පටිපාටිය වලංගු කිරීම සහ වැඩිදියුණු කිරීම
පී. එම්. ජී. ආර්. බණ්ඩාර		ශ්‍රී ලංකාවේ නායයෑම් සඳහා මිණුම් සහ අවදානම් මත පදනම් වූ වර්ගීකරණය
එම්. අමරසිංහ		ජල පාරගම්‍ය ආකෘතිකරණය හරහා කලාප පදනම් වූ වර්ෂාපතන සීමාවන් ඇතුළත් කිරීමෙන් නායයෑම් උපද්‍රව කලාප සිතියම්වල පුරෝකථන හැකියාව වැඩිදියුනු කිරීම
ඒ. එම්. ආර්. එස්. අමරතුංග	ව්‍යාපෘති කළමනාකරණ අංශය	වැරගැන්වූ කොන්ක්‍රීට් ව්‍යුහයන්හි හානි නොවන පරීක්ෂණ සඳහා කෘතිම බුද්ධිය
එන්. ජී. ආර්. කේ. ගුණතුංග		ශ්‍රී ලංකාවේ ආපදා ප්‍රතිරෝධී ගොඩනැගිලි සැලසුම් කිරීම සඳහා යුරෝ කේත අනුගමනය කිරීම.

8. සිම්පෝසියා

ජා. ගො. ප. සංවිධානයේ 12 වැනි වාර්ෂික පර්යේෂණ සමුළුව - 2022
"ආර්ථික අභියෝග මධ්‍යයේ ප්‍රත්‍යාස්ථිරීය ගොඩනැගීම"

Building Resilience amidst Economic Challenges

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සංවිධානය කරන ලද "ආර්ථික අභියෝග මධ්‍යයේ ප්‍රත්‍යාස්ථතිය ගොඩනැගීම" මැයෙන් 12 වැනි වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ සමාරම්භක උත්සවය 2023 ජනවාරි 26 වැනි දින කොළඹ BMICH හි දී සාර්ථක ව පැවැත්විණි. පර්යේෂකයන්, ආපදා කළමනාකරණ වෘත්තීයවේදීන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ දේශීය හා ජාත්‍යන්තර ආයතනවල කීර්තිමත් විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් මෙම සම්මන්ත්‍රණය උත්කර්ශවත් අයුරින් පවත්වනු ලැබූ අතර මාර්ගගතව බොහෝ පිරිසක් ඊට සහභාගී විය. මෙම සම්මන්ත්‍රණය සාකච්ඡා, අදහස් හුවමාරු කර ගැනීමට සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා කදිම වේදිකාවක් විය.



සමාරම්භක සැසිය ඇමතීම
ඉංජිනේරු. (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන මහතා

මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න මහතා සහභාගි විය. සමාරම්භක සැසියේ දී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු. (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන මහතා විසින් පිළිගැනීමේ කතාව ඉදිරිපත් කරණ ලදි. ඉන් අනතුරුව ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සියේ ශ්‍රී ලංකා කාර්යාලයේ ප්‍රධාන නියෝජිත යමාඩා තෙසුයා මහතා සම්මන්ත්‍රණය ඇමතීය. එහි ප්‍රධාන දේශනය කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ ප්‍රධානී මහාචාර්ය සිරිමල් අබේරත්න මහතා විසින් පවත්වන ලදී. අනතුරුව, පහත දැක්වෙන ප්‍රකාශනයන් එළිදැක්වීමේ විශේෂ අවස්ථාව එළැඹිණි.

- ජා. ගො. ප. සංවිධානයේ 2022 වර්ෂයේ 12 වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ සම්මන්ත්‍රණ වාර්තාව
- ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම ක්‍රමානුකූලව තක්සේරු කිරීම පිළිබඳ අත්පොත
- ව්‍යාපෘතියේ ව්‍යාපෘති අත්පොත් හඳුන්වා දීම
- 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ නාගරික වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ වාර්ෂික වාර්තාව සහ වීඩියෝ ඉදිරිපත් කිරීම
- රෙදි කැබලි මගින් ශක්තිමත් කරන ලද බිම් ඇතිරුම් බ්ලොක් සඳහා වූ පේටන්ට් බලපත්‍රය පිළිබඳ වීඩියෝ සංක්ෂිප්තය.
- අවම කරන ලද නායයෑම් ස්ථාන පිළිබඳ දත්ත ගබඩාව පිළිබඳ නිරූපණය
- ජා. ගො. ප. සංවිධානය සහ සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලයීය තාක්ෂණික සහයෝගීතාවයෙන් කළුතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක ආපදා විසඳුම් පිළිබඳ ඉදිරිපත් කිරීම



ප්‍රධාන ආරාධිත අමුත්තාගේ දේශනය

ආර්ථික අභියෝග මධ්‍යයේ අවදානම් කළමනාකරණය සහ ප්‍රත්‍යාස්ථිතීය ගොඩනැගීම පිළිබඳ විද්වත් සාකච්ඡාවක් වෝසිතා විජේනායක මහත්මිය විසින් මෙහෙයවන ලදි. ආර්ථික අභියෝග මධ්‍යයේ ප්‍රත්‍යාස්ථිතිය ගොඩනැගීම පාදක ප්‍රධාන අංශ හතරක් යටතේ පවත්වන ලද සම්මන්ත්‍රණයේ ආරම්භය ඒ සමග සනිටුහන් විය.

ආසියානු ආපදා පෙර සූදානම් ආයතනයේ හි හිටපු විධායක අධ්‍යක්ෂ, ආපදා අවදානම අවම කිරීම පිළිබඳ විශේෂඥ උපදේශක සුසිත් අරඹේපොල මහතා ආර්ථික අභියෝග සහ දේශගුණික විපත්ති අවදානම පිළිබඳව සාකච්ඡා කරන ලදි. මුදල් අමාත්‍යාංශයේ සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ. සාරකන් මහතා ආර්ථික අභියෝග සහ අවදානම් කළමනාකරණ උපාය මාර්ග පිළිබඳ අදහස් ප්‍රකාශ කළ අතර, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් දිසානායක මහතා නිර්මිත පරිසරය තුළ ප්‍රත්‍යාස්ථිතීය සඳහා දිගුකාලීන ප්‍රවේශයක ප්‍රධාන අවශ්‍යතා පිළිබඳ ව අදහස් පළ කළේය.

ආර්ථික අභියෝග මධ්‍යයේ නායයෑම් අවදානම් කළමනාකරණය පිළිබඳ ව නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ, ආචාර්ය එච්.ඒ.ජී. ජයතිස්ස මහතා ද, දේශගුණික විපර්යාස සහ මානව සංචලනයේ සන්දර්භය තුළ අවදානම් හුවමාරුව සහ මූල්‍ය පහසුකම් සැපයීම සහ සුදුසු භාවිතයන් පිළිබඳව SLYCAN භාරයේ පර්යේෂණ සහ දැනුම කළමනාකරණයේ අධ්‍යක්ෂ, ඩෙනිස් මොම්බාවුර් මහතා විසින් ද සාකච්ඡා කරන ලදී.



යමාඩා ටෙට්සුයා මහතාගේ කථාව –
JICA ශ්‍රී ලංකා කාර්යාලය

ආර්ථික අභියෝග මධ්‍යයේ ප්‍රත්‍යාස්ථිතීය ගොඩනැගීම යන ප්‍රධාන තේමාවට අදාළ තාක්ෂණික සැසි හතරක් පවත්වන ලදී. පර්යේෂකයන් සතර දෙනෙකුට එක් එක් තාක්ෂණික සැසි සතරක් යටතේ සිය පර්යේෂණ ඉදිරිපත් කිරීමට වරප්‍රසාද හිමි වූ අතර එමඟින් මුළු පර්යේෂණ ඉදිරිපත් කිරීම් දහසයකට සීමා විය.



ප්‍රධාන දේශනය මහාචාර්ය සිරිමල් අබේරත්න

“ආපදා අවදානම අවබෝධ කර ගැනීම” තේමා කරගත් පළමු තාක්ෂණික සැසිය මොරටුව විශ්වවිද්‍යාලයේ භූ සම්පත් ඉංජිනේරු අංශයේ මහාචාර්ය රංජිත් ප්‍රේමසිරි මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

"ප්‍රත්‍යාස්ථිතීය සඳහා අවදානම් අවම කිරීම" මැයෙන් දෙවන තාක්ෂණික සැසියේ මූලසුන හොබවන ලද්දේ මොරටුව විශ්ව විද්‍යාලයේ සිවිල්

ඉංජිනේරු අංශයේ මහාචාර්ය උදේනි නවගමුව මහතා විසිනි.

මොරටුව විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චින්තා ජයසිංහ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවතියේ ඔරොත්තු දීමේ හැකියාව සඳහා සංවර්ධනය නියාමනය කිරීම පිළිබඳ තෙවන තාක්ෂණික සැසිවාරය යි.

ප්‍රත්‍යාස්ථිතීය සඳහා තත්ත්ව සහතිකය පිළිබඳ සිව්වන තාක්ෂණික සැසියේ සභාපති ලෙස මොරටුව විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. එම්. ඒ. නානායක්කාර මහතා දායක විය.

මෙම සම්මන්ත්‍රණය දේශීය හා ජාත්‍යන්තර ආයතනවල පර්යේෂකයන්, ආපදා කළමනාකරණ වෘත්තීයවේදීන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ කීර්තිමත් ප්‍රවීණයන් ආකර්ෂණය කර ගත් අතර සාකච්ඡා, අදහස් හුවමාරු කර ගැනීමට සහ අත්දැකීම් බෙදා ගැනීම සඳහා විශිෂ්ට වේදිකාවක් විය. පර්යේෂණ පත්‍රිකා *36* ක් අඩංගු සම්මන්ත්‍රණ වාර්තාවේ මුද්‍රිත පිටපත සහභාගීවූවන්හට ලබා දෙන ලදී.



ආර්ථික අභියෝග මධ්‍යයේ අවදානම් කළමනාකරණය සහ ප්‍රත්‍යාස්ථිතීය ගොඩනැගීම පිළිබඳ විද්වත් සාකච්ඡාව

මෙම සම්මන්ත්‍රණය සාර්ථක කර ගැනීම සඳහා දායක වූ විශේෂ ආරාධිතයින්, පර්යේෂකයන්, විද්වතුන්, අරමුදල් සපයන ආයතන සහ සහභාගිවන්නන් ඇතුළු සියලුම පාර්ශ්ව වෙත ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කෘතඥතාව පළ කරන ලදි.

9. ප්‍රධාන උපදේශන ව්‍යාපෘති

ඉදිකිරීම් මගින් යාබද පරිසරයට ඇති විය හැකි අහිතකර බලපෑම් තක්සේරු කිරීම සඳහා භූ-තාක්ෂණික නිෂ්කාශනය

ගැඹුරු කැණීම්, අත්තිවාරම් සහිත ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ඇතුළු යෝජිත සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදීමේ දී නාගරික සංවර්ධන අධිකාරිය (UDA), වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (CCD), මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) වැනි ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන මඟින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙතින් භූ තාක්ෂණික නිෂ්කාශනයක් ලබා ගැනීම සඳහා යොමු කරයි. මෙම අවශ්‍යතාවය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඔවුන්ගේ අලුතින් ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රය (2021 ජූලි 08 වන දින ප්‍රකාශයට පත් කරන ලද UDA සැලසුම් සහ සංවර්ධන රෙගුලාසි 2021 ගැසට් අංක 2235/54 හි අංක 57 (3) c. වගන්තිය) අනුව පනවනු ලැබේ.

මෙම භූ තාක්ෂණික නිෂ්කාශනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ, විශේෂයෙන් ම ගොඩනැගිල්ලේ උප ව්‍යුහය ඉදිකිරීමේ දී, යාබද දේපළවලට සහ අවට ඉදිකරන ලද පරිසරයට යෝජිත සංවර්ධන කටයුත්තක දී වන අව බලපෑම තක්සේරු කිරීමයි.

ඒ අනුව, NBRO විසින් 2022 වසර සඳහා භූ-තාක්ෂණික නිෂ්කාශන සහ අලුත් කිරීම් 21ක් නිකුත් කළ අතර උපදේශන ගාස්තුව ලෙස රුපියල් මිලියන 3.7ක් උපයා ඇත. 2017 සිට 2022 දක්වා නිකුත් කරන ලද නිශ්කාෂණ සහ අලුත් කිරීම් පහත වගුවේ දැක්වේ.

වසර	2017	2018	2019	2020	2021	2022
වාර්තා සහ අලුත්කිරීම ගණන	32	38	20	09	35	21

ගොඩනැගිලිවල තත්ත්ව වාර්තා නිකුත් කිරීම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ගොඩනැගිලිවල තත්ත්වය සහ ඒවායේ ව්‍යුහාත්මක අඛණ්ඩතාව තක්සේරු කිරීම සඳහා පරීක්ෂණ පවත්වන අතර ගාස්තු මත පදනම් වූ සේවාවක් ලෙස අදාළ වාර්තා නිකුත් කරයි. පාරිභෝගික ඉල්ලීමක් හෝ අධිකරණ නියෝගයක් අනුව ඒවා නිකුත් කෙරේ. බොහෝ විට එවැනි සේවාවන් යාබද දේපළ, ගොඩනැගිලිවලට ඉදිකිරීම් කටයුතු හේතුවෙන් සිදුවන හානි තක්සේරු කිරීමට අවශ්‍ය වේ.

වසර	2015	2016	2017	2018	2019	2020	2021	2022
වාර්තා ගණන	42	60	148	116	124	116	141	173

මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ සහ ආරබොක්ක කාර්මික ප්‍රදේශයේ අවට වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ සමුච්චිත බලපෑම් අධ්‍යයනය



ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) විසින් හම්බන්තොට ප්‍රදේශයේ මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ (EPZ) සහ යෝජිත ආරබොක්ක කර්මාන්ත ප්‍රදේශයේ ස්ථානගත කිරීමට යෝජිත තෝරාගත් කර්මාන්ත හේතුවෙන් අවට වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ සමුච්චිත බලපෑම් අධ්‍යයනයක් සිදු කරන ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් ඉල්ලීමක් කර ඇත. අවට පරිසරයේ සංසරණ වාතයේ ගුණාත්මකභාවයට ඔවුන්ගේ දායකත්වය තක්සේරු කිරීම සඳහා එක් එක් කර්මාන්තයේ වායු දූෂණ ප්‍රභවයන් තනි තනිව පරීක්ෂා කරන ලද අතර අවසානයේ පවතින සහ යෝජිත සියලුම කර්මාන්ත හේතුවෙන් වන සමුච්චිත බලපෑම තක්සේරු කරන ලදී. USEPA AERMOD වායු විසරණ ආකෘතිය (V 10.2.1) අවට ප්‍රදේශයේ පරිසර වාතයේ ගුණාත්මකභාවය කෙරෙහි පුද්ගල සහ සමුච්චිත බලපෑම් තක්සේරු කිරීම සඳහා යෝජිත කර්මාන්තවල එක් එක් ලක්ෂ්‍ය ප්‍රභවයන් විසින් දූෂකවල බිම් මට්ටමේ සාන්ද්‍රණයන් තක්සේරු කිරීම

සඳහා භාවිත කරන ලදී. සමුච්චිත බලපෑම තක්සේරු කිරීමේ දී ලක්ෂ්‍ය මූලාශ්‍ර විමෝචන සහ ඉවත්වන විමෝචන යන ආකාර දෙකම සලකා බලන ලදී.

මහනුවර-කොළඹ මහා මාර්ගයේ කඩුගන්නාව නායයෑම අවම කිරීම්

කඩුගන්නාව ප්‍රදේශයේ නායයෑම සක්‍රීය වීමත් සමඟ මහනුවර, කොළඹ මහා මාර්ගයේ කිලෝමීටර් 98 කණුව ප්‍රදේශයේ වාහන ගමනාගමනය සම්පූර්ණයෙන් ම නැවතින. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නායයෑම පාලනය කිරීම සහ නිවැරදි කිරීම සඳහා ක්ෂණික අවම කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කර රථවාහන සඳහා මහාමාර්ගය නැවත විවෘත කිරීමට අදාළ බලධාරීන්ට සහාය විය.

මූලික නිවැරදි කිරීමේ පියවර: නායයෑමට තුඩු දෙන ජල පීඩනය මුදා හැරීම සඳහා දිශානුගත ගුරුත්වාකර්ෂණ කාණු වහාම ස්ථාපනය කළ අතර දිනකට ජලය ලීටර් 11,000 ක ප්‍රමාණයක් ලිස්සීමට තුඩුදුන් පස් කණ්ඩියෙන් සාර්ථක ව ඉවත් කරන ලදී.

දිගුකාලීන අවම කිරීමේ පියවර: ස්ථීර අවම කිරීමේ සැලසුම් අවසන් කිරීම සඳහා මිණුම් හා සවිස්තරාත්මක භූ තාක්ෂණික විමර්ශන, භූ තාක්ෂණික ගවේෂණ, අදාළ රසායනාගාර පරීක්ෂණ සහ ස්ථායීතා විශ්ලේෂණය යන නායයෑම් ස්ථායීකරණ ක්‍රියාකාරකම් සිදු කරන ලදී.




ශ්‍රී දළදා මාළිගාව ඉදිරිපිට පිහිටි අස්ථායී කැපුම් බෑවුම ප්‍රතිසංස්කරණය කිරීම

දළදා මාලිගාවේ "වලාකුලු බැම්ම" කඩා වැටීමෙන් අනතුරුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නව රැඳවුම් බැම්මක් නිර්මාණය කරන ලදී. එම කැපුම් බෑවුම ඉදිකිරීමේ දී ශ්‍රී විෂ්ණු දේවාලයට සහ දළදා මාලිගාවේ රජවාසල ප්‍රදේශයේ අස්ථාවර තත්ත්වයකට මහ පෑදුණු අතර එය ස්ථායීකරණය සඳහා පාංශු ඇණ ගැසීම මගින් අස්ථායී කැපුම් බෑවුම යථා තත්ත්වයට පත් කිරීම සඳහා කණ්ඩායමක් යොදවන ලදී.




වටවල නායයෑමේ දිශානුගත ගුරුත්වාකර්ෂණ කාණු ප්‍රතිසංස්කරණය කිරීම

වටවල ප්‍රදේශයේ ඇති වූ ප්‍රධාන නායයෑම්වලින් එකක් 1992 වර්ෂයේ දී සිදු වූ අතර එය අවම කිරීමේ කටයුතු 1995 වර්ෂයේ දී අවසන් කරන ලදී. කෙසේ වෙතත්, කාලයාගේ ඇවෑමෙන් මතුපිට හා භූගත ජලාපවහන පද්ධතිය නඩත්තු නොකිරීම හේතුවෙන් නායයෑම් නැවත සක්‍රීය විය. මෙය උඩරට දුම්රිය ප්‍රවාහනයට සම්පූර්ණ බාධාවකට තුඩු දෙන නිසා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය එහි අධි පීඩන හයිඩ්‍රොජෙට් පිරිසිදු කිරීමේ උපකරණ සමඟින් මතුපිට තිරස් කාණු ප්‍රතිසාධනය කරන ලදී. මෙම ප්‍රතිසංස්කරණය නිසා අධික වර්ෂාව තුළ බාධාවකින් තොරව දුම්රිය ප්‍රවාහනයට උපකාරී වනු ඇත.




පරීක්ෂණ සහ උපදේශන සේවා මඟින් වූ ආදායම

නායයෑම් අධ්‍යයන සහ සේවා, භූ තාක්ෂණික ඉංජිනේරු සේවා, ව්‍යාපෘති කළමනාකරණ සේවා, ගොඩනැගිලි ද්‍රව්‍ය, මානව ජනාවාස සැලසුම්කරණය සහ පාරිසරික කළමනාකරණය යන ක්ෂේත්‍රවල තාක්ෂණික, පරීක්ෂණ සහ උපදේශන සේවා සැපයීම පහත සාරාංශගත පරිදි අඛණ්ඩ ව සිදු කරන ලදී.

ක්‍රියාකාරකම/ අංශය	උපදේශන සේවා ගණන	පරීක්ෂණ/විමර්ශන ගණන	ගණනය කරන ලද මුළු ආදායම (රු. මිලියන)
නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය	908	5197	110.43
භූ තාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය	123	98	193.13
පරිසර අධ්‍යයන සහ සේවා අංශය	-	540	47.94
ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ සහ පරීක්ෂණ අංශය	-	1837	31.54
ව්‍යුහාත්මක ඉංජිනේරු පර්යේෂණ සහ ව්‍යාපෘති කළමනාකරණ අංශය	173	-	41.30
මානව ජනාවාස සැලසුම් සහ පුහුණු අංශය	43	-	8.93
RLVMM ව්‍යාපෘතියෙහි උපදේශන සේවා	-	-	62.52
වෙනත් ආදායම්	-	-	90.92
එකතුව			**586.71**

වෙනත් තාක්ෂණික මැදිහත්වීම්

ශ්‍රී ලංකාවේ අවට වාතයේ ගුණාත්මක බව නිරීක්ෂණය



සෞඛ්‍යය, ඵලදායිතාව, ජෛව විවිධත්වය, පරිසර පද්ධති, භෝග නිෂ්පාදනය සහ දේශගුණික විපර්යාස යනාදිය කෙරෙහි එහි බලපෑම සමඟ වාතයේ ගුණාත්මකභාවයේ සහසම්බන්ධතාවය තක්සේරු කිරීමේදී විශ්වාසදායක, පුළුල් සහ අඛණ්ඩ වායු තත්ත්ව අධීක්ෂණ ජාලයක් අත්‍යවශ්‍ය වේ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ශ්‍රී ලංකාව තුළ එවැනි අධීක්ෂණ ජාලයක් සංවර්ධනය කර ඇත්තේ අඩු වියදම් සංවේදක මත පදනම් වූ අධීක්ෂණ ඒකක සහ පාලක අධි තාක්ෂණික අධීක්ෂණ මධ්‍යස්ථාන සමඟ අවට වාතයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම සඳහා ය. ප්‍රධාන නාගරික ප්‍රදේශවල සංවේදක මත පදනම් වූ අධීක්ෂණ මධ්‍යස්ථාන 20 කින් සහ කොළඹ (NBRO විසින් ක්‍රියාත්මක වන), මහනුවර සහ බත්තරමුල්ල (CEA විසින් ක්‍රියාත්මක කරන) ස්වයංක්‍රීය අධීක්ෂණ මධ්‍යස්ථානවලින් වත්මන් ජාලය සමන්විත වේ. ශ්‍රී ලංකාවේ වාතයේ ගුණාත්මකභාවය කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ ක්‍රියාකාරී සැලසුම් සංවර්ධනය කිරීම සඳහා ප්‍රවණතා, සෘතුමය සහ අවකාශීය වෙනස්කම්, බලපෑම් තක්සේරු කිරීම් යනාදිය තක්සේරු කිරීමට මෙම අධීක්ෂණ ජාලය මඟින් රැස් කරන දත්ත විශ්ලේෂණය කෙරේ. එසේම, වෙබ් අඩවි හරහා දත්ත ප්‍රකාශයට පත් කිරීම, මහජනතාව දැනුවත් කිරීම සඳහා ඩිජිටල් පැනල සහ පර්යේෂකයන්ට ඔවුන්ගේ පර්යේෂණ කටයුතු සඳහා නොමිලේ දත්ත ලබා දීම සිදු කෙරේ.

හදිසි වායු දූෂණ මට්ටම් ඉහළ යාමක් හඳුනා ගැනීම සහ එම තත්ත්වයන් තුළ ජන මාධ්‍ය භාවිත කරමින් ඉහළ වායු දූෂණ මට්ටම්වලට නිරාවරණය වීම අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මහජනතාව දැනුවත් කිරීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරයි. දෛනික වායු තත්ත්ව වාර්තා සකස් කර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ ආයතන සමඟ පහසුවෙන් හුවමාරු කරගන්නා ලද අතර තීරණාත්මක අවස්ථාවන්ට මුහුණ දීම සඳහා හදිසි ක්‍රියාකාරී සැලසුම් හඳුනාගෙන සකස් කර ඇත.

නායයෑම් තොරතුරු කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම

දත්තවල සහ වාර්තා ආකෘතිවල අනුකූලතාව පවත්වා ගැනීම සඳහා සහ නායයෑම් විමර්ශනයේ සහ නායයෑම් අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සහ පර්යේෂණ සහ තීරණ ගැනීමේ අරමුණු සඳහා නායයෑම් පිළිබඳ තොරතුරු පහසුවෙන් ප්‍රවේශ කිරීමට පහසුකම් සැලසීම සඳහා, JICA සහාය ඇතිව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ඩිජිටල් නායයෑම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (LIMS) සංවර්ධනය කර ඇත.

නායයෑම් අවම කිරීම සඳහා ජෛව ඉංජිනේරු ශිල්පීය ක්‍රම හඳුන්වා දීම

බෑවුම්වල පස ඵලදායී ලෙස ශක්තිමත් කළ හැකි සහ එමඟින් නායයෑම් ඇතිවීම අවම කළ හැකි සුදුසු වෘක්ෂලතා වර්ග සිටුවීම ප්‍රවර්ධනය කිරීම වැනි ජෛව ඉංජිනේරු ශිල්පීය ක්‍රම හඳුන්වාදීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ආරම්භ කර ඇත. මෙය දැනට භාවිත වන සාම්ප්‍රදායික ව්‍යුහාත්මක පියවරයන්ට වඩා ලාභදායී, තිරසාර සහ දේශගුණයට ඔරොත්තු දෙන පියවරකි.







ඩ්‍රෝන් තාක්ෂණ භාවිතය

ප්‍රමුඛ ත ම පර්යේෂණ සහ සංවර්ධන ආයතනය ලෙස, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන සහ විමර්ශන කටයුතු සඳහා ඩ්‍රෝන තාක්ෂණය භාවිත කරයි. ඩ්‍රෝන් තාක්ෂණය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වැඩි වැඩියෙන් ජනප්‍රිය වී ඇත, එය ආරක්ෂිත, වඩා කාර්යක්ෂම සහ වඩාත් නිවැරදි දත්ත රැස් කිරීමට ඉඩ සලසයි. ඩ්‍රෝන යානාවලට විවිධ සංවේදක සහ කැමරාවලින් සමන්විත විය හැකි අතර ඒවා අධි-විභේදන රූප, වීඩියෝ සහ ගොඩනැගිලි, පාලම් සහ වෙනත් ව්‍යුහයන්ගේ ත්‍රිමාණ ආකෘති ග්‍රහණය කළ හැකිය.

පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රයේ දී, ඩ්‍රෝන යානා විවිධ අරමුණු සඳහා යොදා ගැනේ.

- **වැඩබිම් සමීක්ෂණ:** ඩ්‍රෝන යානා අධි-විභේදන රූප ග්‍රහණය කර ඉදිකිරීම් වැඩබිම්වල ත්‍රිමාණ ආකෘති නිර්මාණය කරයි. ඒවා වැඩබිම් විශ්ලේෂණය සහ සැලසුම් කිරීම සඳහා භාවිත කළ හැකිය.

- **ගොඩනැගිලි පරීක්ෂණ:** ගොඩනැගිලි සහ ව්‍යුහයන් හි හානි, දිරාපත් වීම සහ ඉරි යාම සහ අවධානය අවශ්‍ය විය හැකි වෙනත් ගැටළු සඳහා පරීක්ෂා කිරීමට ඩ්‍රෝන යානා භාවිත කරයි. කම්කරුවන් අවදානමට ලක් නොකර වහලවල්, මුහුණත සහ වෙනත් උස් ස්ථාන වැනි පහසුවෙන් ළඟා විය නොහැකි ප්‍රදේශවලට ඉක්මනින් හා ආරක්ෂිත ව ප්‍රවේශ විය හැකිය.

- **පාරිසරික අධීක්ෂණය:** වාතය සහ ජලයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම, වෘක්ෂලතාවල වෙනස්කම් නිරීක්ෂණය කිරීම සහ අවට පරිසරය මත ඉදිකිරීම්වල බලපෑම තක්සේරු කිරීම සඳහා ඩ්‍රෝන යානා භාවිත කරනු ලැබේ.

- **ව්‍යාපෘති අධීක්ෂණය:** ඉදිකිරීම් ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ නියමිත වේලාවට සහ අයවැය තුළ ව්‍යාපෘති නිම කරන බව සහතික කිරීමට ඩ්‍රෝන භාවිත කෙරේ.

සමස්තයක් වශයෙන්, ඩ්‍රෝන් තාක්ෂණයට ගොඩනැගිලි පර්යේෂණ සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් කිරීමට හැකියාව ඇති අතර දත්ත රැස් කිරීම සහ ව්‍යාපෘති අධීක්ෂණය කිරීම ආරක්ෂිත සහ වඩා කාර්යක්ෂම ක්‍රමයකි.



විදේශීය / දූයක සහයෝගීතාවයෙන් යුත් ව්‍යාපෘති

තාක්ෂණික සහයෝගිතා වැඩසටහන NBRO-JICA

1. නාය යෑම් සහ ඒ ආශ්‍රිත උවදුරු ඵලදායී ලෙස අවම කිරීම සඳහා ව්‍යුහාත්මක සහ ව්‍යුහාත්මක නොවන ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම සහ ඒ ආශ්‍රිත ධාරිතාව ශක්තිමත් කිරීම (JICA) -SABO

"SABO" ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ නායයෑම් අවදානම් කලාප සිතියම්ගත කිරීම (සම්පූර්ණ බලපෑම් කලාප සිතියම්ගත කිරීම) කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකාවේ නායයෑමේ අවදානම අවම කිරීම සඳහා ව්‍යුහාත්මක නොවන ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම සඳහා ධාරිතාව ශක්තිමත් කිරීම ඉලක්ක කරගත් තෙවසරක ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන ලදී. තව ද අවදානම් තක්සේරු කිරීම්, ප්‍රාදේශීය මට්ටමින් නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, පවතින නිරීක්ෂණ පද්ධතිය සහ අනතුරු ඇඟවීම් වැඩි දියුණු කිරීම සහ නායයෑම් ආපදා පිළිබඳ අවදානම් තක්සේරු කිරීම් ඉඩම් පරිහරණ සැලසුම් සහ සංවර්ධන ප්‍රමිතීන් යෙදීම ද එම ව්‍යාපෘතිය යටතේ ආවරණය කෙරේ. දේශීය නායයෑම් ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම (LSDRRP) පහත දැක්වෙන පුළුල් අරමුණුවලින් සමන්විත වේ.

- පැරණි නායයෑම් නිම්නවල නායයෑමේ අවදානම අඩු කිරීම
- ව්‍යුහාත්මක නොවන නායයෑම් DRR පියවර හඳුන්වා දීම
- නායයෑමේ අවදානමට ලක්විය හැකි ඉඩම් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම
- හානිය ශූන්‍ය කිරීම සහ නායයෑම් නිසා සිදුවන ජීවිත හානි අවම කිරීම
- ආර්ථික හානිය අවම කිරීම

1.1 උපද්‍රව විශ්ලේෂණය සහ අවදානම් තක්සේරුව

නායයෑම් උපද්‍රව කලාප සිතියම්ගත කිරීම සහ අවදානම් තක්සේරුව පිළිබඳ පවතින ක්‍රමවේදය සමාලෝචනය කිරීම, රතු කලාප සහ කහ කලාප සංකල්පය භාවිත කරමින් නියමු ස්ථාන තුන සඳහා අඩවි විශේෂිත උපද්‍රව සිතියම් සකස් කිරීම; නියමු ස්ථාන තුනක් සඳහා Hyper KANAKO ආකෘතිය භාවිත කරමින් නායයෑම් ප්‍රවාහ මාර්ග අනුකරණය කිරීම සහ නියමු ස්ථාන හැර අනෙකුත් ප්‍රදේශවල අඩවි-විශේෂිත උපද්‍රව සිතියම්ගත කිරීම සිදු කරන ලදී. (නියමු ස්ථානය - මාතර දිස්ත්‍රික්කයේ මොරවකකන්ද, බදුල්ල දිස්ත්‍රික්කයේ වීරියපුර සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ උඩපොත) නායයෑම් අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා මාර්ගගත නායයෑම් තොරතුරු කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කරන ලදී.



රූපය 1. SABO ව්‍යාපෘතියේ නියමු ස්ථාන තුනක කහ කලාපය සහ රතු කලාප සිතියම

1.2 නායයෑම් ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය

පසෙහි සමුච්චිත වර්ෂා ජල ප්‍රමාණය ගණනය කිරීමට උපකාර වන TANK ආකෘතිය සමඟ පාංශු ජල දර්ශක ක්‍රමය එකතු කරමින් නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් සහ වර්ෂාපතනය නිරීක්ෂණයන් හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කරන ලදී. උඩපොත සහ වීරියපුර ප්‍රදේශවල ස්ථාපිත කර ඇති විශේෂිත පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය නායයෑම් සිදු වූ ස්ථානවල පාංශු ස්කන්ධයේ විරූපණය සෘජුව නිරීක්ෂණය කිරීම ඇතුළත් වන අතර, නිරීක්ෂිත පාංශු ස්කන්ධ චලනය මත පදනම් ව අනතුරු ඇඟවීම් නිකුත් කරයි. එබැවින්, එක් එක් නිරීක්ෂණ අයිතමවල අනතුරු ඇඟවීමේ සීමාවන් විස්ථාපනය, වික්‍රියාව, ආනතිය යනාදී අඩවි-විශේෂිත පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය සඳහා තීරණය කළ යුතුය.



පූර්ව අනතුරු ඇඟවීම **(NBRO EW App)** සහ වර්ෂාපතන දත්ත දෘශ්‍යකරණය

1.3 ඉඩම් පරිහරණ සැලසුම් සහ සංවර්ධන ප්‍රමිතීන්

නායයෑමේ අවදානම් සහිත ප්‍රජාවන් සඳහා අදාළ කර ගැනීම පිණිස ප්‍රධාන ප්‍රතිඵලයක් ලෙස "ආපදා ප්‍රත්‍යාස්ථිතික ඉඩම් පරිහරණ නියාමනය / සංවර්ධන ප්‍රමිති සඳහා මාර්ගෝපදේශ" සකස් කරන ලදී.

මධ්‍යම රජයේ පළාත් පාලන ආයතනවල ඉඩම් පරිහරණ සැලසුම් සහ සංවර්ධන පාලනය පිළිබඳ වෘත්තීයවේදීන් මෙම මාර්ගෝපදේශය භාවිත කරනු ඇත. පළාත් පාලන ආයතන (LA), නාගරික සංවර්ධන අධිකාරිය (UDA), ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPPD), ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව (LUPPD) සහ NBRO හි නිලධාරීන් ජාතික සහ පළාත් පාලන මට්ටමේ ඉලක්කගත පරිශීලකයන් වේ.

මෙම ව්‍යාපෘතිය සාර්ථක ව නිම කරන ලද අතර 2022 සම්මන්ත්‍රණයේ දී ව්‍යාපෘති අත්පොත් දියත් කරන ලදී.

2. ශ්‍රී ලංකාව තුළ වර්ෂාව නිසා ප්‍රේරිත වේගවත් හා දිගුදුර නායයෑම් පිළිබඳ අනතුරු හැඟවීම් තාක්ෂණය සංවර්ධනය කිරීම - SATREPS (JICA)

ජාත්‍යන්තර නායයෑම් සම්මේලනය (ICL) සමඟ ජා. ගොා. ප. සංවිධානය ඒකාබද්ධ ව තිරසාර සංවර්ධනය සඳහා විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ සහයෝගිතාවය (SATREPS) යටතේ ජපාන විද්‍යා හා තාක්ෂණික ආයතනය (JST) හා සමගාමී ව 'වැසි ප්‍රේරිත වේගවත් දිගුදුර නායයෑම් පිළිබඳ ආපදා අවදානම අවම කිරීම' නමින් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම පස් අවුරුදු ජපන් ශ්‍රී ලංකා ඒකාබද්ධ ව්‍යාපෘතිය 2019 – 2023 කාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය හිමි විය. මෙම යෝජනා මගින් වැසි ප්‍රේරිත වේගවත් සහ දිගුදුර නායයෑම් ආපදා අවදානම අවමකිරීම සඳහා 2015 – 2025 ගෝලීය සෙන්ඩායි සහයෝගීතාවයේ පාර්ශවකරුවන් හරහා උසස් තාක්ෂණය හඳුන්වා දීමට යෝජනා කරයි. මෙම ව්‍යාපෘති කටයුතු සඳහා දේශීය සහ ජපන් සහයෝගිතා හා උපකාරක කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

පහත සඳහන් ප්‍රතිඵලවලට අදාළ කටයුතු ආරම්භ කර ඇත.

- අධික වර්ෂාපතනය සහ එහි ප්‍රථිඵලයක් ලෙස භූගත ජල පීඩනය වැඩිවීම පිළිබඳ පැය 24 කට පෙරාතු ව පුරෝකථනය කිරීමේ තාක්ෂණය සංවර්ධනය කිරීම. වර්ෂාව නිසා ප්‍රේරිත නායයෑම් ස්ථාන සහ ඒවායේ චලනයවන කලාප හඳුනා ගැනීම සහ සංවර්ධනය කිරීම.
- කඳුකර සහ ප්‍රාදේශීය නගර ආශ්‍රිත ව ජීවත්වන ප්‍රජාවන් හි ජනතාව වෙත ඵලදායී අවදානම් සන්නිවේදන තාක්ෂණික රාමුවක් හා තාක්ෂණය සංවර්ධනය කිරීම
- නියමු අධ්‍යයන අඩවි තුළ ඒකාබද්ධ පර්යේෂණ පදනම් කරගනිමින් වැසි මඟින් ප්‍රේරණයවන දිගු දුර නායයෑම් පිළිබඳ අනතුරු ඇඟවීමේ පද්ධතියක් සංවර්ධනය කර ඇති අතර ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල භාවිතය සඳහා මාර්ගෝපදේශ සහ අත්පොතක් සහිත සංවර්ධිත පද්ධතියක් ඉදිරිපත් කිරීම.
- දියුණු කරන ලද ඉහත තාක්ෂණයන් නායයෑම් සහ ඒ ආශ්‍රිත උවදුරුවලින් අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් හා ජනතාවගේ ආරක්ෂාව සුරක්ෂිතභාවය සහතික කරනු ඇත.

ව්‍යාපෘති කාර්යාලයක් ටෝකියෝ හි පිහිටුවා ඇති අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ විද්‍යාඥයින් පස් දෙනෙකු ආචාර්ය උපාධිය (දර්ශනපති P.hD.) සහ විද්‍යාපති (M.Sc.) උපාධි සඳහා ධාරිතා සංවර්ධනය යටතේ ජපානයේ විශ්ව විද්‍යාලවල හදාරමින් සිටී. භූ තාක්ෂණික ඉංජිනේරු අංශ විද්‍යාගාරයේ ධාරිතා වර්ධනය සඳහා Undrain Ring Shear උපකරණය ඇතුළු අති නවීන උපකරණ ද ලබා දී ඇත.



ස්ථායීකරණ ක්‍රමවේදයන් මඟින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)

''ස්ථායීකරණ ක්‍රමවේදයන් මඟින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය'' (RLVMMP) අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබූ ඒකාබද්ධ නායයෑම් අවම කිරීමේ වැඩසටහන යටතේ ජා. ගො. ප. සංවිධානය විසින් ආරම්භ කරන ලදී. පුරා වසර 5 ක් ක්‍රියාත්මක මෙම මහාපරිමාණ ව්‍යාපෘතිය සඳහා හඳුනාගත් අධි අවදානම් ස්ථාන මෙන් ම මාර්ග ආශ්‍රිත අස්ථායී බෑවුම් හා උඩරට දුම්රිය මාර්ගය ආසන්න අස්ථාවර බෑවුම් ආශ්‍රිත අවම කිරීමේ කටයුතු ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන සංරචකයන් වන්නේ,

- සිවිල් වැඩ සහ ඒ ආශ්‍රිත සැලසුම් සහ ඉදිකිරීම් අධීක්ෂණ/කළමනාකරණ
- ප්‍රතිපත්ති සහ නියාමනය වැඩිදියුණු කිරීම
- ආයතනික ධාරිතාව ගොඩනැගීම
- තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය

මෙම මෙගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) අරමුදල් සපයයි. 2022 ජූනි මාසයේ දී සංශෝධිත ව්‍යාපෘති මූල්‍යකරණය යටතේ ඇ. ඒ. ජ ඩොලර් මිලියන 110 සිට ඇ. ඒ. ජ ඩොලර් මිලියන 101.3 දක්වා සංශෝධනය විය.

පළාත	දිස්ත්‍රික්කය	අඩවි ගණන
බස්නාහිර පළාත	කොළඹ	1
	ගම්පහ	1
	කළුතර	20
මධ්‍යම පළාත	මහනුවර	16
	මාතලේ	10
	නුවරඑළිය	7
දකුණු පළාත	ගාල්ල	2
	මාතර	6
වයඹ පළාත	කුරුණෑගල	4
ඌව පළාත	බදුල්ල	18
සබරගමුව පළාත	රත්නපුර	26
	කෑගල්ල	16
එකතුව		**127**



තීරණාත්මක නායයෑම් ස්ථාන 24 අතුළත් පළමු අදියරේ සියලුම පැකේජ සහ දෙවන අදියරේ පැකේජ හත (07) (නායයෑම් ස්ථාන 33) සඳහා සිවිල් වැඩ කොන්ත්‍රාත්තු දැනට ප්‍රදානය කර ඇත. ඉතිරි නාය අවදානම් ස්ථාන 70 හි සිවිල් වැඩ කොන්ත්‍රාත්තු සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

පළමු අදියරෙහි පළමු සංරචකයේ ප්‍රගතිය			
පැකේජය	**ස්ථාන ගනන**	**දිස්ත්‍රික්ක**	**තත්වය**
01වන **පැකේජය**	04	රත්නපුර	100% සම්පූර්ණ කර ඇත, දෝෂ වගකීම් කාලය ක්‍රියාත්මක වෙමින් පවතී
02වන **පැකේජය**	07	රත්නපුර, කළුතර	
03වන **පැකේජය**	02	මාතර	
04වන පැකේජය A, B, C	11	කෑගල්ල, කුරුණෑගල, මහනුවර, ගම්පහ, කොළඹ	ඉදිකිරීම් ආරම්භ කර ඇත - 04A 39%, 04B 79%, 04C 59%

දෙවන අදියරෙහි පළමු සංරචකයේ ප්‍රගතිය			
පැකේජය	**ස්ථාන ගනන**	**දිස්ත්‍රික්ක**	**තත්වය**
09වන පැකේජය	01	නුවරඑළිය	ඉදිකිරීම් ආරම්භ කර ඇත 17%
07වන පැකේජය (Lot 1-6)	32	රත්නපුර, කළුතර, ගාල්ල, මාතර	ප්‍රදානය කර ඇත. ස්ථාන භාරගැනීම සිදුකෙරේ.
05වන පැකේජය (A-E)	25	මහනුවර, මාතලේ, කෑගල්ල, කුරුණෑගල	05B ලංසු ඇගයීම ආරම්භ කර ඇත. අනෙකුත් ස්ථාන සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත
06වන පැකේජය (A-F)	23	නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල, මාතර, ගාල්ල	ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත
08වන පැකේජය	22	දුම්රිය මාර්ගය (රඹුක්කන සිට බදුල්ල)	



නායයෑම් අවම කිරීමේ ස්ථාන රත්නපුර දුරේකන්ද (වමේ), මාතර පිටබැද්දර, (මැද) සහ රත්නපුර අයගම, (දකුණ)

MOBILISE 3.0: ප්‍රත්‍යාස්ථික ප්‍රජාවන් ගොඩනැගීම සඳහා ඩිජිටල් මෙවලම් කට්ටලය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය එක්සත් රාජධානියේ සැල්ෆෝර්ඩ් විශ්ව විද්‍යාලයේ THINKlab සමඟ එක්ව ආපදා අවදානම් අවම කිරීමේ (DRR) ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලංකාවේ තාක්ෂණික හැකියාවන් ඉහළ නැංවීමට කටයුතු කරයි. මෙම සහයෝගීතාවයේ කොටසක් ලෙස කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුග්‍රහය ඇතිව " MOBILISE 3.0 : ප්‍රත්‍යාස්ථික ප්‍රජාවන් ගොඩනැගීම සඳහා ඩිජිටල් මෙවලම් කට්ටලය" නමින් පර්යේෂණ ව්‍යාපෘතියක් කළුතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කෙරේ. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ දේශීය හවුල්කාරිත්ව සහයෝගිතා සම්බන්ධ කර ගනිමින්, ප්‍රත්‍යාස්ථිතික ප්‍රජාවන් නිර්මාණය කිරීම සඳහා වර්තමාන භාවිතයන් හා දත්ත මත පදනම් වූ තීරණ ගැනීමේ ප්‍රවේශයක් බවට පරිවර්තනය කිරීම සඳහා නව්‍ය අදහස් සහ විසඳුම් භාවිත කිරීමයි. මෙම දේශීය පරිවර්තනය කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ

ස්ථාපිත සජීව විද්‍යාගාරයක් (Living Lab) හරහා විමර්ශනය කෙරේ. "මේස" යනු ප්‍රජා ප්‍රත්‍යාස්ථිරීය ගොඩනැගීම සඳහා "සමස්ත සමාජය" ප්‍රවේශයක් ස්ථාපිත කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවතින බහු-අවදානම් දේශීය අවදානම් සන්නිවේදන ජංගම යෙදුමකි. සමස්තයක් වශයෙන්, මෙම ව්‍යාපෘතිය දේශීය ප්‍රජාව සහ තීරණ ගන්නන් දැනුවත් තීරණ ගැනීමට අවශ්‍ය මෙවලම් සහ දැනුමෙන් සවිබල ගැන්වීම සහ ස්වභාවික උවදුරුවලට සහ දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩි කිරීමට ක්‍රියා කරයි.



ලෝක ආහාර වැඩසටහනේ සහාය ලැබූ ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතිය– 2021/2022

ලෝක ආහාර වැඩසටහනේ ආධාර යටතේ ආපදා අවදානම් අවම කිරීමේ පිළිවෙත් පිළිබඳ ව මහජනතාව දැනුවත් කිරීම සහ ස්වභාවික විපත් සමඟ ඵලදායී ලෙස කටයුතු කිරීමට හැකිවන පරිදි මාර්ග දෙපස පුවරු සවිකිරීමේ වැඩසටහනක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ආරම්භ කරන ලදී. ඒ අනුව කඳුකර ප්‍රදේශවල ප්‍රධාන මාර්ග 4ක ස්ථාන 4ක ජනතාව දැනුවත් කිරීමේ දැන්වීම් ඇතුළත් මාර්ග පුවරු හතරක් පහත පරිදි සවිකර ඇත.



10. ජා. ගො. ප. සංවිධානයේ ප්‍රකාශන

1. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 12 වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ සම්මන්ත්‍රණ වාර්තාව



ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ වාර්තාව වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ දී ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා සහ ශාස්ත්‍රීය අධ්‍යයන එකතුවකි. මෙම වාර්තාව ගොඩනැගිලි සහ නිවාස ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නවතම පර්යේෂණ සහ සංවර්ධනයන් ප්‍රදර්ශනය කරන අතර ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව, ද්‍රව්‍ය විද්‍යාව, ගොඩනැගිලි ක්ෂේත්‍ර සහ ප්‍රමිතීන් සහ ස්වභාවික උපද්‍රව සහ ආපදා අවදානම් කළමනාකරණය වැනි පුළුල් පරාසයක මාතෘකා ආවරණය කරයි. මෙම සම්මන්ත්‍රණ වාර්තාවට යට කී ක්ෂේත්‍රවල නවතම පර්යේෂණ සහ සංවර්ධනයන් ඉදිරිපත් කරන පර්යේෂණ පත්‍රිකා 36 කින් සමන්විත වේ.

2. ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම ක්‍රමානුකූලව තක්සේරු කිරීම පිළිබඳ අත්පොත



ලෝකයේ බොහෝ කාර්මික රටවල පවා සාපේක්ෂ වශයෙන් රසායනික විපත් තවමත් නිතර සිදු වේ. ශ්‍රී ලංකාවේ ද රසායනික ආශ්‍රිත කර්මාන්තවල ශීඝ්‍ර දියුණුව හේතුවෙන් පසුගිය වසර කිහිපය තුළ රසායනික අනතුරුවල වාර ගණන සහ බරපතලකම ද ඉහළ ගොස් ඇත. විපතට පත්වන ප්‍රජාවන් ආරක්ෂා කිරීම සඳහා රසායනික ව්‍යසනවල අවදානම් සහ බලපෑම් ක්‍රමානුකූලව තක්සේරු කිරීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවයකි. මෙම අවශ්‍යතාවය අවබෝධ කරගත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් පසුගිය වසර දෙක තුළ ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම පිළිබඳ ක්‍රමානුකූල තක්සේරුවක් සංවර්ධනය කිරීම පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලද අතර ව්‍යාපෘතියේ ප්‍රධාන අංගයක් ලෙස "ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම් ක්‍රමානුකූල ව තක්සේරු කිරීමේ අත්පොත" පිළියෙල කරනලදි.

මාර්ගෝපදේශය ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම් ක්‍රමානුකූල ව තක්සේරු කිරීම සඳහා පියවරෙන් පියවර තාක්ෂණික දැනුම සපයන ලේඛනයකි. ප්‍රමාණය සහ ස්ථානය නොසලකා රට පුරා රසායනික ආපදා අවදානම් තක්සේරු කිරීම් සිදු කිරීම සඳහා අත්පොත රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවලට භාවිත කළ හැකිය.

3. SABO ව්‍යාපෘති අත්පොත් එළිදැක්වීම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) සමඟ එක්ව TCLMP-I නමින් ව්‍යාපෘතියක් 2013-2018 කාලය තුළ ක්‍රියාත්මක කරන ලදී. (නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහයෝගිතාව). TCLMP-I ව්‍යාපෘතියේ දී මාතලේ, නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කවලින් තෝරාගත් නියමු ස්ථානවල විවිධ ව්‍යුහාත්මක අවම කිරීමේ ක්‍රමවේද ක්‍රියාවට නංවා ඇති අතර තාක්ෂණික දැනුම හුවමාරු කර ගැනීම මඟින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙ හි ව්‍යුහාත්මක අවම කිරීමේ හැකියාව වැඩි දියුණු කරන ලදී. TCLMP I සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමෙන් පසුව, ශ්‍රී ලංකාවේ නායයෑම් අවදානම අවම කිරීම සඳහා ව්‍යුහාත්මක නොවන ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම සඳහා ධාරිතාව ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ TCLMP-II (ව්‍යාපෘතිය "SABO" ලෙසද හැඳින්වේ) ක්‍රියාත්මක කිරීමට සංවිධානය ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත තවදුරටත් සහාය ලබා දෙන ලදි.

ව්‍යුහාත්මක නොවන ක්‍රියාමාර්ග යනු, භෞතික ඉදිකිරීම් සම්බන්ධ නොවන විශේෂයෙන් ම ප්‍රතිපත්ති සහ නීති, මහජනතාව දැනුවත් කිරීම, පුහුණුව සහ අධ්‍යාපනය හරහා ආපදා අවදානම් සහ බලපෑම් අවම කිරීම සඳහා දැනුම, භාවිතය හෝ එකඟතාව භාවිත කරන පියවරයන් වේ.

ව්‍යාපෘතිය 2022 දී සාර්ථකව නිම කර ඇති අතර, ව්‍යාපෘතිය මඟින් ප්‍රකාශන ගණනාවක් ඉදිරිපත් කරන ලදී. මෙම සියලුම ලේඛන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වෙබ් අඩවිය හරහා නොමිලේ බාගත හැකිය. (www.nbro.gov.lk.)

1. ආපදාවලට ප්‍රත්‍යාස්ථතික ඉඩම් පරිහරණ සැලසුම් මාර්ගෝපදේශය
2. පළාත් පාලන ආයතන තුනක් සඳහා ආපදා ප්‍රත්‍යාස්ථිතික අධ්‍යයන වාර්තා
3. ආපදා ප්‍රත්‍යාස්ථිතික ඉඩම් පරිහරණ රෙගුලාසි/ සංවර්ධන ප්‍රමිති සඳහා මාර්ගෝපදේශ











4. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල වායු තත්ත්ව වාර්තාව 2022



වායු දූෂණය ලොව පුරා සිදුවන මරණ අතරින් 5 වන ප්‍රධාන අවදානම් සාධකය ලෙස සැලකේ. ශ්‍රී ලංකාවේ 90% කට වැඩි ජනගහනයක් ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ අගය ඉක්මවා PM2.5 මට්ටමට නිරාවරණය වී ඇති බැවින් ශ්‍රී ලංකාවේ මෙම තත්ත්වය වඩාත් සැලකිය යුතු තත්වයකි. 2021 වසරේ වායු තත්ත්ව අධීක්ෂණ දත්තවලට අනුව, ශ්‍රී ලංකාවේ ඇතැම් නාගරික ප්‍රදේශවල දීර්ඝ කාලීන පරිසර දූෂණ මට්ටම් PM2.5 සහ PM10 යන දෙකටම සාපේක්ෂ ව භයානක ලෙස ඉහළ මට්ටමක පවතින අතර සෑම නාගරික ප්‍රදේශයක ම පාහේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වාර්ෂික මාර්ගෝපදේශ මට්ටම් ඉක්මවා ඇත. සීමා මායිම් වායු දූෂණයේ දායකත්වය හේතුවෙන් සෑම වසරක ම නොවැම්බර් සිට මාර්තු දක්වා කාලය තුළ බොහෝ නාගරික ප්‍රදේශවල දූෂක මට්ටම් සැලකිය යුතු වන අතර පැය 24 ක සාමාන්‍ය සම්මත මට්ටම් පවා ඉක්මවිය හැක.

2022 එබැවින් ශ්‍රී ලංකාවේ මානව ක්‍රියාකාරකම් මඟින් සිදුවන ආපදා කළමනාකරණය කිරීමේ දී නොවැම්බර් - මාර්තු කාලසීමාව තුළ අත්විඳින වායු දූෂණ අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම සඳහා දිවයින පුරා තත්‍ය කාලීන වායු තත්ත්ව නිරීක්ෂණ ජාලයක් තිබීම රටට ඉතා වැදගත් වේ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන යටතේ ද එවැනි ජාලයක් සංවර්ධනය කර ඇති අතර එහි අවසන් වාර්තාව "ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල වායු තත්ත්ව වාර්තාව 2022 ලෙස ඉදිරිපත් කර ඇත.

5. අවම කළ නායයෑම් ස්ථාන පිළිබඳ දත්ත ගබඩාව නිරූපණය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 2008 වසරේ සිට ශ්‍රී ලංකාවේ නායයෑම් අවම කිරීම සඳහා විවිධ ව්‍යුහාත්මක ක්‍රමවේද ක්‍රියාත්මක කරයි. මෙම පියවර සැලසුම් කර ඇත්තේ බෑවුම් ස්ථාවර කිරීමට සහ නායයෑම් ඇතිවීම වැළැක්වීමට වන අතර ඒවා ඉංජිනේරුමය දැනුම සහ පර්යේෂණ මත පදනම් වේ. අවදානමට ලක්විය හැකි ස්ථාන 125කට වැඩි ප්‍රමාණයක් දැනට අවම කර ඇති අතර නුදුරු අනාගතයේ දී ස්ථාන 120ක් පමණ අවදානම අවම කිරීමට නියමිතය. මෙම පියවර මඟින් මහාමාර්ග, පාසල්, රෝහල්, පරිපාලන ගොඩනැගිලි සහ යටිතල පහසුකම් වැනි තීරණාත්මක ස්ථාන බෑවුම් කඩා වැටීම් සහ නායයෑම්වලින් ආරක්ෂා කරයි.

අවසන් කරන ලද නාය අවදානම අවම කිරීමේ ස්ථාන පිළිබඳ අවකාශීය ස්ථාන සහ අදාළ තොරතුරු ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් එහි නායයෑම් අවදානම් තොරතුරු ද්වාරයෙහි ඇතුළත් කර ඇත. මෙම වේදිකාව මඟින් තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීම සහ නායයෑම් උවදුරට

යටත් ස්ථාන පිළිබඳ තොරතුරු විද්‍යාත්මක ප්‍රජාවන් සහ බලධාරීන් අතර තීරණ ගැනීම සඳහා බෙදා හැරීමට අදහස් කරයි.

6. ප්‍රතිනිර්මාණ ශිල්පීය මාර්ගෝපදේශය ප්‍රකාශයට පත් කිරීම



ශ්‍රී ලංකාවේ උස් නොවූ නේවාසික ගොඩනැගිලි සඳහා මූලික ප්‍රතිනිර්මාණ ශිල්පීය ක්‍රම භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම මාර්ගෝපදේශය සකස් කර ඇත. මාර්ගෝපදේශයේ පරමාර්ථය වන්නේ මූලික ඉංජිනේරු භාවිතයන් මඟින් ප්‍රායෝගික ව අදාළ වන ප්‍රතිනිර්මාණ විධි මාලාවක් සංවර්ධනය කිරීමයි. තවද, එය ප්‍රජාවන් අතර ඔවුන්ගේම පවතින ජීවනෝපායන් ප්‍රතිසංස්කරණය කිරීමට සහ ව්‍යුහාත්මක ගැටළු මහඟරවා ගැනීමට සහ ප්‍රත්‍යාස්ථ හැකියාවන් වැඩි දියුණු කිරීමට උත්සාහ කරයි. මෙම මාර්ගෝපදේශයේ පළමු සංස්කරණය ලෙස, උස් නොවූ ගොඩනැගිලිවල සාමාන්‍ය ප්‍රතිනිර්මාණ ශිල්පීය ක්‍රම, පෙදරේරුමය අංග ප්‍රතිනිර්මාණය කිරීම, R/C අංග ප්‍රතිනිර්මාණය කිරීම, නිමාව ප්‍රතිනිර්මාණය කිරීම සහ ගොඩනැගිලි සේවා ප්‍රතිනිර්මාණය කිරීම මෙමඟින් ආවරණය කෙරේ.

7. නිවාස ආරක්ෂණ මාර්ගෝපදේශය ප්‍රකාශයට පත් කිරීම



මෙම අත්පොත නිවස තුළ සහ අවට ඇති විවිධ අවදානම් සහ උපද්‍රවයන් සහ ඒවාට නිවැරදි ව මුහුණ දෙන්නේ කෙසේ ද යන්න පෙන්වීමට ය. මෙම අත්පොත ප්‍රවේශමෙන් කියවීමට යම් කාලයක් හා වෑයමක් ගත යුතු නමුත් එය නිවෙස්වල සිටින සැමට ප්‍රයෝජනවත් තොරතුරු සපයයි. තව ද සිදුවිය හැකි අනතුරු සමඟ කටයුතු කිරීමට උපකාරී වන අතර නිසි පූර්වාරක්ෂාව ගැනීමට ඔබව දිරිමත් කරනු ඇත.

8. නායයෑම් අවදානම් කළමනාකරණය පිළිබඳ සමාජ මාධ්‍ය (ෆේස්බුක්, යූ ටියුබ්, ට්විටර් යනාදිය) හරහා නායයෑම් පිළිබඳ දැනුවත් කිරීම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් Facebook, Twitter සහ WhatsApp වැනි සමාජ මාධ්‍ය හරහා 2022 මෝසම් කාල ඉලක්ක කර ගනිමින් ආපදා පෙර සූදානම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් දියත් කරන ලදී.









9. ඉලෙක්ට්‍රොනික පුවත්ලිපි

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් 2022 වර්ෂයේදී විද්‍යුත් පුවත් පත්‍රිකා දෙකක් ප්‍රකාශයට පත් කරන ලදී.





11. පුහුණු, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් යටතේ 2022 වර්ෂයේදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

1. "නිවාස වටිනාකම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය (VAM) නියමු කිරීම" පිළිබඳ වැඩමුළුව

අගය තක්සේරු කිරීමේ ක්‍රමය (VAM) යනු ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද ප්‍රධාන මෙවලම්වලින් එකක්වන අතර එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) සහ ව්‍යාපෘති සේවා සඳහා එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNOPS) සහ SDG 12 සඳහා One Planet Multi-Partner Trust Fund මගින් අරමුදල් සපයනු ලැබේ. VAM හි අරමුණ වන්නේ සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය තුළ නිවාස ව්‍යාපෘතිවල තිරසාර බව තක්සේරු කිරීමයි.

වටිනාකම් තක්සේරු ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවේ නිවාස ව්‍යාපෘතියක් නියමු කිරීම සඳහා පහත මාතෘකා යටතේ සැලකේ

1. සන්දර්භය, පාලනය සහ රෙගුලාසි
2. නිවාස සහ නාගරික සැලසුම්
3. සම්පත් සහ හුවමාරුව
4. පාරිසරික බලපෑම සහ ඔරොත්තු දීමේ හැකියාව

ඒ අනුව, නායයෑම් අවදානම් ප්‍රදේශවල ජීවත්වන බවට හඳුනාගෙන ඇති පවුල් නැවත පදිංචි කිරීම සඳහා 2017 වසරේ ආරම්භ කරන ලද තාක්ෂණික ආධාර සහිත නිවාස ව්‍යාපෘතියේ වටිනාකම තක්සේරු කිරීමේ ක්‍රමවේදය නියමු කිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය UN-Habitat සමඟ සුසංයෝගී ව කටයුතු කරන ලදී.





2. මෘදුකාංග පැකේජය භාවිතයෙන් වායු විසරණ ආකෘති නිර්මාණය පිළිබඳ පුහුණු වැඩසටහන



ලක්විජය බලාගාරයේ නියෝජ්‍ය බලාගාර කළමනාකරුගේ ඉල්ලීම පරිදි 2022 දෙසැම්බර් 15 සහ 16 යන දෙදින තුළ ලංවිම කාර්ය මණ්ඩල සාමාජිකයින් හතර දෙනෙකු සඳහා “AERMOD View” මෘදුකාංග පැකේජය භාවිතයෙන් වායු විසරණ ආකෘති නිර්මාණය සඳහා දින දෙකක පුහුණු වැඩසටහනක් සාර්ථක ව පවත්වන ලදී.

3. ශ්‍රී ලංකාවේ කාර්මික විමෝචන අධීක්ෂණය, කළමනාකරණය සහ අනුකූලතාව පිළිබඳ වෙබ් සාකච්ඡාව



ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය විසින් "ශ්‍රී ලංකාවේ කාර්මික විමෝචන අධීක්ෂණය, කළමනාකරණය සහ අනුකූලතාව පිළිබඳ වෙබ් සාකච්ඡාවක්" පවත්වන ලදී. මෙම සාකච්ඡාව ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුමක් සහ පළපුරුද්දක් ඇති දක්ෂ සම්පත්දායකයින් දෙදෙනකුගෙන් යුත් මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සැසි දෙකකින් සමන්විත විය. විශේෂයෙන් ම කර්මාන්ත ආශ්‍රිත පාරිසරික අධීක්ෂණ කටයුතුවල නියැලී සිටින රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ කණ්ඩායම් මෙය ඔවුන්ගේ අත්‍යවශ්‍ය නිපුණතා ඉහළ නැංවීමට ලැබූ අවස්ථාවක් ලෙස සලකන ලදි.

4. "ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිතීන් සහ ජල දූෂණය කළමනාකරණය පිළිබඳ රෙගුලාසි" පිළිබඳ පුහුණු වැඩසටහන



කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා අංශයේ සිදු කෙරෙන ප්‍රධාන තාක්ෂණික විෂයයන් පිළිබඳ ඔවුන්ගේ දැනුම හා කුසලතා තවදුරටත් වර්ධනය කරනු පිණිස පරිසර අධ්‍යයන හා සේවා අංශය පුහුණු වැඩසටහන් මාලාවක් ආරම්භ කරණ ලදි. ඒ යටතේ, පාරිසරික අධ්‍යයන හා සේවා අංශය 2022 ජුනි 27 වැනි දින "ජල තත්ත්ව පිළිබඳ ප්‍රමිතීන් සහ ජල දූෂණය කළමනාකරණය පිළිබඳ රෙගුලාසි" පිළිබඳ පුහුණු වැඩසටහනක් සාර්ථක ව නිම කරන ලදී. පරිසර අධ්‍යයන හා සේවා අංශයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ මදාරා දිසානායක මහත්මිය පුහුණු වැඩසටහනේ සම්පත්දායකයා විය.

5. "වායු තත්ත්ව අධීක්ෂණ රෙගුලාසි සහ ශිල්පීය ක්‍රම" පිළිබඳ පුහුණු වැඩසටහන



පරිසර අධ්‍යයන හා සේවා අංශය විසින් "වායු තත්ත්ව අධීක්ෂණ රෙගුලාසි සහ ශිල්පීය ක්‍රම" පිළිබඳ පුහුණු වැඩසටහනක් 2022 ජූලි 25 වැනි දින පරිසර අධ්‍යයන හා සේවා අංශයේ අධ්‍යක්ෂ, එච්.ඩී.එස් ප්‍රේමසිරි මහතා විසින් පවත්වන ලදී. ISO 17025 QMS පද්ධතියේ පුහුණු අවශ්‍යතා අනුව සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් මාලාවක දෙවන පුහුණු වැඩසටහනක් ලෙස මෙය පැවැත්විණ.

12. විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

2022 වසර සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

2022 දෙසැම්බර් 31 දිනට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (NBRO) විගණන සහ කළමනාකරණ කමිටුවේ (AMC) සංයුතිය පහත පරිදි වේ.

අනු අංකය	නම, තනතුර සහ ආයතනය	කමිටුවේ දරණ තනතුර
01	එම්. සී. එන්. බාලසූරිය මහත්මිය, අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව	සභාපතිනිය
02	ඒ. කේ. කරුණානායක මහතා, අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව	සාමාජික
03	එච්. යූ. ආර්. ෆොන්සේකා මයා, ප්‍රධාන ගණකාධිකාරී, ආපදා කළමනාකරණ අංශය, ආරක්ෂක අමාත්‍යාංශය	සාමාජික
04	ජේ. ඒ. ඩබ්. කේ. ජයකොඩි මහත්මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ආපදා කළමානාකරණ අංශය, ආරක්ෂක අමාත්‍යාංශය	නිරීක්ෂක
05	එල්. බී. ජී. සඳමාලි මහත්මිය, වැ. බ. විගණන අධිකාරී. ජාතික විගණන කාර්යාලය	නිරීක්ෂක

ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද විගණන විමසුම් පිළිබඳ ජා. ගො. ප. සංවිධානයෙහි අභ්‍යන්තර විගණන ඒකකයේ (IAU) නිරීක්ෂණ විගණන සහ කළමනාකරණ කමිටුවේ රැස්වීම්වලදී සාකච්ඡා කරන ලදී. විශේෂයෙන් ම, සංවිධානයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් 2022 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම තවදුරටත් සමාලෝචනය කරන ලද අතර සංවිධානයේ මෙහෙයුම්, පාලනය සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කරන ලදී. විගණන සහ කළමනාකරණ කමිටුව විසින් මෙම විගණන නිරීක්ෂණ වැඩිදියුණු කිරීම සහ නිවැරදි කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කළමනාකරණයට මග පෙන්වීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටුව මූල්‍ය රෙගුලාසි 133 සහ 134 හි දක්වා ඇති භූමිකාවන්, කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, ශ්‍රී ලංකාවේ විගණන ප්‍රමිතිවල සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන චක්‍රලේඛවල දක්වා ඇති උපදෙස් සැලකිල්ලට ගෙන තිබේ. විගණන සහ කළමනාකරණ කමිටුව හි විගණන විමසුම් සහ වාර්තාවල නිරීක්ෂණ සහ නිර්දේශ මත සංවිධානය විසින් සිදු කරන ලද නිවැරදි කිරීම් සහ නිර්දේශවල ප්‍රමාණාත්මක සහ ගුණාත්මකභාවය ද පරීක්ෂා කරන ලදී.

2022 වර්ෂයේදී විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් පවත්වන ලද අතර අභ්‍යන්තර පාලන පද්ධති ක්‍රමවත් ව හා නිවැරදි ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය මගපෙන්වීම් ලබා දෙන ලෙස කමිටුව විසින් කළමනාකාරීත්වයට යෝජනා කර ඇත.

13. මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

රු.

	ඇමුණුම් අංකය	31.12.2022 දිනට		31.12.2021 දිනට
ජංගම වත්කම්				
මුදල් සහ ඒ ආශ්‍රිත වත්කම්	1		14,641,682	228,837,920
ලැබීමට නියමිත ව්‍යාපෘති ණයගැතියන්	2	190,290,744		65,763,151
විවිධ ලැබීම්	3	24,982,172	215,272,916	27,159,302
			229,914,598	**321,760,373**
ඉන්වෙන්ට්‍රි	4		4,575,467	4,339,084
කාර්යමණ්ඩලයෙන් ලැබීම්	5		73,827,278	90,245,053
පෙර ගෙවීම්	6		31,290,393	60,682,622
වෙනත් ජංගම වත්කම්				
සිදුවෙමින් පවතින ව්‍යාපෘති	7	69,984,069		183,777,832
කාලීන තැන්පතු	8	592,710,492	662,694,561	443,621,164
ජංගම නොවන වත්කම්			**1,002,302,297**	**1,104,426,128**
යටිතල, පිරියත සහ උපකරණ	9	150,971,424		115,110,148
ඉඩම් සහ ගොඩනැගිලි	9	53,506,140		3,001,370
අස්පෘශ්‍ය වත්කම්	9	4,201,850		7,328,312
බදු ඉඩම්	9	7,965,000		7,965,000
නව විද්‍යාගාර ගොඩනැගිල්ල නොනිමි වැඩ		648,610,079		540,050,649
කුඩා රසායනාගාර කටයුතු නොනිමි වැඩ		1,380,000	866,634,493	22,006,166
මුලු වත්කම්			**1,868,936,790**	**1,799,887,771**
වගකීම්				
ජංගම වගකීම්				
ගෙවීමට ඇති සේවාදායකයන්ගෙන් ලැබූ මුදල්	10	295,853,607		516,527,805
විවිධ ගෙවීම්	11	129,789,852	425,643,460	106,807,992
ජංගම නොවන වගකීම්				
දීර්ඝ කාලීන ප්‍රතිපාදන				
පාරිතෝෂික වෙන්කිරීම්	12	86,940,688	86,940,688	84,698,369
මුළු වගකීම්			**512,584,148**	**708,034,166**
ශුද්ධ වත්කම්			**1,356,352,642**	**1,091,853,605**
ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය				
රජයේ සහ වෙනත් ආයතනවලින් දායක කරන ලද ප්‍රාග්ධනය	13	589,982,586		589,982,586
වෙන්කිරීම් –අතිරික්තය නැවත ගණනය		27,875,989		27,875,989
			617,858,575	
සමුච්චිත අතිරික්තය/ (ඌනතාව)				
ඉදිරියටගෙන ආ අතිරික්තය	14	471,508,338	471,508,338	403,533,592
වර්ෂය සඳහා අතිරික්තය			266,985,728	70,461,437
ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය			**1,356,352,642**	**1,091,853,605**

2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය

රු.

ආදායම	ඇමුණුම්	2022 වර්ෂය	2022 වර්ෂයේ අයවැය	2021 වර්ෂය
ආදායම				
පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය	**15**	55,843,122	70,023,000	69,555,218
භූ තාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය	**16**	252,180,913	284,000,000	221,030,070
නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය	**17**	248,413,086	266,724,490	261,085,907
මානව ජනාවාස සැලසුම් සහ පුහුණු අංශය	**18**	46,763,750	74,300,000	72,147,579
ගොඩනැගිලි ද්‍රව්‍ය හා පරීක්ෂණ අංශය	**19**	40,157,465	51,250,000	46,784,101
ව්‍යුහාත්මක ඉංජිනේරු පර්යේෂණ හා ව්‍යාපෘති කළමනාකරණ අංශය	**20**	159,768,826	151,672,800	134,924,942
සම්පූර්ණ මෙහෙයුම් ආදායම		**803,127,161**	**897,970,290**	**805,527,817**
වෙනත් ආදායම්	**21**	90,920,313	41,680,000	34,851,314
මුළු ආදායම		**894,047,475**	**939,650,290**	**840,379,131**
අඩුකළා - වියදම්				
වැටුප්, පඩිනඩි හා සේවක ප්‍රතිලාභ	**22**	437,423,552	514,160,233	406,993,732
භාවිත කරන සැපයුම් සහ පරිභෝජන	**23**	241,709,502	280,460,000	269,483,120
ක්ෂය වීම	**24**	59,156,348	50,000,000	56,387,258
දේපළ උපනතා, පිරියත සහ උපකරණ	**25**	20,875,246	21,245,000	17,251,255
වෙනත් වියදම්	**26**	22,259,111	29,995,000	34,628,737
මූල්‍ය පිරිවැය	**27**	75,833	100,000	110,640
මුළු වියදම		**781,499,592**	**895,960,233**	**784,854,743**
බදුවලට පෙර ශුද්ධ ලාභය		112,547,882	43,690,057	55,524,389
ආදායම් බදු		9,000,000	-	1,000,000
බදුවලට පසු ශුද්ධ ලාභය		**103,547,882**	**43,690,057**	**54,524,389**
විනිමය නොවන ආදායම	**28**	178,504,297	10,000,000	19,888,377
අඩු කළා: ප්‍රදාන වත්කම් සඳහා ක්ෂය වීම	**24**	15,066,452	3,000,000	3,951,329
වර්ෂය සඳහා සම්පූර්ණ අතිරික්තය		**266,985,728**	**50,690,057**	**70,461,437**

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.

	2022 වර්ෂය	2021 වර්ෂය
අතිරික්තය / (හිඟය)	**266,985,728**	**70,461,437**
ගැලපුම්		
ක්ෂයවීම්	74,222,800	60,338,586
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	15,863,377	(11,629,401)
පාරිතෝෂික ගෙවීම	(13,621,058)	(7,316,420)
ණය ගැතියන් සඳහා අධි/අව ප්‍රතිපාදන	(264,760)	(103,971)
ස්ථාවර වත්කම් බැහැර කිරීම	(299,299)	-
විනිමය නොවන ආදායම	178,504,297	(18,958,377)
බැර නොවූ පොලී ආදායම	(24,021,439)	(25,301,196)
ක්‍රියාකාරී ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ක්‍රියාත්මක අතිරික්තය (හිඟය)	**497,369,646**	**67,490,658**
ක්‍රියාකාරී ප්‍රාග්ධනයේ වෙනස්වීම්		
ණයගැතියන් වැඩිවීම	(156,696,278)	20,427,822
කාර්යමණ්ඩලයෙන් ලැබීම් වැඩිවීම	16,417,775	2,115,818
පෙරගෙවීම් වැඩිවීම	29,392,230	83,972,193
ඉන්වෙන්ට්‍රිවල වැඩිවීම	(236,383)	(928,844)
අත ඇති වැඩවල ප්‍රගතිය වැඩිවීම	113,793,763	(79,493,510)
තැන්පතු වැඩිවීම	(149,089,328)	25,699,918
සේවාදායකයන්ගෙන් ලැබුණු මුදල්	(220,674,197)	196,617,192
විවිධ ණය හිමියන්ගේ වැඩිවීම	22,981,860	(10,037,320)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල් ප්‍රවාහය	**153,259,088**	**305,863,927**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල් ප්‍රවාහය		
පොලී ආදායම	58,632,012	1,956,883
ස්ථාවර වත්කම් මිලදීගැනීම්	(247,953,041)	(192,724,849)
ස්ථාවර වත්කම් සඳහා බැහැර කිරීම	370,000	10,000
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(188,951,029)**	**-190,757,966**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
රජයේ ප්‍රතිපාදන (ප්‍රසම්පාදන)	(178,504,297)	8,445,694
වෙනත් රජයේ ප්‍රතිපාදන		10,512,683
මුදල් යෙදවීමේ ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ	**(178,504,297)**	**18,958,377**
මුදල් සහ සමාන දෑවල ශුද්ධ වෙනස්වීම	(214,196,238)	134,064,338
කාල සීමාව ආරම්භයේ මුදල් සහ සමාන දෑ	228,837,920	94,773,584
2022.12.31 දිනට මුදල් සහ සමාන දෑ	**14,641,682**	**228,837,922**
සටහන - මුදල් සහ සමාන දෑ		
බැංකුවේ සහ අත ඉතිරි මුදල්	14,641,682	228,837,920
	14,641,682	**228,837,920**

ඉහත සඳහන් ඇමුණුම් 59වන පිටුවේ 'මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ඇමුණුම්'' යටතේ ඇතුලත් කර ඇත.

ගිණුම් සටහන්

1. ගිණුම් සඳහා වූ පදනම

සාමාන්‍ය පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති, මූලික උපකල්පන, රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති සහ විටින් විට වරලත් ගණකාධිකාරීන්ගේ ආයතය මඟින් හඳුන්වාදුන් ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සහ පහත සඳහන් කරුණු සැලකිල්ලටගෙන මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇත.

(අ) ලාභ සහිතව පවත්වාගෙනයන ආයතන.

(ආ) ගිණුම් ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිත කිරීම.

(ඇ) උපචිත පදනමින් ආදායම සහ වියදම් හඳුනාගැනීම.

(ඈ) ප්‍රමිතිවලින් බැහැරවීම හෙළි කිරීම

2. සාමාන්‍ය ගිණුම් ප්‍රතිපත්ති.

2.1 ක්ෂය කිරීමේ ප්‍රතිපත්ති

(a) භාවිතා කළ දින ගණන අනුව ක්ෂයවීම් ලබා දේ

(b) පහත සඳහන් ප්‍රතිශතයන් අනුගමනය කරමින් සරල මාර්ග පදනම් කරගෙන ස්ථාවර වත්කම් ක්ෂය කරනු ලැබේ.

ස්ථාවර වත්කම් වර්ගය	%
ගොඩනැගිලි	2.5
යන්ත්‍රසූත්‍ර සහ විද්‍යාගාර උපකරණ	20
ලී බඩු සහ සවිකිරීම්	10
වාහන	20
සාමාන්‍ය කාර්යාලයීය උපකරණ	20
ඇඳීම සඳහා භාවිත කරන කාර්යාලයීය උපකරණ	20
මෙවලම්	20
පුස්තකාල පොත්	10
ගිනි නිවීමේ උපකරණ	50
ස්ථාවර වත්කම් වර්ගය	5
ගොඩනැගිලි	10

2.2 අවසාන තොග ගණනයකිරීම

භාවිත නොකරන ලද භාණ්ඩ තොග පිරිවැය මත ගණනයකර ඇත.

2.3 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

පාරිතෝෂික පනත අනුව පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරන ලදී.

2.4 අවිනිශ්චිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන

පහත සඳහන් කරුණු පදනම් කොට අවිනිශ්චිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන සපයා ඇත:

(අ) අවු. 2-10 පුරා හිඟ ණය සඳහා 1 % ප්‍රතිපාදන සපයනු ලැබේ.

(ආ) අවු. 10 ක් පුරා හිඟ ණය සඳහා 25 % ප්‍රතිපාදන සපයනු ලැබේ.

2.5 ප්‍රතිපාදන ලැබීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් 11 අනුව නිම කරන ලද ව්‍යාපෘති සඳහා ලැබුණු දේශීය හා විදේශීය ප්‍රදාන හුවමාරු නොවන ආදායම් ලෙස සැලකෙන අතර අනෙකුත් ව්‍යාපෘති සඳහා ලැබුණු ප්‍රදාන ජංගම වගකීම් ලෙස සලකන ලදී.

7 ඒ වගන්ති අනුව මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම් ප්‍රකාශය.

The Accounting policies & Notes to Accounts on pages 06 form an integral part of these Financial Statements. The Board of Directors is responsible for the preparation and presentation of these Financial Statements. These Financial Statements were approved by the Board of Directors and signed on their behalf.

Chief Financial Officer of NBRO

K.K.H.Randeny
Director (Finance)
National Building Research Organisation

K.K.H. RANDENY
DIRECTOR FINANCE
NATIONAL BUILDING RESEARCH ORGANIZATION
FINANCE DIVISION
99/1, JAWATTA ROAD,
COLOMBO - 05.

Chief Executive Officer of NBRO

Eng.(Dr.) Asiri Karunawardena
Director General
National Building Research Organisation

Director General
National Building Research Organisation
No. 99/1, Jawatta Road
Colombo 05

Member of the Interim Management Committee of NBRO

H. U. R. Fonseka
Chief Accountant
Disaster Management Division
Ministry of Defence

H. U.R. Fonseka
Chief Accountant
Ministry of Defence
Disaster Management Division
Vidya Mawatha, Colombo 07.

General (Retd) Kamal Gunarathne WWV RWP RSP USP ndc psc MPhil
Chairman of the IMC
Secretary
Ministry of Defence

General Kamal Gunaratne (Retd)
WWV RWP RSP USP ndc psc MPhil
Secretary
Ministry of Defence

14. විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. } ඩීඑමජී/ඒ/එන්බීආර්ඕ/01/22/14 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි 26 දින

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොළුවිල පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.මිලියන 70.78 ක් වූ මෝටර් වාහන 09 ක්, රු. මිලියන 271.93 ක් වූ විද්‍යා උපකරණ සහ රු. මිලියන 42.59 ක් වූ කාර්යාල උපකරණ හාවිතා කරමින් පැවතියද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කර ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 වන ඡේදය ප්‍රකාරව වත්කමක ක්ෂය කිරීම ආරම්භවන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්වයට ගෙන ආ පසුව වේ. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය මගින් ලබා දී තිබූ රු. මිලියන 56.47 ක් වූ වත්කමක් 2022 නොවැම්බර් 15 දින ස්ථාපිත කර තිබුණද, එකී වත්කම සඳහා 2022 ජනවාරි 01 දින සිටම ක්ෂය කිරීම හේතුවෙන් රු.මිලියන 9.90 ක් ක්ෂය වියදම වැඩියෙන් දැක්වුණ අතර වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2021 වර්ෂයේ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය මගින් ලබා දී තිබූ රු. මිලියන 89.30 ක භාණ්ඩ ආධාර සමාලෝචිත වර්ෂයේ හුවමාරු නොවන අයභාරයක් (non exchange revenue) ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2016 වර්ෂයේ සිට භාවිතයට ගනිමින් තිබූ රු. මිලියන 2.9 ක පරිගණක මෘදුකාංග (Computer Software) හා රු. මිලියන 1.40 ක විද්‍යාගාර උපකරණ සමාලෝචිත වර්ෂයේ වත්කම් ලෙස හඳුනාගෙන තිබූ අතර එම ප්‍රමාණයෙන්ම ක්ෂය කර තිබුණි.මෙය ඉකුත් වර්ෂයේ ගැලපීම් ලෙස දැක්විය යුතු වුවත් එලෙස සිදුකර නොතිබුණි.

(ඉ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන වායු විමෝචන හාරකාර අරමුදල විසින් 2020 නොවැම්බර් 20 දින ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත පවරා දී තිබූ රු. මිලියන 41.38 ක් වටිනා ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. තවද ඊට අදාලව ක්ෂය ගැලපීම්ද සිදු කර නොතිබුණි.

(ඊ) හිමිකම් වෙනස්වීම් ප්‍රකාශයේ වත්කම් අත්පත්කර ගැනීම් ලෙස පෙර වර්ෂවල සිට ඉදිරියට ගෙනවිත් තිබූ රු.මිලියන 2.26ක හඳුනා නොගත් ශේෂය හඳුනාගැනීමට කටයුතු නොකර රජයේ සහ අනෙකුත් ආයතනවල ප්‍රාග්ධන දායකත්ව ගිණුමට (Capital Contributed by Government & Other Entities) ගලපා තිබුණි.

(උ) ව්‍යාපෘති සේවාවන් සඳහා දීමනා ගෙවීමේදී අන්තර් කළමනාකරණ කමිටු අනුමැතියක් ලබාගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු බව විගණන හා කළමනාකරණ කමිටුව තීරණය කර තිබුණද, එසේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීමකින් තොරව රු. මිලියන 2ක් විශේෂ දීමනා ගිණුමකට හර කර ගෙවිය යුතු දීමනා ලෙස ගිණුමකට (Provision to Project Staff) බැර කර තිබුණි.

(ඌ) සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාලවලින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කරන ලද රු. මිලියන 3.73ක හඳුනානොගත් ලැබීම් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කිරීමකින් තොරව සංවිධානයේ විවිධ ආදායම් ලෙස දක්වා තිබුණි.

(එ) ස්ථායිකරණ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතිය මගින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත ලැබිය යුතු ණය ශේෂය රු. මිලියන 136.96 ක් ලෙස දක්වා තිබුණද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ණය ශේෂය රු. මිලියන 133.18 ක් වූයෙන් රු. මිලියන 3.78 ක වෙනසක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු

මූල්‍ය ප්‍රකාශන සමහ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය

කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබාධිත පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල විධුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්ථාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංවිධානය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංවිධානයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංවිධානයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංවිධානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට් යොමුව	නිරීක්ෂණ
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2000 ජනවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය හා 1994 ජූනි 04 දිනැති අංක 05 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	අමාත්‍ය මණ්ඩල හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව 2022 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා සංවිධානය විසින් රු. මිලියන 9.02 ක් දිරිදීමනා ලෙස ගෙවා නිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංවිධානයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇතිබව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංවිධානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

සංවිධානයේ නව කාර්යාල සහ විද්‍යාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ගිවිසුම ප්‍රකාරව දින 240 කින් නිම කළ යුතු වුවත්, 2022 දෙසැම්බර් 31 දින වන විට දින 1,746 ක කාලයක් ගතවී තිබුණද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීමට ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2021 ඔක්තෝම්බර් 12 දින අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව පිළියෙල කල පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 26 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණද, මෙතෙක් එම පනත පිළියෙල කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පිහිටුවා වසර 30 ක් පමණ ගතවී ඇතත්, නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම බෙනුවෙන් පනතක් සම්මත කර ගැනීමට සංවිධානයට නොහැකි වී තිබුණි.

(ආ) නායයෑම් අනතුරු ඇඟවීම් නිකුත්කිරීම සඳහා විගණිත දිනය වූ 2022 සැප්තැම්බර් 15 දිනට අවදානම් සහිත දිස්ත්‍රික් 14 ක ස්වයංක්‍රීය වර්ෂාමාන 330 ක් ස්ථාපිත කර තිබුණු අතර ඉන් 72 ක් අක්‍රීයව පැවතුණි. වර්ෂාමාන පද්ධති ප්‍රධාන කාර්යාලයෙන් නඩත්තු කරන බැවින් සේවක හිඟය හා අනෙකුත් වෙනත් කරුණු හේතුවෙන් නිසියාකාරව නඩත්තුව සිදුකර නොතිබුණි. ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිවල දත්ත සම්ප්‍රේෂණයට සිදුවන අවහිරතාවන්ද නිවැරදි.පූර්ව නායයෑම් අනතුරු ඇඟවීමේ නිවේදන නිකුත් කිරීම කෙරෙහි බලපෑම් ඇති කරන බව නිරීක්ෂණය විය.

(ඇ) ශ්‍රී ලංකා රසායනික අවදානම ක්‍රමාණුකූලව තක්සේරු කිරීමේ (Systematic Diagnostic Assessment of Chemical Disaster Risk in Sri Lanka) ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 05ක් වෙන්කර තිබූ අතර වර්ෂය ආරම්භයේ රු. මිලියන 2.32ක පෙර වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිවීම්ද පැවතුණි. ව්‍යාපෘතියේ වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 4.25ක් වූ අතර රු. මිලියන 3.07ක් ඌණ උපයෝජිතව පැවතුණි. 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අවසන් කිරීමට නියමිතව තිබුණු මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂය අවසන්වන විටද නිමකර නොතිබුණි.

(ඈ) නායයෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2022 වර්ෂය සඳහා රු. මිලියන 10ක ප්‍රතිපාදන ලැබී තිබුණි. සංවිධානය විසින් රු. මිලියන 3.77ක් ව්‍යාපෘති සඳහා උපයෝජනය කර තිබූ අතර රු. මිලියන 6.23ක මුදලක් ඌණ උපයෝජිතව පැවතුණි. එය ලද ප්‍රතිපාදනවලින් සියයට 62ක ප්‍රතිශතයක් විය.පසුගිය වර්ෂයේ නායයෑම් අවමකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 150ක ප්‍රතිපාදන ලැබී තිබුණද, රු. මිලියන 101.55ක් උපයෝජනය කිරීමකින් තොරව පැවතුණි. ඉහත ප්‍රතිපාදන භාවිතයෙන් 2022 අගෝස්තු 14 දිනෙන් නිම කිරීමට සැලසුම් කර තිබූ

කොටහැරකන්ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණත් වර්ෂය නිමවන විටද එහි භෞතික ප්‍රගතිය සියයට 62ක් විය.

(ඉ) රත්නපුර හා කළුතර දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීමට 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 143 ක් ලබා දී තිබූ අතර ඉන් රු. මිලියන 60.52 ක් උපයෝජනයකින් තොරව පැවතුණි. රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය නිම කර තිබුණ අතර කළුතර දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

(ඊ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ තාක්ෂණික දායකත්වයෙන් අධි අවදානම් කලාපවල ජීවත්වන පුද්ගලයන් සුරක්ෂිත ස්ථානවල පදිංචි කිරීමේ වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 14 ක පවුල් 1000 ක් සඳහා නිවාස ඉදිකිරීමට පෙර වර්ෂවල ලද ප්‍රතිපාදන රු.මිලියන 28.07ක් උපයෝජනයකින් තොරව පැවතුණි.

(උ) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල වායු තත්ත්ව අධීක්ෂණ කටයුතු සඳහා අධි තාක්ෂණික ස්වයංක්‍රීය ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකයක් 2019 අප්‍රේල් 01 වන දින මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත භාර දී තිබුණි. ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය සමග WPLO -3426 දරන ලොරි රථය කොළඹ මහ නගර සභා පරිශ්‍රයේ 2020 වර්ෂයේ මාර්තු මස සිට නවත්වා තිබූ අතර එමගින් ලබා ගන්නා දත්ත කොළඹ මහ නගර සභා පරිශ්‍රයට පමණක් සීමා වී තිබුණි. අනෙකුත් නාගරික ප්‍රදේශවලට සේවා සපයා නොතිබුණි.

(ඌ) සංවිධානයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක් සඳහා පුරප්පාඩු 35 ක් පැවතුණි. මේ අතර අධ්‍යක්ෂ (පාලන) තනතුර සහ අධ්‍යක්ෂ (නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ) තනතුර 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. තවද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03ක් වන ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, විද්‍යාඥ, කළමනාකරු (තාක්ෂණික / රසායනාගාර) යන තනතුරුවලද පුරප්පාඩු සංඛ්‍යාව 33 ක් වූ අතර ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ සහ කළමනාකරු තනතුරු වර්ෂ 04 ක කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

(එ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කොන්ත්‍රාත්කරුවන් වෙත අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු. මිලියන 18.68 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. මේ අතරින් රු. මිලියන 5.66 ක ශේෂය 2017 වර්ෂයට අයත් ශේෂ විය.

ඩබ්ලිව්.සී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

15. පසුගිය වසර 10ක මූල්‍ය තත්ත්වය

2022 වසර තුල ජා. ගො. ප. සංවිධානය රු. මිලියන 894.05 ක ඒකාබද්ධ අදායමක් වාර්තාකර ඇත. ජා. ගො. ප. සංවිධානයෙහි 2022 වසරේ සේවා සැපයීම තුළින් ලද ආදායම රු. මිලියන 586.71 කි. ආයතනයේ බොහෝ දුරට මෙම උපදේශාත්මක ආදායම තුළින් තම වර්තමාන පුනරාවර්තන පිරිවැය අවශ්‍යතා සපුරාගැනීම සිදුකරයි.

2022 වසරේ දී රාජ්‍ය ප්‍රතිපාදන යටතේ වන ව්‍යාපෘති හා වැඩසටහන් වෙනුවෙන් රු. මිලියන 307.34 වියදම්කර ඇත. අදාළ කාලපරිච්ඡේදය සඳහා මුළු ඒකාබද්ධ වියදම රු. මිලියන 790.50 ක් වන අතර ශුද්ධ ලාභය රු. මිලියන 103.55 ක් වාර්තාවෙයි.

359 දෙනෙකුගෙන් යුතු කාර්යයමණ්ඩලය ඇතුළු දෛනික වේතනයන් ලබන සේවකයන්ගේ දීමනාවන් වෙනුවෙන් රු. මිලියන 437.42 ක පිරිවැයක් 2022 වසරේ දී දරා ඇති අතර 2021 වසරේ දී කාර්යමණ්ඩල ශක්තිය 438 සහ දෛනික වේතනයන් ලබන සේවකයන් ද ඇතුළු ව මෙම අගය රු. මිලියන 406.9 ක් විය.

ආයතනික වර්ධනය සහ වැඩිදියුණු වූ කාර්යසාධනය ප්‍රධාන වශයෙන් ජා. ගො. ප. සංවිධානයෙහි කළමනාකාරීත්වයේ සහ කාර්යමණ්ඩලයෙහි ධෛර්යමත් උත්සාහයේ ප්‍රතිඵලයකි.

පසුගිය වසර 10 ක මූල්‍ය තත්ත්වය

(රු. මිලියන.)

Year	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022
ඒකාබද්ධ ආදායම	261.81	415.68	619.18	681.15	888.69	1,048.26	958.87	771.34	840.38	894.05
									860.26	1,072.55 ☜
පරීක්ෂණ සහ උපදේශන මගින් ආදායම	175.12	247.99	384.63	352.89	379.64	634.11	610.71	433.21	523.42	586.71
ශුද්ධ ලාභය	11.23	62.75	53.55	47.92	43.83	63.69	55.24	30.17	54.52	103.55
									70.45	266.99 ☜

☜ *හුවමාරු නොවන අයභාර ඇතුළුව වටිනාකම*



පසුගිය වසර 10 සඳහා මුළු මෙහෙයුම් ආදායම, පරීක්ෂණ සහ උපදේශන ආදායමට එදිරිව ශුද්ධ අතිරික්තය

16. ආයතනික පාලන වාර්තාව

මානව සම්පත් / ධාරිතා සංවර්ධනය

ආපදා කළමනාකරණ අංශයේ ආපදා අවදානම අවමකිරීමේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානයේ ධාරිතා සංවර්ධනය කිරීම සඳහා එහි දැක්ම සහ මෙහෙවර සකස්කර ඇත. ඒ අනුව ජා. ගො. ප. සංවිධානය ඉහළ ප්‍රමිතියෙන් යුතු සේවයක් සැලසීමට ආයතනික මෙහෙවර පාර්ලිමේන්තු පනතත් මඟින් නීතිගත කිරීමේ ක්‍රියාවලිය සහ කාර්යමණ්ඩල ධාරිතාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් පියවර ගනිමින් සිටී. 2022 වසර තුළ අත්‍යවශ්‍ය පුරප්පාඩුවී ඇති තනතුරු සඳහා සමස්තයක් ලෙස නව සේවකයින් බඳවාගැනීම සිදුකර නොමැති අතර කළමනාකරණ සහායක තනතුරු 11 ක් පමණක් බඳවාගත් අතර සේවකයින් 18 දෙනෙකු ඉල්ලා අස්වීම හා දෙදෙනෙකු විශ්‍රාමයෑම සිදුවී ඇත.

අංකය	වැටුප් කේතය	කාර්යමණ්ඩල ගණය	තනතුරු සංඛ්‍යාව	දැනට සිටින කාර්යමණ්ඩලය (ස්ථිර)	පුරප්පාඩු ගණන (ස්ථිර)	ලබා ගත හැකි අතිරේක කාර්යමණ්ඩලය (වෙනත් පදනම්)
1	HM 2- 3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ප්‍රධාන විධායක නිලධාරී) (CEO)	01	01	0	-
2	HM 1-3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු	08	05	03	-
3	AR2	ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/විද්‍යාඥ	25	15	10	-
4	MM 1-1	මධ්‍ය කළමනාකරු	12	08	04	-
5	AR 1	අධ්‍යයන/විද්‍යාඥ	124	103	21	19
6	JM 1-1	කණිෂ්ඨ කළමනාකරු	25	19	06	02
7	MA 2-2	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	36	27	09	13
8	MA 1-2	කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන)	53	50	03	05
9	PL 1,2&3	ප්‍රාථමික ශ්‍රේණි	102	72	30	15
	TOTAL		**386**	**300**	**86**	**54**

2022 වසරේ ස්ථිර කාර්යමණ්ඩලය බඳවාගැනීම්, විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම්

අංකය	වැටුප් කේතය	කාර්යමණ්ඩල ගණය	බඳවාගැනීම් සංඛ්‍යාව	ඉල්ලාඅස්වූ සංඛ්‍යාව	විශ්‍රාමලත් සංඛ්‍යාව
1	HM 1- 3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (CEO)	-	-	-
2	HM 1-1	ජ්‍යෙෂ්ඨ කළමනාකරු	-	-	02
3	MM 1-1/JM 1-1	මධ්‍ය/ කණිෂ්ඨ කළමනාකරු	-	-	02
4	AR2	ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/ විද්‍යාඥ	-	02	-
5	AR 1	අධ්‍යයන/ විද්‍යාඥ	-	02	-
6	MA 2-2	කළමනාකරණ සහකාර (තාක්ෂණික)	-	01	-
7	MA 1-2	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	11	-	-
8	PL 1,2&3	ප්‍රාථමික ශ්‍රේණි	-	03	04
	මුළු ගනන		**11**	**08**	**08**

කොවිඩ් 19 වසංගතය පිළිබඳ අවදානම් පාලන කමිටුව

කොවිඩ් 19 ව්‍යාප්තිය ජා. ගො. ප. සංවිධානයේ කටයුතුවල සුමට ක්‍රියාකාරීත්වය සඳහා ද බලපෑම් ඇතිකල අතර ඊට අමතර ව සංවිධානයෙහි කාර්යමණ්ඩලය වෙත සෞඛ්‍යය ම ය බලපෑම් ඇතිවිය. ජාතික සෞඛ්‍යය බලධාරීන් විසින් ලබා දී ඇති උපදෙස් පරිදි ජා. ගො. ප. සංවිධානය තුල ආරක්ෂණ මට්ටමක් ක්‍රියාත්මක වේ. ජා. ගො. ප. සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තත්ත්වය කළමනාකරණය කිරීම සහ සිදුවිය හැකි බලපෑම් අවමකිරීම සඳහා කාර්යමණ්ඩල කාණ්ඩවල සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලදී.

කාර්යමණ්ඩල පුහුණුව/වැඩමුළු සඳහා සහභාගීවීම් සහ සම්මන්ත්‍රණ

ජා. ගො. ප. සංවිධානයේ විදේශ පුහුණු වැඩසටහන් සහ උසස් අධ්‍යයන අවස්ථා සඳහා පහත නිලධාරීන් සහභාගී වී ඇත. ශාස්ත්‍රපති/ ආචාර්ය උපාධිය සඳහා විද්‍යාඥයින් දෙදෙනෙක් විදේශ පුහුණු වැඩසටහන් තෝරා ගන්නා ලදී.

2022 දී විදේශ පුහුණු අවස්ථා

අංකය	නම	තනතුර/අංශය	පුහුණු වැඩසහන	කාලය	රට
1	කේ.ජී. එන්. සරෝජා මිය	විද්‍යාඥ/භූවිද්‍යාඥ - LRRMD	JICA තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය යටතේ "නායයෑම් අවදානම අවම කිරීම සඳහා ව්‍යුහාත්මක නොවන ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීමේ ධාරිතාව ශක්තිමත් කිරීම" සඳහා වූ පුහුණුව	2022 ජූලි 11 සිට 27 දක්වා	ජපානය
2	එම්. වී. එන්. ධනුෂ්ක මයා	විද්‍යාඥ/භූවිද්‍යාඥ - LRRMD			
3	ඩී. එම්. සී. පී. බණ්ඩාර මයා	විද්‍යාඥ/භූවිද්‍යාඥ - LRRMD			
4	පී. එච්. සී. එස්. රත්නසිරි මයා	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ - HSPTD			
5	ඊ. එම්. කේ. එස්. ඒකනායක මයා	විද්‍යාඥ, නගර නිර්මාණ - HSPTD			
6	ඩබ්. කේ. සී. කුමාරසිරි මයා	විද්‍යාඥ, නගර නිර්මාණ - HSPTD			
7	ඉංජී. ආචාර්ය ආසිරි කරුණාවර්ධන	අධ්‍යක්ෂ ජනරාල්	ICL-KLC Conference *International Consortium on Landslide – Kiyoto Landslide Commitment*	2022 නොවැ. 21 සිට දෙසැ. 01 දක්වා	ජපානය
8	කේ. එන්. බණ්ඩාර මයා	අධ්‍යක්ෂ - GETD			
9	ආචාර්ය එච්. ඒ. ජී. ජයතිස්ස මයා	වැ. බ. අධ්‍යක්ෂ - LRRMD			
10	දයාන් මුණසිංහ මයා	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ - HSPTD			
11	බී. අයි. කුමාරගේ මයා	ඉංජිනේරු, GETD			
12	ඩී. එම්. ඩී. එස්. දිනාසායක මයා	විද්‍යාඥ, GETD			
13	ජේ. ඩී. එස්. එන්. සිරිවර්ධන මිය	විද්‍යාඥ/භූවිද්‍යාඥ - LRRMD	නායයෑම් නිරීක්ෂණ පද්ධතිය සඳහා නඩත්තු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික පුහුණුව	2022 නොවැ. 29 සිට දෙසැ. 02 දක්වා	ජපානය
14	ඩබ්. එම්. ඒ. ඩී. වනසුන්දර මයා	විද්‍යාඥ /ඉංජිනේරු - LRRMD			
15	ඩබ්. කේ. එස්. එම්. වක්වැල්ල මයා	විද්‍යාඥ / භූවිද්‍යාඥ - LRRMD			
16	එන්. කේ. වීරසේකර මයා	විද්‍යාඥ / භූවිද්‍යාඥ - LRRMD			
17	ආර් එම්. එස්. ඒ. කේ. රත්නායක මයා	විද්‍යාඥ - LRRMD			

18	ඩබ්. ඒ. කේ. එස්. ආරියකුමාර මයා	විද්‍යාඥ / භූවිද්‍යාඥ - LRRMD	Ph.D. Programme in Environmental Studies, Degree Programme in Life and Earth Sciences, Graduate School of Science and Technology University of Tsukuba	2022 ඔක්. 01 සිට 2025 ඔක්. 01 දක්වා	ජපානය
19	එච්. ඒ. ඒ. අයි. එස්. බණ්ඩාර මිය	විද්‍යාඥ / භූවිද්‍යාඥ - LRRMD	JICA Long Term Training (Master's Programme) under the "Project on Development of Early Warning Technology of Rain-Induces Rapid and Long Travelling Landslides''	2022 ඔක්. 05 සිට 2024 සැප්. 30 දක්වා	ජපානය
20	පී. ඒ. විජේකුමාර මයා	විද්‍යාඥ / භූවිද්‍යාඥ - HSPTD	බහු උපද්‍රව අවදානම් සහ හානි තක්සේරු කිරීමේ උපදේශන සම්මන්ත්‍රණය	2022 දෙසැ. 08 සිට 09 දක්වා	නේපාලය

විද්‍යාගාර සහ ක්ෂේත්‍ර උපකරණ මිලදී ගැනීම

පර්යේෂණ සහ ධාරිතා ගොඩනැගීම සඳහා විද්‍යාගාර සහ ක්ෂේත්‍ර උපකරණ ප්‍රසම්පාදනය ආරම්භ නොකරණ ලදි. කෙසේ වෙතත් තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති යටතේ ක්ෂේත්‍ර උපාංග ඇතුළු ප්‍රධාන උපකරණ පරිත්‍යාග ලෙස ලැබිණි. ඉන් ප්‍රධාන අයිතම පහත වගුවේ දක්වා ඇත.

ප්‍රදානය කරනු ලබන ආයතනය	උපකරණ/උපාංග නම	වටිනාකම (රු.)
JICA	නායයෑම් නිරීක්ෂණ දත්ත විශ්ලේෂණය සඳහා උපකරණ	8,653,346.00
JICA	නායයෑම් දුරස්ථ නිරීක්ෂණ පද්ධතිය සඳහා උපකරණ	20,844,091.40
Salford University	පරිගනක හා උපාංග	1,780,562.00
JICA	උපකරණය හා උපාංග	50,649,075.00
JICA	ආතතිමාන මිනුම් පද්ධතිය	5,601,917.00
JICA	කාලගුණ නිරීක්ෂණ පද්ධතිය	5,427,704.61
JICA	නාය යෑම් සඳහා නිරීක්ෂණ පද්ධතිය	9,479,624.76
JICA	නාය යෑම් නිරීක්ෂණ උපකරණ	7,085,486.87
JICA	වනාන්තර වර්ෂාපතන මිනුම් පද්ධතිය	1,524,307.90
මුළු වටිනාකම		**111,046,115.55**

17. මූල්‍ය ප්‍රකාශවලට ඇමුණුම්

ඇමුණුම 01 -

මුදල් සහ මුදල් හා සමාන දෑ

විස්තරය	උප ඇමුණුම	2022	2021
මුදල් සහ බැංකු - ප්‍රධාන කාර්යාලය (ජංගම ගිණුම සහ ඉතුරුම් ගිණුම සමඟ ඒකාබද්ධ වේ)		9,162,641	220,268,232
මුදල් සහ බැංකු – දිස්ත්‍රික් කාර්යාල		397,654	364,198
මුදල් සහ බැංකු – දිස්ත්‍රික් කාර්යාල (Collection Account)		5,081,387	8,205,165
සුළු මුදල්		-	325
	1a	**14,641,682**	**228,837,920**

ඇමුණුම 02

ලැබිය යුතු - වෙළඳ ණය ගැතියන්

විස්තරය	උප ඇමුණුම	2022	2021
වෙළෙඳ ණයගැතියන්		190,290,744	65,763,151
	2a	**190,290,744**	**65,763,151**

ඇමුණුම 03

විවිධ ලැබීම්

විස්තරය	උප ඇමුණුම	2022	2021
ලැබිය යුතු ටෙන්ඩර් ගෙවීම්	3a	385,410	410,410
ලැබිය යුතු වෙනත් ගෙවීම්	3b	210,451	525,308
ලැබිය යුතු ඇපකර	3c	211,313	211,313
විවිධ ලැබීම් - දිස්ත්‍රික් කාර්යාල		153,559	187,015
ලැබිය යුතු පොලී		24,021,439	25,301,196
ලැබිය යුතු වෙනත් ගෙවීම්		-	524,060
		24,982,172	**27,159,302**

ඇමුණුම 04

ඉන්වෙන්ටරි

විස්තරය	උප ඇමුණුම	2022	2021
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය		3,049,509	2,946,913
රසායනික සහ වීදුරු භාණ්ඩ		1,525,957	1,392,171
	4a	**4,575,467**	**4,339,084**

ඇමුණුම 05

කාර්යමණ්ඩලයෙන් ලැබිය යුතු මුදල්

විස්තරය	උප ඇමුණුම	2022	2021
උත්සව අත්තිකාරම්	5a	149,250	95,581
විශේෂ වැටුප් අත්තිකාරම්	5b	2,400	2,400
ගමන් සහ යැපුම් අත්තිකාරම්	5c	28,951	618,521
විශේෂ මුදල් අත්තිකාරම්	5d	5,134	69,096
ආපදා ණය	5e	11,817,149	14,929,340
MSC ණය	5f	156,025	500,365
වෙනත් අත්තිකාරම්	5g	876,485	794,589
කාර්යමණ්ඩල වාහන ණය	5i	24,826,440	34,198,463
කාර්යමණ්ඩල නිවාස ණය	5j	35,965,445	39,036,698
		73,827,278	**90,245,053**

ඇමුණුම 06
පෙර ගෙවීම්

විස්තරය	උප ඇමුණුම	2022	2021
කොන්ත්‍රාත්කරුවන්ට දුන් අත්තිකාරම්	6a	24,729,620	51,950,721
වෙනත් පෙර ගෙවීම්	5h	6,560,772	8,731,902
		31,290,393	**60,682,622**

ඇමුණුම 07
වැඩ කරමින් පවතින ව්‍යාපෘති

විස්තරය /අංශය	උප ඇමුණුම	2022	2021
නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය			6,951,749
ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ සහ පරීක්ෂණ අංශය		-	362,153
ව්‍යුහාත්මක ඉංජිනේරු,පර්යේෂණ සහ ව්‍යාපෘති කළමනාකරණ අංශය		-	4,539,858
භූ තාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය		66,611,345	160,440,333
පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය		-	3,042,458
මානව ජනාවාස සැලසුම් සහ පුහුණු අංශය		3,372,724	8,441,279
	7a	**69,984,069**	**183,777,832**

ඇමුණුම 08
කාලීන තැන්පතු

විස්තරය	උප ඇමුණුම	2022	2021
කාලීන තැන්පතු		592,680,492	443,607,164
සේවක ඇප තැන්පතු		30,000	14,000
	8a	**592,710,492**	**443,621,164**

ඇමුණුම 09
යටිතල පහසුකම්, යන්ත්‍ර සහ උපකරණ
පිරිවැය **LKR**

විස්තරය	2022	2021
විද්‍යාගාර සහ ක්ෂේත්‍ර උපකරණ, පැලෑටි සහ යන්ත්‍රෝපකරණ	548,264,537	466,651,041
වාහන	70,783,026	70,783,026
කාර්යාලීය උපකරණ	63,407,241	67,695,132
පරිගණක දෘඩාංග සහ උපාංග	78,604,710	58,692,868
ගෘහ භාණ්ඩ සහ උපාංග	25,833,154	24,763,395
ඇඳීම සඳහා වූ කාර්යාල උපකරණ	301,109	301,109
පුස්තකාල පොත් සහ වාර සඟරා	4,546,652	4,546,652
මෙවලම්	1,905,122	1,905,122
ගිනි නිවන උපකරණ	162,441	162,441
	793,807,992	**695,500,786**

ක්ෂය වෙන්කිරීම්

Description	2022	2021
යන්ත්‍රෝපකරණ සහ රසායනාගාර උපකරණවල ක්ෂය වෙන්කිරීම්	435,281,928	381,442,188
වාහනවල ක්ෂය වෙන්කිරීම්	70,783,026	70,587,530
කාර්යාල උපකරණවල ක්ෂය වෙන්කිරීම්	58,368,359	59,254,299
පරිගණක දෘඩාංග සහ උපාංගවල ක්ෂය වෙන්කිරීම්	55,191,753	48,055,863
ගෘහභාණ්ඩ සහ උපාංගවල ක්ෂය වෙන්කිරීම්	17,169,994	15,134,982

ඇඳීම සඳහා වූ උපකරණවල ක්ෂය වෙන්කිරීම්	301,109	301,109
පොත් සඳහා ක්ෂය වෙන්කිරීම්	3,700,297	3,606,363
මෙවලම් සඳහා ක්ෂය වෙන්කිරීම්	1,905,122	1,886,934
ගිනි නිවීම් උපකරණ සඳහා ක්ෂය වෙන්කිරීම්	134,980	121,372
	642,836,567	**580,390,639**

ශුද්ධ වටිනාකම

විස්තරය	**2022**	**2021**
විද්‍යාගාර සහ ක්ෂේත්‍ර උපකරණ සහ යන්ත්‍රෝපකරණ	112,982,609	85,208,853
වාහන	0	195,496
කාර්යාලීය උපකරණ	5,038,882	8,440,834
පරිගණක දෘඩාංග සහ උපාංග	23,412,956	10,637,005
ගෘහභාණ්ඩ සහ උපාංග	8,663,160	9,628,413
ඇඳීම සඳහා වූ කාර්යාලීය උපකරණ	-	0
පුස්තකාල පොත් සහ වාර සඟරා	846,355	940,289
මෙවලම්	0	18,188
ගිනි නිවන උපකරණ	27,461	41,069
	150,971,424	**115,110,148**

ඉඩම සහ ගොඩනැගිල්ල

පිරිවැය **LKR**

විස්තරය	**2022**	**2021**
ඉඩම සහ ගොඩනැගිල්ල	65,448,492	14,274,901
	65,448,492	**14,274,901**

ක්ෂය වෙන්කිරීම්

Description	**2022**	**2021**
ඉඩම සහ ගොඩනැගිල්ල	11,942,353	11,273,532
	11,942,353	**11,273,532**

ශුද්ධ වටිනාකම

විස්තරය	**2022**	**2021**
ඉඩම සහ ගොඩනැගිල්ල	53,506,140	3,001,370
	53,506,140	**3,001,370**

අස්පෘශ්‍ය වත්කම්

පිරිවැය **LKR**

විස්තරය	**2022**	**2021**
පරිගණක මෘදුකාංග	21,199,558	18,119,558
	21,199,558	**18,119,558**

ක්ෂය වෙන්කිරීම්

විස්තරය	**2022**	**2021**
පරිගණක මෘදුකාංග	16,997,708	10,791,246
	16,997,708	**10,791,246**

ශුද්ධ වටිනාකම

විස්තරය		**2021**
පරිගණක මෘදුකාංග	4,201,850	7,328,312
	4,201,850	**7,328,312**

බදු ඉඩම්

පිරිවැය LKR

විස්තරය	2022	2021
බදු ඉඩම් - රත්නපුර (සටහන *)	7,965,000	7,965,000

රත්නපුර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට වෙන් කරන ලද ඉඩම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් අංක UDA/SABARA/27/06/147 හා 8.10.2020 දිනැති ලිපිය මගින් ජා. ගො. ප. සංවිධානය වෙත අයිතිය ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ගිවිසුම අත්සන් කිරීම නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් සිදුවෙමින් පවතින අතර, 2022.08.26 දිනැති ලිපිය මගින් NBRO වෙත දන්වා ඇත්තේ ඉඩම් කොමිෂන් සභාවෙන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉඩම් ආඥාපනත, 6 (1) වගන්තිය ප්‍රකාරව භාරදීමේ සහතිකය බලාපොරොත්තු වන බව සහ නාගරික සංවර්ධන අධිකාරිය විසින් අයිතිය ලබා ගැනීමේ සහතිකය ලැබීමෙන් පසු බදු ගිවිසුම අත්සන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

ඇමුණුම 10
ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු අත්තිකාරම්

විස්තරය /අංශය	උප ඇමුණුම	2022	2021
පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය		7,823,000	3,065,860
භූ තාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ		86,382,321	130,602,980
නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ		4,688,296	21,125,292
මානව ජනාවාස සැලසුම් හා පුහුණු		142,454,583	212,252,889
ව්‍යුහාත්මක ඉංජිනේරු පර්යේෂණ සහ ව්‍යාපෘති කළමනාකරණ අංශය		54,447,076	144,797,031
හඳුනා නොගත් ණය		58,332	4,683,753
	10a	**295,853,607**	**516,527,805**

ඇමුණුම 11
විවිධ ගෙවීම්

විස්තරය	උප ඇමුණුම	2022	2021
උපචිත වියදම්		8,106,644	11,107,231
ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතු		1,086,717	1,708,117
ආපසු ගෙවිය හැකි රඳවා තබා ගැනීමේ තැන්පතු		25,559,301	15,031,409
ආපසු ගෙවිය හැකි ආරක්ෂක තැන්පතු		174,596	34,000
අතිරික්ත මුදල් (පාරිභෝගික)		361,488	777,071
කොන්ත්‍රාත්කරුවන්ට/වෙනත් අයට ගෙවිය යුතු මුදල්		46,720,876	42,664,722
ලබා නොගත් නිවාඩු දින සඳහා වෙන්කිරීම්		12,000,000	13,503,065
ප්‍රසාද/කාර්ය සාධන දිරි දීමනා සඳහා වෙන්කිරීම්		4,035,000	3,059,000
විගණන ගාස්තු සඳහා වෙන්කිරීම්		500,000	500,000
අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා වෙන්කිරීම්		2,000,000	-
ගෙවිය යුතු ආදායම් බදු		11,972,055	3,503,215
ගෙවිය යුතු වැටුප්		841,066	752,798
ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල්		4,367,410	4,325,940
ගෙවිය යුතු සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්		595,870	590,585
ගෙවිය යුතු මුද්දර ගාස්තු		24,025	24,900
වැට් බදු		11,290,343	9,225,940
ගෙවිය යුතු SSCL		154,463	-
	11a	**129,789,852**	**106,807,992**

ඇමුණුම 12

පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම **LKR**

විස්තරය	2022	2021
ආරම්භක ශේෂය	84,698,369	103,644,190
වසරක් සඳහා අය කිරීම	15,863,377	(11,629,401)
වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්	13,621,058)	(7,316,420)
අවසන් ශේෂය	**86,940,688**	**84,698,369**

ඇමුණුම 13

ශුද්ධ වත්කම් / කොටස්

විස්තරය		2022	2021
ශේෂය		589,982,586	590,995,987
එකතු කළා			
ප්‍රසම්පාදනය සඳහා ප්‍රදානය			
වෙනත් දීමනා			
		589,982,586	590,995,987
අඩු කළා			
දෝෂ නිවැරදි කිරීම		-	(1,013,401)
		589,982,586	**589,982,586**

ඇමුණුම 14

සමුච්චිත අතිරික්තය/ (හිඟය)

		2022	2021
ආරම්භක ශේෂය		403,533,592	373,363,926
එකතු කළා			
පසුගිය වසර සඳහා ලාභය		70,461,437	30,169,666
		473,995,029	403,533,592
අඩු කළා			
පසුගිය වසර ගැලපීම		(2,486,691)	
ඉදිරියට ගෙනා ශේෂය		**471,508,338**	**403,533,592**

ප්‍රාදේශීය ආදායම් සහ වියදම්

ඇමුණුම 15

පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය

විස්තරය	2022			2021		
	ආදායම	වියදම	අතිරික්තය/ (හිඟය)	ආදායම	වියදම	අතිරික්තය/ (හිඟය)
පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාකාරකම්	48,533,500	47,491,898	1,041,601	58,332,760	42,612,327	15,720,433
රසායනික ආපදා අවදානම් වැඩසටහන	4,250,000	4,114,614	135,386	8,180,000	7,841,242	338,758
RLVMMP - අධීක්ෂණය	3,059,622	2,851,572	208,050	3,042,458	2,889,920	152,538
	55,843,122	**54,458,084**	**1,385,038**	**69,555,218**	**53,343,489**	**16,211,729**

ඇමුණුම 16

භූ තාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය

විස්තරය	2022			2021		
	ආදායම	වියදම	අතිරික්තය/ (හිඟය)	ආදායම	වියදම	අතිරික්තය/ (හිඟය)
භූ තාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාකාරකම්	195,379,119	173,708,108	21,671,011	192,877,943	179,789,586	13,088,357
RLVMMP - අධීක්ෂණය	56,801,794	63,742,226	-6,940,432	28,152,127	29,712,477	-1,560,350
	252,180,913	**237,450,334**	**14,730,579**	**221,030,070**	**209,502,064**	**11,528,007**

ඇමුණුම 17

නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය

විස්තරය	2022			2021		
	ආදායම	වියදම	අතිරික්තය/ (හිඟය)	ආදායම	වියදම	අතිරික්තය/ (හිඟය)
ස්වයංක්‍රිය වැසි මාපක ව්‍යාපෘතිය	13,794,593	13,726,385	68,208	15,930,000	15,469,867	460,132
නායයෑම් උවදුරු කලාප සිතියම්ගත කිරීම	17,970,000	17,849,150	120,850	19,630,000	19,279,599	350,401
ගොඩනැගිලි අනුමත කිරීමේ ක්‍රියාවලිය	59,121,796	59,590,926	-469,129	62,031,218	61,371,336	659,882
ඉඩම් විමර්ශන	65,261,646	66,129,749	-868,103	74,255,408	73,476,104	779,304
නායයෑම් අවම කිරීම	2,548,563	2,543,109	5,454	7,752,714	6,899,316	853,397
TCLMP - අදියර 11	2,832,002	2,795,030	36,972	4,285,000	4,167,989	117,011
උපදේශන	86,884,486	75,949,712	10,934,774	78,131,567	55,737,433	22,394,135
	248,413,086	**238,584,061**	**9,829,025**	**262,015,907**	**236,401,645**	**25,614,262**

ඇමුණුම 18

මානව ජනාවාස සැලසුම් සහ පුහුණු අංශය

විස්තරය	2022			2021		
	ආදායම	වියදම	අතිරික්තය/ (හිඟය)	ආදායම	වියදම	අතිරික්තය/ (හිඟය)
HSD ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාකාරකම්	14,271,096	13,890,540	380,555	31,746,379	25,546,139	6,200,240
නායයෑම් අවදානම් කලාප සිතියම්ගත කිරීම	5,000,000	4,850,339	149,661	7,000,000	6,336,234	663,766
පෙරසවි නිවාස ව්‍යාපෘතිය	4,770,000	4,694,071	75,929	9,761,200	8,984,472	776,728
විශේෂ විමර්ශන	2,243,306	2,205,540	37,766	4,000,000	3,876,379	123,621
නායයෑමේ අවදානම් පැතිකඩ	18,944,140	18,764,109	180,031	15,010,000	14,457,581	552,419
TCLMP - අදියර 11	1,535,209	1,533,040	2,169	4,630,000	4,059,581	570,419
	46,763,750	**45,937,639**	**826,111**	**72,147,579**	**63,260,386**	**8,887,193**

ඇමුණුම 19

ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ සහ පරීක්ෂණ අංශය

විස්තරය	2022			2021		
	ආදායම	වියදම	අතිරික්තය/ (හිඟය)	ආදායම	වියදම	අතිරික්තය/ (හිඟය)
ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාකාරකම්	36,085,535	39,600,485	-3,514,949	44,053,558	39,414,609	4,638,949
ගොඩනැගිලි තක්සේරු ව්‍යාපෘතිය	2,806,169	2,730,523	75,646	2,368,390	2,225,078	143,312
RLVMMP - අධීක්ෂණය	1,265,761	1,847,990	-582,229	362,153	220,952	141,202
	40,157,465	**44,178,998**	**-4,021,533**	**46,784,101**	**41,860,639**	**4,923,463**

ඇමුණුම 20

ව්‍යුහාත්මක ඉංජිනේරු පර්යේෂණ සහ ව්‍යාපෘති කළමනාකරණ අංශය

විස්තරය	2022			2021		
	Income	වියදම	අතිරික්තය/ (හිඟය)	ආදායම	වියදම	අතිරික්තය/ (හිඟය)
ප්‍රධාන කාර්යාලයේ ක්‍රියාකාරකම්	43,289,551	23,101,422	20,188,129	32,892,627	27,746,062	5,146,565
ගොඩනැගිලි තක්සේරු ව්‍යාපෘතිය	24,533,830	25,399,902	-866,072	16,798,862	16,682,163	116,698
RLVMMP - අධීක්ෂණය	1,388,139	1,332,676	55,463	1,716,669	1,441,021	275,649
නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති	90,557,307	90,793,999	-236,693	83,516,784	83,147,160	369,624
	159,768,826	**140,627,998**	**19,140,828**	**134,924,942**	**129,016,406**	**5,908,536**

ඇමුණුම 21

වෙනත් ආදායම්

විස්තරය	2022	2021
පොලී ආදායම	82,653,451	27,258,076
ආපදා ණය සඳහා අධිභාරය, බැදුම්කර සහ පොලී	6,383,848	5,660,238
ඉවත දැමිය හැකි භාණ්ඩවලින් ලත් ආදායම	299,299	10,000
ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පතු	1,469,715	1,745,500
ලියාපදිංචි ගාස්තුව	114,000	177,500
වෙනත්		-
	90,920,313	**34,851,314**

ඇමුණුම 22

වැටුප්, වැටුප් සහ සේවක ප්‍රතිලාභ

විස්තරය	2022	2022 අයවැය	2021
වැටුප්	223,370,525	230,700,000	206,658,967
Wages	60,905,814	80,700,000	68,162,855
අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	14,800,368	18,100,000	16,867,844
අවදානම් දීමනා	36,000	36,000	36,000
විශේෂ දීමනා	17,961,262	20,750,000	16,835,839
EPF සඳහා 20% දායකත්වය	30,801,132	37,718,000	32,275,584
ETF සඳහා දායකත්වය - 3%	7,640,663	9,429,500	8,175,813
කාර්යසාධන දිරිගැන්වීම්	9,032,195	31,950,000	15,991,531
උපදේශකයන්ගේ ගෙවීම්	8,116,052	8,580,000	7,166,650
වෛද්‍ය නිවාඩු මුදල් ප්‍රතිපූරණය කිරීම	8,963,486	16,766,733	9,199,413
සේවක රක්ෂණ යෝජනා ක්‍රමය	5,985,142	11,360,000	6,284,630
කාර්ය මණ්ඩල පුහුණු - විදේශ	50,388	600,000	52,625
කාර්ය මණ්ඩල පුහුණු - දේශීය	60,000	515,000	90,000
සම්මන්ත්‍රණ සහ වැඩමුළුව	274,965	750,000	681,537
ප්‍රසාද දීමනා	6,363,633	6,065,000	402,500
ගමන් සහ යැපීම්	22,558,334	25,275,000	25,138,090
විදේශ සංචාර	487,633	100,000	-
සේවක සුභසාධනය	4,152,583	4,450,000	4,603,255
පාරිතෝෂික	15,863,377	10,315,000	(11,629,401)
	437,423,552	**514,160,233**	**406,993,732**

ඇමුණුම 23

භාවිතා කළ සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය

විස්තරය	2022	2022 අයවැය	2021
උප කොන්ත්‍රාත් ගෙවීම	90,293,795	126,000,000	136,759,953
ප්‍රවාහන	53,380,094	87,500,000	73,419,775
දුරකථන සහ තැපැල් ගාස්තු	9,064,042	14,250,000	11,279,309
විදුලිය	6,527,437	8,100,000	6,561,001
ජලය	1,023,430	1,050,000	735,085
වරිපනම් සහ බදු	282,042	1,450,000	289,242
සනීපාරක්ෂක සේවා	2,431,479	4,115,000	3,048,927
ප්‍රචාරණය	2,563,790	2,050,000	2,420,900
කුලී ගාස්තු - උපකරණ	34,500	510,000	458,750
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය	7,454,554	9,600,000	8,845,599
රසායනික සහ වීදුරු භාණ්ඩ	608,222	1,000,000	1,246,726
වෙනත් ද්‍රව්‍ය	44,309,824	10,950,000	12,185,459
ඉන්ධන	20,436,830	10,900,000	9,831,058
ආරක්ෂක ගාස්තු	2,421,506	2,500,000	2,033,635
සමීක්ෂණ සිතියම්	4,800		165,600
තොරතුරු තාක්ෂණ	873,158	485,000	202,100
	241,709,502	**280,460,000**	**269,483,120**

ඇමුණුම 24

ක්ෂය වෙන්කිරීම්

විස්තරය	2022	2022 අයවැය	2021
ඉඩම් සහ ගොඩනැගිලි සඳහා වෙන්කිරීම්	356,873		72,399.53
පරිගණක දෘඩාංග සහ උපාංග සඳහා වෙන්කිරීම්	6,690,339		7,585,417.16
පරිගණක මෘදුකාංග සඳහා වෙන්කිරීම්	2,449,962		2,276,681.59
රසායනාගාර සහ ක්ෂේත්‍ර උපකරණ සඳහා වෙන්කිරීම්	43,496,469		38,064,395
කාර්යාලීය උපකරණ සඳහා වෙන්කිරීම්	3,625,919	50,000,000	4,265,231
ගෘහ භාණ්ඩ සහ උපාංග සඳහා වෙන්කිරීම්	2,215,955		2,221,590
වාහන සඳහා වෙන්කිරීම්	195,496		1,774,356
පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන සඳහා වෙන්කිරීම්	93,539		93,383
මෙවලම් සඳහා වෙන්කිරීම්	18,188		19,272
ගිනි නිවන උපකරණ සඳහා වෙන්කිරීම්	13,608		14,533
	59,156,348	**50,000,000**	**56,387,257**

විස්තරය	2022	2022 අයවැය	2021
ඉඩම් සහ ගොඩනැගිලි සඳහා වෙන්කිරීම්	311,949		
පරිගණක දෘඩාංග සහ උපාංග සඳහා වෙන්කිරීම්	1,134,751		284,473
පරිගණක මෘදුකාංග සඳහා වෙන්කිරීම්	2,671,500		71,500
රසායනාගාර සහ ක්ෂේත්‍ර උපකරණ සඳහා වෙන්කිරීම්	10,701,193		3,348,297
කාර්යාලීය උපකරණ සඳහා වෙන්කිරීම්	221,501		221,501
ගෘහ භාණ්ඩ සහ උපාංග සඳහා වෙන්කිරීම්	25,163	3,000,000	25,163
වාහන සඳහා වෙන්කිරීම්	0		
පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන සඳහා වෙන්කිරීම්	394		394
මෙවලම් සඳහා වෙන්කිරීම්			
ගිනි නිවන උපකරණ සඳහා වෙන්කිරීම්			
	15,066,452	**3,000,000**	**3,951,329**

ඇමුණුම 25

දේපල සහ යන්ත්‍රෝපකරණ නඩත්තුව

විස්තරය	2022	2022 අයවැය	2021
ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	0	50,000	7,326
යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	2,986,153	2,350,000	1,174,364
වාහන අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	10,119,248	9,950,000	8,158,391
ඡායාපිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	354,211	1,450,000	953,069
පරිගණක අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	1,290,635	1,050,000	1,019,101
කාර්යාලීය උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	250	2,400,000	63,470
යන්ත්‍රෝපකරණ සහ විද්‍යාගාර උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	4,197,568	3,400,000	3,181,504
කාර්යාලීය උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	1,808,831	95,000	2,576,679
ගෘහ භාණ්ඩ සහ උපාංග අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	118,350	500,000.00	117,350
	20,875,246	**21,245,000**	**17,251,255**

ඇමුණුම 26

වෙනත් වියදම්

විස්තරය	2022	2022 අයඇය	2021
කුලී	16,684,603	20,000,000	17,859,862
ආරක්ෂිත උපකරණ	404,035	1,900,000	1,569,227
විවිධ වියදම්	132,277	345,000	31,680
දායකත්වය සහ සාමාජිකත්වය	629,591	555,000	474,872
ප්‍රචාරණය/ප්‍රදර්ශනය	-	100,000	42,450
ජීවිත රක්ෂණ	2,507,514	3,800,000	2,608,602
විගණන ගාස්තු	450,000	500,000	900,000
මණ්ඩල සාමාජිකයින්ට ගෙවීම	270,750	350,000	410,875
සභාපතිගේ දීමනා	187,500	300,000	302,000
සංග්‍රහ	651,635	1,095,000	502,560
ලියාපදිංචි ගාස්තු	40,000	100,000	153,390
නීති ගාස්තු	33,840	350,000	27,900
පරිත්‍යාග	-	600,000	115,000
රේගු නිෂ්කාශන වියදම්	2,606		9,734,290
බොල් ණය	264,760		(103,971)
එකතුව	**22,259,111**	**29,995,000**	**34,628,737**

ඇමුණුම 27

මූල්‍ය පිරිවැය

විස්තරය	2022	2022 අයවැය	2021
බැංකු වියදම්	75,833	100,000	110,640
	75,833	**100,000**	**110,640**

ඇමුණුම 28

විනිමය නොවන ආදායම

අයිතමය	දායකත්ව නියෝජිතායතනය	2022	2021
දේපලසහ යන්ත්‍රෝපකරණ	GOSL		19,888,376.90
පරිගණක	JICA	8,653,346.00	
Custom Duty Paid – Computers රේගු බදු ගෙවන ලද පරිගණක	GOSL	542,381.43	
රසායනාගාර සහ ක්ෂේත්‍ර උපකරණ	JICA	20,844,091.40	
රේගු බදු ගෙවන ලද රසායනාගාර සහ ක්ෂේත්‍ර උපකරණ	GOSL	2,207,219.00	
පරිගණක	Salford University	1,780,562.00	
රසායනාගාර සහ ක්ෂේත්‍ර උපකරණ	JICA	50,649,075.00	
රේගු බදු ගෙවන ලද රසායනාගාර සහ ක්ෂේත්‍ර උපකරණ	GOSL	5,822,810.00	
අධීක්ෂණ උපකරණ	JICA	29,119,041.15	
රේගු බදු ගෙවන ලද අධීක්ෂණ උපකරණ	GOSL	3,711,479.56	
රත්නපුර ගොඩනැගිල්ල	GOSL	51,173,591.20	
තොරතුරු පද්ධතිය - නායයෑම් කළමනාකරණය	UNDP	2,600,000.00	
නායයෑම් හඳුනාගැනීමේ ජාලය	UNDP	1,400,700.00	
		178,504,296.74	**19,888,376.90**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර, කොළඹ **5.**
දු. අංක: **011-2588946**, **Fax: 011-2502611**
විද්‍යුත් තැපෑල : **info@nbro.gov.lk**, **web : www.nbro.gov.lk**